# අනාගතය සඳහා පදනම

## රජයේ ආර්ථික ප්‍රගතිය

## 1994 - 1995

නොවැම්බර් 1995
ජනාධිපති ලේකම් කාර්යාලය
කොළඹ, ශ්‍රී ලංකාව

BKT 0209
26/08/2023

ජනාධිපති කාර්යාලය
පුස්තකාලය

# අනාගතය සඳහා පදනම

## රජයේ ආර්ථික ප්‍රගතිය

## 1994 - 1995

ජනාධිපති ලේකම් කාර්යාලය
පරි. අ:.......
-1-9-199
පුස්තකාලය.

2-D 38663 - 6,000 (95/10)

# පටුන

## 1 වන කොටස


පිටුව

1. හැඳින්වීම 5

2. සමස්ත සාර්ව ආර්ථික සංවර්ධනය 8

3. නිෂ්පාදන අංශ 12
   (අ) කෘෂිකර්මය, වාරිමාර්ග, වැවිලි කර්මාන්තය, ධීවර කටයුතු, සහ පශු සම්පත් 12
   (ආ) කර්මාන්ත සංවර්ධනය 32
   (ඇ) වෙළඳම සහ සංචාරක කර්මාන්තය 36

4. පෞද්ගලික ආයෝජනය සහ රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණය 40


## 2 වන කොටස


5. නිරසාර මානව සංවර්ධනය - සමාජීය අංශය 45
   (අ) අධ්‍යාපනය 47
   (ආ) සෞඛ්‍යය 51
   (ඇ) දිළිඳු බව තුරන් කිරීම, කම්කරු, වෘත්තිය පුහුණු, සමාජ සේවා 52
   (ඈ) මානව ජනාවාස, නිවාස, ජල සම්පාදනය, පරිසරය 58

6. ආර්ථික යටිතල ව්‍යුහය 63
   (අ) බල ශක්තිය, විදුලි සංදේශ, වරාය සහ නාවික ගමනාගමනය 63
   (ආ) ප්‍රවාහන සහ මහා මාර්ග 66

7. සමාප්තිය 72




3–

# 1 වන කොටස

## 1 පරිච්ඡේදය

### හැඳින්වීම

ජනාධිපතිනි චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනිය අගමැතිනිය වශයෙන් කටයුතු කළ සමයේ දී නිකුත් කළ 1994 සැප්තැම්බර් 13 දින දරණ ආර්ථික ප්‍රතිපත්ති ප්‍රකාශයෙන්; නව රජයේ ආර්ථික ප්‍රතිපත්තිවල හරය වශයෙන් සැලකිය හැකි පහත සඳහන් අදහස් ඉදිරිපත් විය.

> "නිදහස් වෙළඳපල රාමුවක් තුළ ශක්තිමත් ජාතික ආර්ථිකයක් ගොඩ නැගීමට රජය ඇපකැප වී සිටී. දේශීය හා විදේශීය පෞද්ගලික අංශය සංවර්ධනයේ ප්‍රධාන යන්ත්‍රය විය යුතු යැයි අපේක්ෂා කෙරේ. රජයේ කාර්ය භාරය වනුයේ පෞද්ගලික අංශයේ ශීඝ්‍ර සංවර්ධනය සඳහා පූර්ණ සහාය සලසන ආයතනික රාමුවක් සැකසීමය. මේ කාර්යය හොඳින් ඉටුකිරීම සඳහා වෙළඳපල ක්‍රියාදාමය යටපත් නොකර 'වෙළඳපල මිත්‍රශීලී' ප්‍රතිපත්ති අනුගමනය කෙරේ. මේ අනුව රජය විසින් වෙළඳපලෙහි මැදිහත් වීම එම වෙළඳපලෙහි දුර්වල හා නොදියුණු අංශවලට පමණක් සීමාවනු ඇත. එවිට වෙළඳපල ශක්තිමත් වීමෙන් මහජනයාගේ සුභ සාධනයට මග පෑදෙනු ඇත.
>
> මෙම ප්‍රතිපත්තීන් සාර්ථක වීමට නම් උද්ධමනය අඩුකර ගැනීමටත්, ශීඝ්‍ර ආර්ථික වර්ධනයක් ඇති කරලීමටත්, ඵලදායී රැකියා අවස්ථා ඇති කරලීමටත් සහ සංවර්ධනයේ ප්‍රතිඵල සාධාරණ අන්දමින් බෙදී යාමටත් හිතකර වූ සමස්ත හෙවත් සාර්ව ආර්ථික සහ මූල්‍ය ප්‍රතිපත්ති රාමුවක් අත්‍යවශ්‍ය වනුයේය."*

පුද්ගලික අංශය රටෙහි ආර්ථික වර්ධනය ඇති කිරීමෙහිලා ප්‍රබල යන්ත්‍රය ලෙස ක්‍රියාකාරී වීම අපේක්ෂා කළ ද, රජයේ කාර්ය භාරය පිළිබඳ කිසිම අයුරකින් අවතක්සේරු කිරීමක් එයින් අදහස් නොකෙරිණ. ප්‍රතිපත්ති ප්‍රකාශනයට අනුව රජයේ මැදිහත් වීමක් සිදුවන්නේ වෙළඳපල ක්‍රියාකාරීත්වය ඵලදායී ලෙස සිදු නොවන අවස්ථාවලදී පමණක් වන අතර, එම ප්‍රකාශනයෙන්ම පොදු වශයෙනුත්, වෙන් වෙන්වත් වෙළඳපළ අක්‍රිය වන අවස්ථා මොනවාද යන්නත් හඳුන්වා දී ඇත.

> "මෙම අවස්ථා ප්‍රධාන වශයෙන්ම මානව සංවර්ධන ක්ෂේත්‍රයට ඇතුළත් වේ. නිදසුනක් වශයෙන්, නූතන ආර්ථිකයේ අවශ්‍යතාවන්ට අනුකූලව අපේ තරුණ පිරිස් හැඩ ගස්වනු පිණිස අධ්‍යාපන අංශයේ තත්වය සහ තාක්ෂණික ප්‍රවනතාවය වැඩි දියුණු කිරීමේ අවශ්‍යතාවයක් පවතී. මේ කාර්යය ශ්‍රී ලංකාවේ සමාජයීය හා සංස්කෘතික උරුමය මත පදනම් වූ ජාතික අනන්‍යතාව මත ස්ථිර වශයෙන්ම ගොඩනැගෙනු ඇත. එමෙන්ම, අපගේ ප්‍රතිපත්ති ප්‍රකාශනයෙහි ප්‍රතිඥා දී ඇති පරිදි සෞඛ්‍ය සේවා සඳහා ද, පරිසරය ආරක්ෂා කරනු සඳහා ද, දිළිඳුකම තුරන් කිරීම උදෙසා සැකසූ 'සමෘද්ධි' වැනි ව්‍යාපෘති මගින් දිළිඳු ජනතාවගේ රැකවරණය සඳහා ශක්තිමත් සමාජ ආරක්ෂණ ජාලයක් ඇති කිරීමට ද රජයේ මැදිහත්වීම අවශ්‍ය වී තිබේ. මෙම ක්ෂේත්‍රවලට රජයේ මැදිහත් වීම සහ ආයෝජනය ප්‍රමාණවත් අන්දමින් සිදු නොවුවහොත්, අප ඇප කැප වී සිටින චිරස්ථායී මානව සංවර්ධනය බලාපොරොත්තු විය නොහැක."*

*ගරු චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග, ශ්‍රී ලංකා රජයේ ආර්ථික ප්‍රතිපත්ති ප්‍රකාශනය, 1994 සැප්තැම්බර් මස 13 දින කොළඹ දී.

පෞද්ගලික අංශයේ වර්ධනයට අනුපූරකව අවශ්‍ය වන යටිතල පහසුකම් පෞද්ගලික ආයෝජන වැඩිදියුණු කර ගනිමින් ගොඩනගා ගැනීම ද රජය මත පැවරුණු වගකීමක් විය.

"යටිතල පහසුකම් ප්‍රමාණවත් පරිදි සපුරාලීමට අවශ්‍ය වන්නා වූ සම්පත් ප්‍රමාණය අති විශාල වන බැවින්, ඒ පිළිබඳ ආයෝජන වලින් සැලකිය යුතු කොටසක් පෞද්ගලික අංශය විසින් කළ යුතුව තිබේ. මේ අන්දමින් පෞද්ගලික ආයෝජන අපේක්ෂා කරනුයේ මහාමාර්ග, බලශක්ති, විදුලි සංදේශ සහ වරාය යනාදී ක්ෂේත්‍රවල යටිතල පහසුකම් ඇති කිරීම සඳහා රජය දරන වියදම්වලට වැඩිමනත්වයි. රජයේ අනුග්‍රහය යටතේ පෞද්ගලික අංශය විසින් එවැනි යටිතල පහසුකම් ඉදිකොට, නියමිත කාලයක් තුල එම සේවා සීමිත පරිහරණ ගාස්තු අය කරමින් ක්‍රියාත්මක කොට, තමන් ආයෝජනය කළ ධනයට අවශ්‍ය ප්‍රතිලාභ ලබාගෙන, එම.පරිහරණ කාලය අවසානයේ දී තම ව්‍යාපාරය ආපසු රජයට භාරදීමේ 'සීමිත පරිහරණ සේවා' ක්‍රමයට හෝ පහසුකම් ඉදිකොට අසීමිත කාලයකට යටිතල සේවා සපයන 'අසීමිත පරිහරණ සේවා' ක්‍රමයට හෝ අනුකූලව මේ ක්ෂේත්‍රයට සහභාගි වීමට ඉඩ සලසනු ලැබේ. මෙවැනි ව්‍යාපාර සාධාරණව ඇගයීම සහ දිරි ගැන්වීම උදෙසා "යටිතල පහසුකම් සංවර්ධන සහ ආයෝජන කාර්යාලයක්" පිහිටුවා ඇත. එම කාර්යාලය සහ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමීප සහයෝගයෙන් ක්‍රියා කරනු ඇත."*

මෙම සමාලෝචනයෙන් බලාපොරොත්තු වන්නේ රජයේ පළමු වසර තුළ අනුගමනය කළ ප්‍රධානතම ප්‍රතිපත්තිමය ගමන් මාර්ගය ගැන කිසියම් ඇගයීමක් කිරීමයි. මෙහි දී පෞද්ගලික අංශය, ආර්ථික වර්ධනය ඇතිකරන ප්‍රබල යන්ත්‍රයක තත්වයට පත් කිරීමට දෙන ලද අනුබලය කුමක්දැයි සලකා බලනු ඇත. මානව සංවර්ධන අංශයෙහි සෘජුවත්, පොදු සහ පෞද්ගලික යටිතල සංවර්ධන අංශයෙහි සෘජුව සහ වක්‍රවත්, රජය අනුපූරකව මැදිහත් වූ ආකාරය පිළිබඳ අගැයුමක් කිරීමට මෙහි දී බලාපොරොත්තු වේ.

පෞද්ගලික අංශයේ සීඝ්‍ර වර්ධනය අවශ්‍යයෙන්ම රඳා පවතින්නේ මානව කුශලතා සහ යටිතල පහසුකම් ප්‍රමාණවත්ව සැපයීමක් ඇතිනම් පමණක් බව මෙහි දී අවධාරණය කෙරේ. මෙම සමාලෝචනය කොටස් දෙකකින් ඉදිරිපත් කෙරේ.

මෙම ප්‍රකාශනයේ පළමු කොටසේ එන 'සාර්ව ආර්ථික වර්ධනය' නමැති දෙවන පරිච්ඡේදයෙහි මෙම වසරේ පෙබරවාරි මස ඉදිරිපත් කළ අයවැයෙන් හඳුන්වාදුන් ' ස්ථාවර සාර්ව ආර්ථික රාමුව' ගැන කරුණු දක්වනු ලැබේ. එම රාමුව තුළ ක්‍රියා කිරීමෙන් බලාපොරොත්තු වූයේ උද්ධමනය අඩු කිරීමත්, ආර්ථික වර්ධනය සහ රැකියා නියුක්තිය ඉහළ මට්ටමකට ගෙන ඒමත් ය.

' නිෂ්පාදන අංශ' වශයෙන් නම් කර ඇති 3 වැනි පරිච්ඡේදයෙහි සැලකිල්ලට භාජනය කරනු ලබන්නේ පෞද්ගලික අංශයේ මූලකත්වයෙන් ක්‍රියාත්මක කරනු ලබන නිෂ්පාදන අංශ වන කෘෂිකර්මය, කර්මාන්ත සංවර්ධනය, වෙළඳාම සහ සංචාරක කර්මාන්තයයි. මින් එක් එක් අංශයෙහි ප්‍රතිපත්තිමය ගමන් මාර්ගය ගැන සංක්ෂිප්ත විස්තරයක් සහ ඒ අනුව නිෂ්පාදන ප්‍රමාණය සහ අපනයනවල වර්ධනයක් ඇති වී නම් ඒ ඇති වූ ආකාරයන් සඳහන් කරනු ඇත. මෙම විස්තරයෙන් පසු පුදුපු පරිදි, පෞද්ගලික අංශයේ ව්‍යායාමයන්ට සහාය වශයෙන් රජය මගින් ලබාදුන් දායකත්වය ගැනත් සඳහනක් කෙරෙනු ඇත.

උදාහරණ වශයෙන්, කාර්මික අංශය ගැන සාකච්ඡා කිරීමේදී, එහි කාර්මික ජනපද ඇති කිරීම විශේෂිත ආකාරයේ පුහුණුවීම් සහ කුශලතා සංවර්ධන ආයතන (රෙදිපිළි කර්මාන්ත පුහුණු ආයතනය) ඇතිකිරීම දැක්විය හැකිය. කෘෂිකාර්මික අංශය තුළ, වාරිමාර්ග පහසුකම් ඇතිකිරීම සහ රජයේ අනුග්‍රහය ලබන නව ආයතනික ව්‍යුහයන් ස්ථාපනය කිරීම (ගොවි සංවිධාන) දැක්විය හැකිය.

"පෞද්ගලික ආයෝජනය සහ රාජ්‍ය ව්‍යාවසාය ප්‍රතිසංස්කරණ" වශයෙන් නම් කර ඇති 4 වැනි පරිච්ඡේදයෙන් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය (BOI) සහ රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ කොමිෂම (PERC) පිළිබඳ සාකච්ඡා කරනු ඇත. මෙම ආයතන පෞද්ගලික අංශයේ වර්ධනයට අවශ්‍ය වන යටිතල පහසුකම් සම්බන්ධ බාධක ඉවත් කිරීම පමණක් නොව, කාර්යක්ෂමව පෞද්ගලික ආයෝජන නගා සිටුවීමට අවශ්‍ය තාක්ෂණ නවීකරණය වැනි අංශ සම්බන්ධව ද ක්‍රියාත්මක වන සමාන්තර වගකීම් දරන ආයතන දෙකකි. මෙම

අරමුණු කරා යාමේ දී ලංකා ආයෝජන මණ්ඩලය, ඉහළ එකතු කළ වටිනාකමින් යුත් අංශවලට අයත් වඩා ගැලපෙන ආයෝජන ප්‍රවාහ දිරිමත් කිරීම බලාපොරොත්තු වන අතර, යටිතල සංවර්ධන මහලේකම් කාර්යාලය (SIDI) මගින් විශේෂ වර්ගයේ පෞද්ගලික ආයෝජන සංවිධාන කිරීම සහ අධීක්ෂණය යන කාර්යයන් ඉටු කරනු ඇත. මේ සඳහා අවශ්‍ය ප්‍රතිසංවිධානයක් වශයෙන් යටිතල සංවර්ධන මහලේකම් කාර්යාලය (SIDI) ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ අංශයක් බවට පත්කර තිබේ. අනෙක් අතට රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ කොමිෂමට (PERC) පැවරී ඇති ප්‍රධාන කාර්යය වන්නේ රජයට බරක් වී ඇති රාජ්‍ය ව්‍යාපාර පෞද්ගලික (දේශීය මෙන්ම දේශීය නොවන පුද්ගලික අංශ ද ඇතුළුව) පිළිබඳ ක්‍රියාකිරීම සහ ඒවා අධීක්ෂණය කිරීමත්ය.

5 වැනි සහ 6 වැනි පරිච්ඡේද වලින් සමන්විත දෙවැනි කොටස වෙන් වන්නේ තිරසාර මානව සංවර්ධන සහ ආර්ථික යටිතල පහසුකම් සංවර්ධනය යන ක්ෂේත්‍රයන් හා ලබා ඇති ප්‍රගතිය සහ එහි අනාගත සැලසුම් පිළිබඳ සාකච්ඡාවකටයි.

"තිරසාර ආර්ථික සංවර්ධනය : සමාජ සංවර්ධන අංශ" නම් වූ 5 වැනි පරිච්ඡේදයට අඩංගු වන්නේ-

(අ) අධ්‍යාපනය
(ආ) සෞඛ්‍යය
(ඇ) සමෘද්ධි ව්‍යාපාරය ඇතුළු දිළිඳුකම දුරලීම, කම්කරු, සමාජසේවා අංශ
(ඈ) මානව වාසස්ථාන (නිවාස, ජලය සහ පරිසරය)

ආර්ථික යටිතල පහසුකම් නම් වූ 6 වැනි පරිච්ඡේදයට අඩංගු වන්නේ-

(අ) විදුලි හා බල ශක්ති, දුරකථන සේවා, වරාය හා නාවික සහ
(ආ) ප්‍රවාහන සහ මහා මාර්ග

යන අංශ වේ.

## 2 පරිච්ඡේදය

# සමස්ත සාර්ව ආර්ථික සංවර්ධනය

1. සුපරික්ෂාකාරී රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය :

1995 පෙබරවාරි මස නව රජය විසින් ඉදිරිපත් කරන ලද අයවැය ප්‍රකාශය "ස්ථාවර සාර්ව ආර්ථික හා මූල්‍ය රාමුවක්" ඇති කිරීමේ ප්‍රධාන උපක්‍රමය විය. 1994 මැතිවරණ වර්ෂයේ දී ගිලිහී ගිය වියදම් පාලනය හේතුවෙනි.

සමස්ත අයවැය හිඟය දළ දේශීය නිෂ්පාදනයෙන් (ද. දේ. නි.) 10%ක් සහ ජංගම ගිණුම් හිඟය දළ දේශීය නිෂ්පාදනයේ 3% දක්වා සීඝ්‍ර නැගීමක් දක්නට ලැබිණි. මෙම නැගීම කලින් වර්ෂය වූ 1993 දක්නට ලැබුනු සමස්ත හිඟය වන දළ දේශීය නිෂ්පාදනයෙන් 8.5% සහ ජංගම ගිණුම් හිඟය වන 0.8% ප්‍රමාණයන්වලටත් 1994 දී මුලින් ඉලක්ක කරන ලද සමස්ත හිඟය වන 6.5% ක ප්‍රමාණය සහ ජංගම ගිණුමේ සුළු අතිරික්තය සමඟ සසඳා බලන විට පිරිහීමක් බව පෙනී යයි.

1995 වර්ෂයේ අයවැය ලේඛනයෙන් සමස්ත හිඟය දළ දේශීය නිෂ්පාදනයෙන් 7.5%ක් සහ ජංගම ගිණුමේ අතිරික්තය 0.5:%ක් ඉලක්ක කොට සකස් කිරීමෙන් ආර්ථිකය නිවැරදි මගකට යොමු කරන ලදී. එම ඉලක්කය කරා එළඹියේ නම් දේශීය බැංකු නොවන ණය 1994 වර්ෂයේදී පැවතුණ දළ දේශීය නිෂ්පාදනයෙන් 6.3%ක ප්‍රමාණයේ සිට දළ දේශීය නිෂ්පාදනයෙන් 3.4% ප්‍රමාණයක් දක්වා අඩු වීමට ඉඩ තිබේ. මේ අනුව ජාතික ඉතිරි කිරීම්වලින් වඩා විශාල කොටසක් (දළ දේශීය නිෂ්පාදනයෙන් 3% ක් පමණ වන) පෞද්ගලික අංශයේ ආයෝජන සඳහා යොමු වීමට ඉඩ තිබුණි. වර්ෂ 2000 වන විට ජාතික ඉතිරි කිරීම් රජයේ වියදම් සඳහා යොමු කිරීම සම්පූර්ණයෙන් නතර කර දැමීමටත් අයවැය හිඟය පියවීම සඳහා විදේශාධාර වශයෙන් ලැබෙන දළ දේශීය නිෂ්පාදනයෙන් 3%ක් හෝ 4%ක ප්‍රමාණය සහ එයට අමතරව ජංගම ගිණුමේ ඇතිවන සැලකිය යුතු අතිරික්තය පමණක් යොදා ගැනීමේ තත්වයක් උදාකර ගැනීමටත් සැලසුම් කර තිබිණි.

1995 වසර සඳහා දළ දේශීය නිෂ්පාදනයේ වර්ධනය 6%ක් ලෙස ද උද්ධමනය 7% සිට 8% දක්වා ද වර්ධනය වනු ඇතැයි මුලින් අපේක්ෂා කෙරිණි.

මෙම සාර්ව ආර්ථික රාමුව දෙයාකාරයක බාහිර බලපෑම්වලට ලක්වීම නිසා දුර්වල තත්වයකට පත්විය. එයින් පළමුවැන්න නම් මෙම වර්ෂයේ අප්‍රේල් මාසයේ දී එල්. ටී..ටී. ඊ. සංවිධානය ඒක පාක්ෂිකව ගත් තීරණයක් අනුව යුධමය තත්වයක් උතුරෙහි ඇතිවීම හේතුවෙන් අයවැයෙන් බලාපොරොත්තු වූ වියදමට වඩා ආරක්ෂක වියදම් දළ දේශීය නිෂ්පාදනයෙන් 2% තරම් ප්‍රමාණයකින් වැඩිවිය. දෙවන බලපෑම නම් ලෝක වෙළඳ පොලේ තිරිඟු පිටි ටොන් එකක මිළ ඇ. ඩො. 125 සිට 205 දක්වා වැඩිවීමයි. මෙයින් ඇති වූ ප්‍රතිඵලය නම් පාන් සහ පිටි සඳහා දී තිබූ සහනාධාරය දළ දේශීය නිෂ්පාදනයේ 1%කින් වැඩි වීමයි.

මෙම සාධක දෙක පමණක් බලපෑව ද අයවැය තත්වය දළ දේශීය නිෂ්පාදනයෙන් 3%කින් පමණ පිරිහී යා හැකිය. වෙනත් වචනවලින් කියන්නේ නම්, ජංගම ගිණුම් හිඟය 0.5%ක් වෙනුවට 2.5%ක් ද සමස්ත අයවැය හිඟය 7.5% වෙනුවට 10%ක තරමට වැඩිවිය හැකිව තිබුණි. මෙයින් පැහැදිලි වන්නේ වඩාත් යහපත් සාර්ව ආර්ථික ස්ථාවරයකට යාම සඳහා අතරමග දී යම් යම් නිවැරදි කිරීම් සඳහා පියවර ගැනීම අවශ්‍ය බවයි. මේ අනුව රජය ආරක්ෂක බදු අනුපාතය වසර මැද දී 4.5%ක් දක්වා වැඩි කළ අතර, වසර අග දී පාන් සහ පිටි සහනාධාරය ක්‍රමානුකූල නිවැරදි කිරීම්වලට ලක් කෙරිණ. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් ජංගම ගිණුමේ හිඟය දළ දේශීය නිෂ්පාදනයෙන් 1.7%කට ද සමස්ත හිඟය දළ දේශීය නිෂ්පාදනයෙන් 9.3%ට ද සීමා කිරීමට හැකිවිය. මේ අතර ශුද්ධ දේශීය ණය ගැනීම්, එහි ඉලක්කය වූ 3.4% හා සැසඳීමේ දී ද. දේ. නි. යෙන් පියයට 3.4 සිට 5.4 දක්වා වැඩි විය.

## 2. උද්ධමන වේගය එක් අංකයකට අඩු කිරීම :

භාණ්ඩාගාර බිල්පත් සඳහා ගෙවීමට සිදුවී ඇති අධික පොලියෙන් පිළිඹිබු වන උද්ධමන ප්‍රවනතාවය පාලනය කිරීම සඳහා දැඩි මූල්‍ය ප්‍රතිපත්තියක් සමඟ රාජ්‍ය මූල්‍ය කටයුතු නිවැරදි කිරීමක් සිදුකරන ලදී. මෙම වසරේ උද්ධමන වේගය 8% දක්වා අඩු කිරීම අවු. 11ක කාලයක් තුල පැවති අංක දෙකක උද්ධමන වේගය සාර්ථකව පාලනය කර ගැනීම මුල් පියවර ලෙස සැලකිය හැකිය. බැංකු පද්ධතියෙන් ණය ගැනීම පිටු දැකීම මගින් මුදල් නෝට්ටු මුද්‍රණයෙන් වැලකීමේ ප්‍රතිපත්තිය දැඩි ලෙස අනුගමනය කිරීම, රජය මගින් දියත් කළ උද්ධමන මැඩලීමේ ස්ථාවරයට විශේෂ රුකුලක් වූ බව සැලකිය හැකිය. උද්ධමනය පාලනය කර ගැනීමට හේතු කාරක වූ අනෙක් සාධක නම්, දේශීය වශයෙන් නිපදවන ආහාර වර්ග සුලභ වීම, ප්‍රධාන පාරිභෝගික ද්‍රව්‍ය වලට අදල තීරුබදු අඩු කිරීම, සහ විනිමය අනුපාතය ස්ථාවරව පැවතීමයි. 1995 වර්ෂයේ ඇති වූ රාජ්‍ය මූල්‍ය තත්වයේ එක් අවාසනාවන්ත ප්‍රතිඵලයක් වූයේ, බැංකු නොවන අංශවලින් රජයේ වියදම් සඳහා අධික ණය ගැනීම් කෙරෙන වාතාවරණයක් තුළ දැඩි මූල්‍ය ප්‍රතිපත්ති අනුගමනය කිරීම හේතුවෙන් පොලී අනුපාතය සියයට 20 පමණ දක්වා වැඩිවීමයි. මෙම පොලී අනුපාතය, පසුගිය වසරේ, පෞද්ගලික අංශයේ ආයෝජන දිරි ගැන්වීමට සාධක වූ 15% හා සසඳන විට අධික පොලී අනුපාතයක් සේ සැලකිය හැකිය. මේ නිසා 1996 වර්ෂයේ වැදගත් අරමුණක් වන්නේ පොළී අනුපාතය නැවත මධ්‍යස්ථ තත්වයට පත් කිරීමය.

## 3. සංවර්ධන වේගය රඳවා ගැනීම :

*ආර්ථික වර්ධනය සහ ආයෝජනය – ජයග්‍රහණ හා ඉදිරි දැක්ම*

1995 වර්ෂයේ ආර්ථිකයේ දක්නට ලැබුන ප්‍රධානතම ලක්ෂණය වූයේ වර්ධන ගම්‍යතාවය රඳවා ගැනීමය. දළ දේශීය නිෂ්පාදනය වර්ධනය වූයේ පසුගිය වර්ෂයේ ඇති වූ වේගයට බොහෝ දුරට සමාන වේගයක් වන 5.5% කිනි. ද. දේ. නි. යෙන් 26% ක් වූ ආයෝජනය 1993 වර්ෂයේ අනුපාතයට සමාන වූ අතර පසුගිය (1994) වර්ෂයට වඩා ප්‍රතිශත ඒකකයකින් අඩු විය. අයවැය කථාවේ දී සඳහන් කළ පරිදි අප්‍රේල් මාසයේ දි නැවත ඇවිළුන යුධමය තත්වය නිසා ආරක්ෂක වියදම් අධික වීම, කම්කරු අරගල, සහ ඇති වූ වෙනත් අහිතකර තත්වයන් තුළ මෙවැනි වර්ධනයක් හෝ ලබා ගැනීම අතිශයින් සතුටුදයක බව පිළිගත යුතුය.

මෙම වර්ධන නම්‍යතාව හමුවේ අනාගත ආර්ථික වර්ධනයට ඇති ඉඩකඩ ගැන සලකා බැලීම කාලෝචිත ය. දැනට යුධමය කටයුතුවලට යොදවා ඇති ද.දේ.නි. යෙන් 5% ක් පමණ වන සම්පත් ප්‍රමාණය සාමය උදවීමත් සමඟ පුනරුත්ථාපන කටයුතුවලට වෙන්කළ හැකි අවස්ථා පැදෙනු ඇත. සාමකාමී යුගයකට ගැලපෙන ලෙස අතිරික්ත හමුද ශක්තිය මුද හැරීම සම්පූර්ණ කිරීම කල්ගත වන කාර්යයක් වුව ද, විරුද්ධවාදීකම් කිසියම් ප්‍රමාණයකින් අඩු කරගත හැකි වුවහොත්, ද. දේ. නි. යෙන් 1% ක් හෝ 2% ක් පමණ ආයෝජන කටයුතුවලට හරවා යැවිය හැකිය. ජාතික ඉතිරි කිරීම්වලින් කොටසක් රජයේ වියදම් සඳහා අත්පත් කර ගැනීම වර්ෂ 2000 වන විට සම්පූර්ණයෙන් අත්හැර දැමීමට යොමු වූ රාජ්‍ය මූල්‍ය ක්‍රමෝපාය, පියවරෙන් පියවර ක්‍රියාත්මක කිරීමත් සමඟ, රාජ්‍ය අයවැයෙන් සෑහෙන සම්පත් කොටසක් ක්‍රමයෙන් පෞද්ගලික ආයෝජනය සඳහා මුද හැරෙනු ඇත. 1996 අයවැය සමඟ ඉදිරිපත් කළ 1995 – 1998 මධ්‍ය කාලීන අයවැය සැලැස්මෙන් පෙන්වන පරිදි, රජය මගින් දේශීය ණය ලබා ගැනීම ද. දේ. නි. යේ ප්‍රතිශතයක් වශයෙන් පිහිටනුයේ පහත සඳහන් පරිදි ය :

1995 : 5.4%
1996 : 4.1%
1997 : 3.4%
1998 : 2.2%

මේ පදනම අනුව, 1995 සිය 1998 කාලය තුළ රජය ජාතික ඉතිරි කිරීම්වලින් අත්පත් කරගන්නා ප්‍රමාණය ද. දේ. නි. යෙන් 3.2% ප්‍රමාණයකින් අඩුකර දමනු ඇත. මෙය 1995 වර්ෂයේ ප්‍රමාණය වන 5.4% සහ 1998 වර්ෂයේ ප්‍රමාණය වන 2.2% අතර වෙනසය. එමනිසා සාමය උදකර ගැනීම සහ අයවැය ක්‍රමෝපාය එක්ව ක්‍රියාත්මක වුවහොත්, ආයෝජනය සඳහා පෞද්ගලික අංශය අතට පත්වන ඉතිරි කිරීම් ද. දේ. නි. යෙන් 4% සිට 5% දක්වා ප්‍රමාණයකින් ඉහළ යනු ඇත.

මෙම පසුබිම තුළ, 1995 මුළු ආයෝජනය ද. දේ. නි. යෙන් 26% වශයෙන් ගෙන, පිළිගත හැකි උපකල්පනයන් ආශ්‍රයෙන් 1996 සිට 1998 කාලය සඳහා ආයෝජන ප්‍රමාණය ප්‍රක්ෂේපණය කළ හැකිය. 1996 අයවැයෙන් පෞද්ගලික ආයෝජනයට බලාපොරොත්තු දිරි ගැන්වීම ලැබෙන්නේ නම්, 1996 වර්ෂයේ ආයෝජන ප්‍රමාණය අවම වශයෙන් ද. දේ. නි. යෙන් 27% ක් වනු ඇත. යුධමය ක්‍රියාකාරකම් අඩුවී යාමත්, 1997 සිට 1998 අයවැයවල සුළු වශයෙන් එනම්, ද. දේ. නි. යෙන් 0.6% සිට 3.0% දක්වා ජංගම ගිණුම් අතිරික්ත මතුවී ඒමත් සමඟ, ආයෝජන ප්‍රමාණය අවම වශයෙන් ද. දේ. නි. යෙන් සියයට 30 (27 සහ 3 හි එකතුව) දක්වා වැඩිවිය හැක. පසුගිය වර්ෂ වල දක්නට ලැබුන ද.දේ.නි. යෙන් සියයට 1 1/2 සිට 2 පමණ වූ විදේශ ආයෝජනයට සමාන ප්‍රමාණයක් ඉදිරියේදී ද ලැබුනහොත් එය කලින් සඳහන් කළ සියයට 30 ට අතිරේකව ලැබෙන ප්‍රසාද දීමනාවක් මෙන් සැලකිය හැක. මෙවැනි මට්ටමකට ආයෝජනය ගෙන ආ විට එය නැගෙනහිර ආසියානු රටවල අත්දැකීමට සමාන 'සීඝ්‍ර වර්ධනය – වැඩි ආයෝජන' ක්‍රියාදමයක මුල පිරිමක් යයි බලාපොරොත්තු විය හැක. 1996 අයවැය කථාවේදී "අප ජනතාවට පිළිගත හැකි ජීවන මට්ටමක් සහ ප්‍රමාණවත් රැකියා අවස්ථා ලබා දීමේ අරමුණින් ආර්ථික වර්ධනය සියයට 7-8 දක්වා ඉහළ දැමීම අප ආර්ථික ප්‍රතිපත්තියේ හරය වන්නේය" යන අදහස ඉදිරිපත් වූයේ ඉහත සඳහන් තර්කණය පදනම් කරගෙන ය.

4. රැකියා නියුක්තිය :

දැනට ශ්‍රී ලංකාවේ ශ්‍රම බලකාය මිලියන 6.5 ලෙස ගණන් බලා තිබේ. 1994 වර්ෂයේදී සියයට 5.6 සහ 1995 සියයට 5.5 වශයෙන් ආර්ථික වර්ධන වේගය පවත්වාගෙන යාමේ ප්‍රතිඵලයක් වශයෙන් මිලියන 5.8 ක පමණ ජනගහණයක් කුමන හෝ රැකියාවක නිරත වූ බව පෙනෙන්නට තිබේ. මේ වර්ෂයේදී පවත්වා ගත හැකි වූ වර්ධන ගම්‍යතාවය නිසා විරැකියා අනුපාතයේ වේගවත් බව, සියයට 13.7 ක සිට සියයට 11.9 දක්වා අඩුවීමක් සිදු විය.

4.1 නව රැකියා නියුක්තිය

1994 සිට 1995 දක්වා පුද්ගලයින් 3,18,696 දෙනෙකුට පහත දැක්වෙන අන්දමින් අලුත් රැකියා සපයා දී තිබේ :

| | |
|---|---|
| සාමාන්‍ය ආර්ථික කටයුතු | 1,09,100 |
| ආයෝජන මණ්ඩල ව්‍යවසායයන් | 29,718 |
| සමෘද්ධි වැඩ සටහන | 30,678 |
| විදේශ රැකියා | 1,49,170 |

(සන්නද්ධ සේවාවන්ට හා පොලිස් සේවාවට බඳවා ගැනීම් මෙම සංඛ්‍යාවල ඇතුලත් නැත.)

4.2 රැකී රක්ෂාවල ව්‍යුහය

ජන හා සංඛ්‍යා ලේඛණ දෙපාර්තමේන්තුව විසින් පවත්වන ලද "ශ්‍රම බලකාය පිළිබඳ සමීක්ෂණය" අනුව රටෙහි පොදු රැකියා ව්‍යුහය පහත සඳහන් සංඛ්‍යා සටහනේ දක්වන ආකාරයට 1994 - 1995 දී ආන්තිකව වෙනස් විය :

| | *1994* | *1995* |
|---|---|---|
| කෘෂිකර්මය | 39.5 | 35.6 |
| කාර්මික | 19.8 | 21.6 |
| නිමවුම් කර්මාන්ත | 14.4 | 14.6 |
| නිර්මාණ | 4.1 | 5.4 |
| වෙනත් | 1.3 | 1.6 |
| සේවා | 40.7 | 42.8 |
| වාණිජ | 12.2 | 13.2 |
| ප්‍රවාහන | 4.7 | 4.8 |
| ප්‍රජා සේවා | 18.0 | 17.4 |
| වෙනත් | 5.8 | 7.4 |
| | 100.0. | 100.0 |

කර්මාන්ත හා සේවා යන අංශ දෙකෙහිම සහභාගිත්වය 2% කින් වැඩි වූ අතර, කෘෂිකර්ම අංශයේ දායකත්වය 4% කින් පහත බැස ඇත. ආර්ථිකය තුළ සීඝ්‍ර කාර්මීකකරණයක් සිදුවන බවට සේයාවක් මේ නැඹුරුතාවය තුළ ගැබ් වී තිබේ.

### 4.3 විදේශ රැකියා

විදේශ රැකියා කායභාංශයට අනුව, විදේශ රැකියා තිබෙන්නේ ප්‍රධාන වශයෙන්ම ගෘහ සේවිකාවන් (73%) පුහුණු කම්කරුවන් (15%) හා නුපුහුණු කම්කරුවන් (10%) සඳහාය. විදේශ රැකියා සඳහා රට හැර යන්නවුන් වෙනුවෙන් රක්ෂණ ක්‍රමයක් විදේශ රැකියා කායභාංශය විසින් (1994 ඔක්තෝබර් 15) ආරම්භ කරන ලදී. විදේශයන්හි අතරමං වූවන් ආපසු ගෙන්වා ගැනීමටත්, විදේශයක දී හදිසි අනතුරුවලට මුහුණ පා තුවාල සිදුවන අයට හෝ ජීවිත හානි සිදු වන අයට වන්දි මුදල් ගෙවීමටත් (රු. 1,25,000 දක්වා) මෙම යෝජනා ක්‍රමය ඉවහල් වේ.

### 5. වර්ෂ 2000 දි පූර්ණ රැකියා නියුක්ති ඉලක්කය :

අනාගත රැකියා වර්ධන අපේක්ෂාවන් සැලකිල්ලට ගත්විට, ලබාගත හැකි සාමාන්‍ය වර්ධන අනුපාතය මත එය බොහෝ දුරට රඳා පවතී. මෙම දශකයේ මෑත වර්ෂවල ලබාගත් සාධනයනට අනුකූල වන පරිදි දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධන අනුපාතය 7% – 8% දක්වා නැංවේ යයි උපකල්පනය කළවිට, 1995 – 2000 අතර කාල පරිච්ඡේදයේ දී සේවා නියුක්තියේ සාමාන්‍ය වර්ධන වේගය 6% ට වඩා පහතට බැසීමට ඉඩ නැත. ශ්‍රම ඵලදායිතාව පසුගිය කාලයේ මෙන් වාර්ෂිකව 2.15% මට්ටමේ හෝ ඊට වඩා සුළු වශයෙන් වැඩිවී 2.5% මට්ටමේ පැවතුනහොත් සහ එම කාලසීමාව තුළම ද. දේ. නි. සාමාන්‍ය වාර්ෂික වර්ධන අනුපාතය 6% ක් වුවහොත්, සේවා වියුක්තිය 5% දක්වා පහත මට්ටමකට පහත වැටේ යැයි අපේක්ෂා කළ හැකිය.

# 3 පරිච්ඡේදය

## නිෂ්පාදන අංශ

### (අ) කෘෂිකර්මය, වාරිමාර්ග, වැවිලි කර්මාන්තය, ධීවර කටයුතු සහ පශු සම්පත්

කෘෂිකර්ම ප්‍රතිපත්තිය

1995 ජනවාරි 06 වැනි දින ප්‍රකාශයට පත් කළ රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශය අනුව රජයේ නව කෘෂිකාර්මික සංවර්ධන උපාය මාර්ගය ගොවීන්ගේ නිර්මාණාත්මක ශක්තීන් හා ස්වාධීනත්වය රාජ්‍ය තන්ත්‍රයේ දැඩි පාලනයන් මඟින් මොට නොවන බවටත්, ඒ අනුව ඔවුහු යැපුම් කෘෂිකර්මය නමැති දිළිඳු කමේ සාපයෙන් මිදී වාණිජමය කෘෂිකර්මය කෙරෙහි නැඹුරුවන බවටත් තහවුරු කිරීමේ අභිලාෂයෙන් සකස් කරනු ලැබ ඇත. මෙම උපාය මාර්ගයේ මූලික ලක්ෂණයන් වනුයේ –

(අ) කෘෂිකර්මයේ අඩු ලාභදායීත්වය හා හීනවූ ආයෝජනයට හේතු වූ ආයතනික හා ප්‍රතිපත්තිමය බාධාවන් ඉවත් කිරීම.

(ආ) ගොවීන්ට ඔවුන්ගේ නිෂ්පාදනයන් සඳහා ස්ථාවර හා සාධාරණ මිලක් ලැබීම හා අවශ්‍ය යෙදවුම් හා ශිල්ප ක්‍රම සැපයීම සහතික වන පරිදි රජයේ මැදිහත්වීම් සීමා කිරීම.

පහත සඳහන් පරිච්ඡේදයන්හි, කෘෂිකර්මය නමැති පොදු මාතෘකාව යටතේ එහි ප්‍රධාන අනු අංශයන්හි ක්‍රියාකාරිත්වය පිළිබඳව කෙටියෙන් විමසා බැලේ. එක් එක් අනු අංශයේ ක්‍රියාකාරිත්වය ප්‍රථමයෙන් නිමැවුම ආශ්‍රයෙනුත්, දෙවනුව අපනයන වැඩීම හෝ ආනයන අඩුවීම ආශ්‍රයෙනුත්, සළකා බැලෙනු ඇත. ඉන් පසුව ඉහත සඳහන් මූලික උපාය මාර්ගික ලක්ෂණයන්ට අනුකූලව එක් එක් අනු අංශයේ ප්‍රතිසංවිධාන හා අනෙකුත් නම්‍යතාවන් ඇතිකරනු සඳහා රජය විසින් කරනු ලබන මැදිහත්වීම් ඉදිරිපත් කෙරෙනු ඇත.

*(අ) (i) දේශීය කෘෂිකර්මය :*

1. නිෂ්පාදනය

අදාළ කාල පරිච්ඡේදය තුළ යහපත් කාලගුණික තත්වයන් මෙන්ම ප්‍රධාන යෙදවුම් සැපයුම සහ වඩා හොඳ වෙළඳ පොළ තත්ත්වයන් ඇති කිරීම සඳහා වූ ප්‍රවේශයෙන් ඉලක්ක කොට සිදු කරන ලද රජයේ මැදිහත්වීම් ද කරණකොට ගෙන වී හා අනෙකුත් ආහාර භෝග නිෂ්පාදනයේ වැඩිවීමක් දක්නට ලැබිණි. වී, වියළි මිරිස්, රතුලූනු සහ අල ජීවන වියදම කෙරෙහි විශාල වශයෙන් බලපෑමක් කරන වැදගත් භෝගයන් වේ.


දිවයිනේ වී නිෂ්පාදනය පහත දැක්වෙන පරිදි 1993/94 මහ කන්නයේ දී මෙ. ටො. 16,70,000 ක සිට 1994/95 මහ කන්නය වන විට මෙ. ටො. 17,61,000 දක්වා 6% කින් වැඩි විය. මීට ප්‍රධාන වශයෙන් හේතු වූයේ 1993/94 දී හෙක්ටයාරයකට කි. ග්‍රෑ. 3,344 ක් වූ අස්වැන් 1994/95 මහ කන්නයේ දී හෙක්ටයාරයකට කි. ග්‍රෑ. 3,603 ක් දක්වා 8% කින් ඉහළ යාමයි. 1995 යල කන්නය සඳහා ද වාර්තාගත අස්වැන්නක් ලැබෙතැයි අපේක්ෂා කෙරේ. 1995 යල කන්නය සඳහා අපේක්ෂිත මුළු නිෂ්පාදනය බුසල් මිලියන 50 කි.

සටහන *1.1*

**1985 – 1995 මහ කන්නයේ ඵලදාව හා නිෂ්පාදනය**

| වර්ෂය | ඵලදාව ('000 මෙ. ටො.) | නිෂ්පාදනය ('000 මෙ. ටො.) |
|---|---|---|
| 85/86 | 3,585 | 1,684 |
| 86/87 | 3,678 | 1,390 |
| 87/88 | 3,440 | 1,524 |
| 88/89 | 3,429 | 1,342 |
| 89/90 | 3,564 | 1,647 |
| 90/91 | 3,620 | 1,554 |
| 91/92 | 3,512 | 1,630 |
| 92/93 | 3,516 | 1,692 |
| 93/94 | 3,344 | 1,670 |
| 94/95 | 3,603 | 1,761 |

පහත වගුවෙහි දැක්වෙන පරිදි විමසුමට ලක්වන කාල පරිච්ඡේදය තුළ අනෙකුත් ප්‍රධාන ආහාර භෝග කිපයක නිෂ්පාදනය සැළකිය යුතු වැඩිවීමක් දක්නට ලැබිණි.



සටහන 1.2

93/94 – 94/95 මහ කන්නයේ එළවළු නිෂ්පාදනය

| වර්ගය | 93/94 මහ<br>මෙ. ටො. | 94/95 මහ<br>මෙ. ටො. |
|---|---|---|
| අර්තාපල් | 45,707 | 58,236 |
| එම්බටු | 36,898 | 39,905 |
| තක්කාලි | 13,825 | 14,618 |
| පිපිඤ්ඤා | 9,839 | 11,334 |
| බෝංචි | 12,843 | 13,554 |
| වට්ටක්කා | 38,144 | 44,573 |
| අලුපුහුල් | 37,082 | 41,557 |

2. ආනයන/අපනයන

දේශීය සහල් නිෂ්පාදනයේ වැඩිවීමක් තිබුණ ද, ශ්‍රී ලංකාව විශාල වශයෙන් තිරිඟු පිටි ආනයනය කරමින් පැවතිනි.

සටහන 2.1

තිරිඟු පිටි ආනයනය හා දේශීය සහල් නිෂ්පාදනය

| වර්ෂය | තිරිඟු පිටි<br>('000 මෙ. ටො.) | දේශීය සහල් නිෂ්පාදනය<br>('000 මෙ. ටො.) |
|---|---|---|
| 1970 | 374* | 1,631 |
| 1975 | 528* | 1,154 |
| 1980 | 468* | 2,133 |
| 1985 | 665 | 2,661 |
| 1990 | 584 | 2,538 |
| 1994 | 674 | 2,683 |

* මෙම වර්ෂවල ශ්‍රී ලංකාව විසින් තිරිඟු පිටි ආනයනය කර ඇත. දැන් තිරිඟු ආනයනය කර මෙරට දී පිටි කරනු ලැබේ.

සහල් පිටි යොදා සැදූ බේකරි නිෂ්පාදනයන් ජනප්‍රිය කරවීම සඳහා වැඩ පිළිවෙලක් දැනටමත් දියත් කර ඇත.

දැනට දේශීය සහල් නිෂ්පාදනය ඉල්ලුමෙන් 90% ක් සම්පූර්ණ කිරීමට සෑහේ. ආනයනික සහල්වලින් එක් කොටසක් වන්නේ හෝටල්, ආපන ශාලා ආදියෙහි භාවිතය සඳහා ගෙන්වන බාස්මතී වැනි මිළ අධික සහල් විශේෂයන් ය. එවැනි වර්ගවල සහල් ද දේශීය වශයෙන් නිපදවීමෙන් සහල් ආනයනය තවදුරටත් අඩු කිරීමට පියවර ගනිමින් පවතී.

3. රජයේ ක්‍රියාකාරී සහාය

*3.1 ග්‍රාමීය ණය*

දැඩි ලෙස ණය හරිත වූ ගොවීන්ට සහන සැලසීම සඳහාත්, ආයතනික ණය පහසුකම් නොකඩවා ලැබීම සහතික කරවනු සඳහාත් ගොවීන් විසින් ගත් පැරණි ණය කපා හරින ලදී.

### 3.2. පොහොර සහනාධාර

පොහොර භාවිතය ධෛර්යමත් කරවනු සඳහාත්, අධික යෙදවුම් මිළ හා අඩු ලාභදායිත්වය නිසා පීඩනයට පත් ගොවීන්ට සහන සැලසීම සඳහාත් පොහොර සහනාධාරය ප්‍රතිෂ්ඨාපනය කරනු ලැබිනි. දැනට රජය පොහොර මිළෙන් 45%ක සහනාධාරයක් සපයයි.

තවද, වෙළඳ පොළෙහි ගොවීන්ගේ කේවල් කිරීමේ හැකියාව වැඩිදියුණු කරනු වස් ඔවුන්ට ජනමාධ්‍ය මගින් වෙළඳ පොළ තොරතුරු සපයනු ලැබිණි.

### 3.3. අලෙවිය

ගොවීන්ට සිය නිෂ්පාදන අලෙවි කර ගැනීමේ දී ඇතිවන හිරිහැර අඩුකරන අටියෙන් වී අලෙවි මණ්ඩලයේ මිළදී ගැනීම් වැඩි කරනු සඳහා එයට අවශ්‍ය අරමුදල් හා උපකරණ ආදී පහසුකම් සපයා දෙනු ලැබිණි. 1994 වර්ෂයේ දී වී අලෙවි මණ්ඩලය විසින් මෙ. ටො. 1,19,570ක් මිළදී ගනු ලැබිණි. 1995 ඔක්තෝබර් මස අවසානය වන විට වී මෙ. ටො. 2,80,000 ක් මිළදී ගෙන තිබිණි.

### 3.4. රක්ෂණය

ගොවීන්ට ගෙවනු ලබන රක්ෂණ ප්‍රතිලාභ වැඩිකිරීමට හා ඔවුන්ගේ යැපෙන්නන් ද ආවරණය වන සේ ප්‍රතිලාභ සැපයීම ව්‍යාප්ත වන අන්දමින් කෘෂි රක්ෂණ ක්‍රමය ප්‍රතිසංවිධානය කරනු ලැබිණි.

### 3.5. ඉඩම්

1994 වන විට විවිධ ජනපද පිහිටුවීමේ ව්‍යාපෘති මගින් කට්ටිකරුවන් සඳහා ඔප්පු 11,80,000ක් පමණ නිකුත් කර තිබුන ද, ඒවායේ හුවමාරුව සඳහා පණවා තිබූ සීමා කිරීම නිසා බැංකු ණය ගැනීම් ආදී කාර්යයන් සඳහා ඒවා යොදා ගැනීමට ඇති ඉඩකඩ වැළකී තිබිණි. "අමා" යනුවෙන් හැඳින්වෙන නව්‍ය වැඩ පිළිවෙලක් මගින් එවැනි ඉඩම්වල හිමිකම් කට්ටිකරුවනට පැවරෙන පරිදි ඒවායේ දැනට පවතින ඔප්පු වෙනුවට "ජයභූමි" ඔප්පු ප්‍රදානය කිරීමට කටයුතු යොදා ගෙන යනු ලැබේ.

### 3.6. නිලධාරිවාදය පිටුදැකීම

රාජ්‍ය තන්ත්‍රය විසින් පහසුකම් සැලසීමේ ක්‍රියාවලිය පමණක් ඉටු කරන හා තීරණ ගැනීමේ ක්‍රියාවලියේ දී වඩා වැඩි ප්‍රතිලාභී සහභාගිත්වයක් අරමුණු කරගත් "අමා" යනුවෙන් හැඳින්වෙන ග්‍රාමීය මට්ටමේ සිට ආයතන ගොඩනැංවීමේ සමස්ත ක්‍රියාදාමයකට මුල පුරනු ලැබ ඇත.

"අමා" වැඩ පිළිවෙලෙහි විශේෂ ලක්ෂණ නම් –

* ගොවි සෙවන
* ගොවි ජන බැංකුව
* ගොවි ජන ලොතරැයිය
* එළවළු සංවර්ධන මණ්ඩලය
* පළතුරු සංවර්ධන මණ්ඩලය
* කුළු බඩු හා ඒ ආශ්‍රිත නිෂ්පාදන අලෙවි මණ්ඩලය
* ජය භූමි ඔප්පු

වාරිමාර්ග

(අ) (i) ප්‍රතිපත්තිමය රාමුව

වාරිමාර්ග පහසුකම් සැපයීමෙහිලා යෙදවෙන අති විශාල ජාතික ආයෝජනය නිසිලෙස කළමණාකරණය කිරීම තුළින් සහ ශ්‍රම විභජනයේ රාජ්‍ය සහ පෞද්ගලික අංශයන්ට වඩාත් ගැලපෙන සේ බෙදා හැරීම තුළින් වාරිමාර්ග ක්ෂේත්‍රයේ අරමුණු සාක්ෂාත් කරගැනීම අපේක්ෂා කෙරේ.

මෙහි දී වෙනත් ආයතන විසින් භාරගෙන පවත්වාගෙන යාහැකි උපයෝගී සේවාවල් එම ආයතනයන්ට පැවරීම මගින් මහවැලි අධිකාරිය එම බරින් නිදහස් කරවනු ලැබේ.


යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම මගින්, දුරබැහැර ප්‍රදේශයන්හි ආයෝජනය කිරීමට පෞද්ගලික අංශය දිරි ගන්වනු ලැබේ.

මනාප පරිදි ඉඩම් පාවිච්චියට පනවා ඇති සීමා කිරීම් ඉවත් කිරීමෙන් ගොවීන්ට ඔවුන්ගේ ඉඩම් වඩාත් ඵලදායක අයුරින් පාවිච්චි කිරීමේ නිදහස හා හැකියාව ලබාදෙනු ලැබේ.

2. නිෂ්පාදනය

මෑත අවුරුදු කීපය තුළ වාරිමාර්ග යටතේ වී වගා කරන ලද බිම් ප්‍රමාණයෙහි ස්ථාවර වර්ධනයක් පෙන්නුම් කරයි. 1994/95 මහ කන්නයේ විශාල වාරිමාර්ග යෝජනා ක්‍රම යටතේ වී වගා කරන ලද බිම් ප්‍රමාණය මෙතෙක් වාර්තා වූ ඉහළම ප්‍රමාණය වේ. යල කන්නයේ වපුරන ලද බිම් ප්‍රමාණයේ ද ඒ හා සමාන ප්‍රවනතාවයක් පෙන්නුම් කරයි.

විශාල වාරිමාර්ග යෝජනා ක්‍රම යටතේ වී වපුරන ලද බිම් ප්‍රමාණය





මූලාශ්‍රය : ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව.
සටහන : 1995 මහ කන්නය සඳහා පමණයි.

සුළු වාරිමාර්ග යටතේ වී වගා කරන ලද බිම් ප්‍රමාණයේ ද සමාන ප්‍රවනතාවයක් දක්නට ඇති නමුත්, සුළු වාරිමාර්ග ක්‍රමයන්හි ස්වභාවය හේතු කොට ගෙන විචලතාවයක් දක්නට ඇත.

ජනාධිපති කාර්යාලය
පුස්තකාලය

### සුළු වාරිමාර්ග යටතේ වී වපුරන ලද බිම් ප්‍රමාණය

වපුරන ලද බිම් ('000 හෙක්ටයාර්)





මූලාශ්‍රය : ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව.
සටහන : 1995 මහ කන්නය සඳහා පමණයි.

කන්න දෙකෙහිම වර්ෂා ජලයෙන් වී වපුරන ලද බිම් ප්‍රමාණයේ අඩුවීමේ ප්‍රවණතාවයක් පෙන්නුම් කරයි. වාරිමාර්ග යටතේ වී වගා කරන ලද බිම් ප්‍රමාණයේ වැඩිවීම වී නිෂ්පාදනය සඳහා ද බලපෑමක් ඇති කරවයි.

### වී – අහස්දියෙන් වැපිරූ බිම් ප්‍රමාණය

වැපිරූ බිම් ප්‍රමාණය (හෙක්ටයාර් '000)




මූලාශ්‍රය : ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව.
සටහන : 1995 මහ කන්නය සඳහා පමණයි.

## 3. විදේශ ආධාර මත ක්‍රියාත්මක වන ව්‍යාපෘති

විවිධ වාරි මාර්ග ක්‍රම ඉදිකිරීම්, නඩත්තු කිරීම් හා පුනරුත්ථාපනය සඳහා විදේශ ආධාර මත පහත සඳහන් ව්‍යාපෘති ක්‍රියාත්මක කෙරෙමින් පවතී.

### 3.1 *වයඹ පළාතේ විශේෂ වැව් පුනරුත්ථාපන ව්‍යාපෘතිය :*

මෙම ව්‍යාපෘතිය සඳහා රුපියල් මිලියන 375ක ප්‍රදානයක් යුරෝපා ආර්ථික කොමිසම සපයන ලදී. 1994 වර්ෂය අවසානය වන විට යෝජනා ක්‍රම 7ක වැඩ කටයුතු නිමවිය. පුත්තලම දිස්ත්‍රික්කයේ පිහිටි ඉතිරි යෝජනා ක්‍රම තුනෙහි ඉදිකිරීම් කටයුතු කෙරෙමින් පවතී.

### 3.2 *මිනිපේ - නාගදීපය වාරිමාර්ග පුනරුත්ථාපන ව්‍යාපෘතිය :*

| | | |
|---|---|---|
| මුළු පිරිවැය | - | රු. මිලියන 800 |
| ව්‍යාපෘතිය ආරම්භය | - | 1988 වර්ෂය |
| මූල්‍ය ආධාර සැපයීම | - | ජපන් රජයෙන් ලබාගත් ණය ආධාර |

1995 සැප්තැම්බර් මස වන විට මෙම ව්‍යාපෘතියේ වැඩ කටයුතුවලින් 77%ක ප්‍රමාණයක් නිමකර ඇති අතර 1997 දී සියළු වැඩ නිම කිරීමට අපේක්ෂා කෙරේ.

### 3.3 *ජාතික වාරිමාර්ග පුනරුත්ථාපන ව්‍යාපෘතිය :*

ලෝක බැංකුව හා යුරෝපා ආර්ථික කොමිසම මෙම ව්‍යාපෘතිය සඳහා මූල්‍යාධාර සපයනු ලැබේ.

මුළු පිරිවැය - රු. මිලියන 2,367

1991 වර්ෂයේදී ආරම්භ කරන ලද අතර 1997 වර්ෂයේදී නිම කිරීමට අපේක්ෂා කෙරේ.

මෙම යෝජනා ක්‍රමය මගින් දිප ව්‍යාප්ත ප්‍රධාන/මධ්‍යම වාරිමාර්ග ක්‍රම 35 ක් සහ සුළු වාරිමාර්ග ක්‍රම 838 ක් පුනරුත්ථාපනය කිරීමට බලාපොරොත්තු වේ. මෙමගින් ගොවි සංවිධාන පිහිටුවීම හා පුනරුත්ථාපනය කරන ලද යෝජනා ක්‍රමවලට වැඩිදියුණු කළ මෙහෙයුම් සහ නඩත්තු පිළිවෙත් හඳුන්වාදීම සිදු කෙරේ.

දැනටමත් ප්‍රධාන වාරිමාර්ග ක්‍රම 2 ක් හා සුළු වාරිමාර්ග ක්‍රම 175 ක වැඩ කටයුතු සම්පූර්ණ කර ඇති අතර, ප්‍රධාන/මධ්‍යම වාරිමාර්ග 19 ක හා සුළු වාරිමාර්ග 157 ක පුනරුත්ථාපන කටයුතු ඉදිවෙමින් පවතී.

### 3.4 *වයඹ පළාතේ ජල සම්පත් සංවර්ධන ව්‍යාපෘතිය :*

වයඹ පළාතේ ජල සම්පත් සංවර්ධන ව්‍යාපෘතිය 1992 දී ආරම්භ කරන ලදී. මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන අංග තුනක් ඇත. එනම්, ග්‍රාමීය යටිතල පහසුකම් ණය ආධාර සහ ආයාතනික ආධාර ද වේ. ආසියානු සංවර්ධන බැංකුව මේ සඳහා මූල්‍යාධාර සපයනු ඇත.

හෙක්ටයාර් 2,500 පමණ බිම් ප්‍රමාණයක් ආවරණය වන පරිදි මධ්‍ය පරිමාණයේ යෝජනා ක්‍රම 9 ක් සහ කුඩා පරිමාණයේ යෝජනා ක්‍රම 300ක් පුනරුත්ථාපනය කිරීම ද, ප්‍රධාන යෝජනා ක්‍රම 5 ක්, මධ්‍ය පරිමාණයේ යෝජනා ක්‍රම 17 ක් සහ සුළු පරිමාණයේ යෝජනා ක්‍රම 300 වැඩි දියුණු කිරීම ද, මධ්‍ය පරිමාණයේ එක් වැවක් හා කුඩා වැව් 30 ක් ප්‍රතිෂ්ඨාපනය කෙරේ.

මෙයට අමතරව කි. මී. 740 පමණ දිග ග්‍රාමීය පාරවල් වැඩිදියුණු කිරීම යනාදිය ග්‍රාමීය යටිතල පහසුකම් ගණයට ඇතුළත් වේ.

ගොවීන්ට ළිං ඉදිකිරීම සඳහා ද, ගැමි කාන්තාවන්ට ගොවිපලෙහි හා ගොවි පලෙන් බාහිර ආදායම් උපයා ගැනීමේ කටයුතුවල යෙදීම සඳහාද ණය පහසුකම් මෙම ව්‍යාපෘතිය යටතේ සපයනු ඇත.

දැනටමත් මෙම ව්‍යාපෘතිය යටතේ සුළු වාරිමාර්ග ක්‍රම 20ක වැඩ නිමකර ඇති අතර, තවත් 70ක ඉදිකිරීම් කටයුතු සිදුවෙමින් පවතී. අනුමත කරන ලද කි. මී. 200ක් වූ ග්‍රාමීය මාර්ග අතුරෙන් කි. මී. 94 ක වැඩ කටයුතු ක්‍රියාත්මක වෙමින් පවතී. ණය පහසුකම් උපයෝගී කිරීමෙන් ගොවීන් විසින් ළිං 83 ක ඉදිකිරීම් කටයුතු නිම කර ඇති අතර, ගැමි කාන්තාවන් 352 විසින් සුළු පරිමාණ ව්‍යාපාර කටයුතු ආරම්භ කර ඇත. මෙම ව්‍යාපෘතිය 1998 වර්ෂය අවසානයේදී නිම කිරීමට අපේක්ෂිතය.

*3.5. මහවැලි ගඟ හරහා හෙට්ටිපොල පාලම :*

මහවැලි ගඟ හරහා හෙට්ටිපොල පාලම ඉදිකිරීම

මුළු පිරිවැය – ජපාන යෙන් මිලියන 2,075
යෝජිත ඉදිකිරීම් දිනය – 1995 නොවැම්බර්

*3.6 ඒකාබද්ධ අරමුදලින් ක්‍රියාත්මක වන ව්‍යාපෘති :*

වාරි කර්මාන්තයට අදාළ මුළුමනින්ම ඒකාබද්ධ අරමුදලින් ක්‍රියාත්මක වන ව්‍යාපෘතියන්හි සාරාංශය පහත දැක්වේ :

| ව්‍යාපෘතිය | දිස්ත්‍රික්කය | වියදම (සැප්. දක්වා) රු. මිලියන | වෙන්කළ මුදල රු. මිලියන | වියදම් ප්‍රමාණය (සැප්. දක්වා) රු. මිලියන |
|---|---|---|---|---|
| 1. ඇල්ලපොතාන ඇනිකට් | අනුරාධපුර | 3.25 | 3.0 | 0.048 |
| 2. කලාඔය හරහා පාලම (රාජාංගන/පුත්තලම-අනුරාධපුර පාර) | අනුරාධපුර | – | 3.0 | 0.73 |
| 3. මල්වතු ඔය හරහා ගල්කඩවල ඇනිකට් | අනුරාධපුර | 2.38 | 3.0 | 0.96 |
| 4. ගල්ඔය ගංගා කලාපය පුනරුත්ථාපනය | අම්පාර | – | 13.0 | 1.51 |
| 5. සද්ධාතිස්ස වැව | මොණරාගල | 14.9 | 11.0 | 7.73 |
| 6. වැව් 12 පුනරුත්ථාපනය කිරීම – මැදිරිගිරිය | පොළොන්නරුව | – | 10.0 | 2.26 |
| 7. කැළණි ගඟ ගංවතුර වැළැක්වීමේ බැම්ම | කොළඹ/ගම්පහ | 15.8 | 10.0 | 3.11 |
| 8. වාන්ඇල | ත්‍රිකුණාමලය | – | ල. නො. | ල. නො. |

*3.7. නව ව්‍යාපෘති*

1996 වර්ෂයේ පහත සඳහන් නව ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා විමර්ශණ කටයුතු සිදු කෙරෙමින් පවතී :

1. වැලිඔය මොණරාගල දිස්ත්‍රික්කයට හැරවීම
2. කටුපොත ඔය හරහා දිය පැන්නුමක් ඉදිකිරීම
3. මලාල ඔයට මව් ආර හැරවීම
4. මොණරාගල දිස්ත්‍රික්කයේ මධ්‍ය පරිමාන වාරිමාර්ග යෝජනා ක්‍රම
5. නිල්වලා ගඟ නිම්න සංවර්ධනය – කිරලකැලේ
6. අම්පාර පෙරිය කලපු ජලාපවාහන ක්‍රමය

ලියනගස්තොට යෝජනා ක්‍රමය, මුරුතවෙල, ජලාශ යෝජනා ක්‍රමය හා හම්බන්තොට දිස්ත්‍රික්කයේ බදගිරිය යෝජනා ක්‍රමය සඳහා ජපාන ජාත්‍යන්තර සහයෝගිතා ආයතනයේ ආධාර ඇතිව සාධ්‍යතා අධ්‍යයනයක් උදෙසා විමර්ශණ කටයුතු නිමකර ඇත.

ජල සම්පත් මණ්ඩලය මගින් ජල විද්‍යාත්මක සමීක්ෂණ 259 ක් 1994 වර්ෂයේ දී පවත්වන ලද අතර, 1995 පළමු මාස 9 තුළ සමීක්ෂණ 256 ක් පවත්වා ඇත. 1994 වර්ෂය තුළ නල ළිං 275ක් ඉදිකර ඇති අතර, 1995 පළමු මාස 9 තුළ ඉදිකරන ලද නල ළිං සංඛ්‍යාව 232 කි.

*3.8. මහවැලි යෝජනා ක්‍රමය :*

ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය මගින් මහවැලි වැඩ සටහන සඳහා රු. මිලියන 2,244 ක් ද, උඩ වලව ව්‍යාපාරය සඳහා රු. මිලියන 520 ක් ද, 1995 වර්ෂය සඳහා ප්‍රතිපාදනය කර ඇත. එම ප්‍රතිපාදනයන්ගෙන් 1995 වර්ෂයේ අගෝස්තු මස අග වන විට රු. මිලියන 1,266 ක් නැතහොත් 56% ක් මහවැලි වැඩ සටහන උදෙසාද නිදහස් කර ඇත.

1995 වර්ෂය සඳහා මහවැලි 'බී' කලාපයේ පවුල් 1,275 ක් පදිංචි කරවීමට බලාපොරොත්තු විය. එසේ වුවත් එදිරිවාදිකම් ආරම්භවීම හේතුවෙන් 1995 අගෝස්තු වන විට මෙම කලාපයේ පදිංචි කරවීමට හැකි වූයේ පවුල් 132 පමණි.

මහවැලි අනෙකුත් කලාපයන්හි හෝ උඩවලව ප්‍රදේශයේ පවුල් පදිංචි කරවීමට බලාපොරොත්තු නොවුවත්, මහවැලි 'සී' කලාපයේ පවුල් 10ක් ද, උඩවලව ප්‍රදේශයේ පවුල් 2,812 ක් ද පදිංචි කරවිය. මේ අනුව 1995 අගෝස්තු දක්වා පවුල් 2,954 පදිංචි කරවා ඇත. ඉන් පවුල් 2,551 ක්ම කෘෂිකර්මයේ නොයෙදන පවුල් වේ.


(ඈ) (iii) වැවිලි කර්මාන්ත අංශය

(අ) තේ

1. නිෂ්පාදනය

1995 මුළු තේ නිෂ්පාදන පරිමාව මෙතෙක් වාර්තාගත උපරිමය වූ 1994 නිෂ්පාදන පරිමාව වූ කි. ග්‍රෑ. මිලියන 242.2 ට සමාන හෝ එය ඉක්ම වූ ප්‍රමාණයක් විය හැකි යයි අපේක්ෂා කෙරේ. සී. ටී. සී. තේ නිෂ්පාදන පරිමාව 126%ක වර්ධනයක් පෙන්නුම් කරමින් 1994 ජනවාරි සිට ජූලි දක්වා නිෂ්පාදන පරිමාව වූ කි. ග්‍රෑ. මිලියන 5.3, 1995 එම කාල සීමාවේ දී කි. ග්‍රෑ. මිලියන 11.9 දක්වා වැඩි විය. ක්‍රි. ව. 2000 වන විට රටේ මුළු තේ නිෂ්පාදනයෙන් 20% ක් සී. ටී. සී. තේ වශයෙන් නිෂ්පාදනය කිරීමේ ඉලක්කය ළඟා කරගත හැකි බව පෙනී යයි.

මුළු තේ නිමැවුම සහ මිල ගණන්




මූලාශ්‍රය : ශ්‍රී ලංකා තේ මණ්ඩලය.

ඉහත ප්‍රස්ථාරයෙහි දැක්වෙන පරිදි 1995 මුල් කාර්තු තුන තුළ මධ්‍යන්‍ය තේ මිළ කලින් වර්ෂයේ දී ට වඩා 4% ක් පමණ ඉහළ මට්ටමේ පැවතිණි. උස්, මැදි හා පහත් බිම් යන තුන් වර්ගයේ ම තේ මිළ තෙවැනි කාර්තුවේ දී සැළකිය යුතු ඉහළ යාමක් සිදු වූ අතර, උස් බිම් තේ මිළ වඩා වැඩි ඉහළ නැගීමක් වාර්තා කළේය.

2. අපනයන

1994 ජනවාරි සිට ජුනි දක්වා කාලය තුළ දී කිලෝ ග්‍රෑම් දශ ලක්ෂ 33.3 ක් වූ අගය එකතු කරන ලද තේ අපනයන ප්‍රමාණය 1995 වසරේ නිරීක්ෂණ කාලය තුළ දී කිලෝ ග්‍රෑම් දශ ලක්ෂ 43.9 දක්වා වැඩි විය. 1994 තේ අපනයන ප්‍රමාණය හා සැසඳීමේ දී මෙම වැඩිවීමේ ප්‍රතිශතය 31% කි. තොග වශයෙන් කරන තේ අපනයනයන්ට වඩා අගය එකතු කරන ලද තේ අපනයනවලින් ආර්ථිකයට වැඩි වාසි ලැබෙන බවට මෙය හොඳ සාධකයකි.

3. රජයේ ක්‍රියාකාරී සහාය

*3.1 පැල සිටුවීම*

කුඩා තේ වතු වගාවන් තුළ හෙක්ටයාර් 1,069 ක නැවත පැල සිටුවීම කෙරුණු අතර, හෙක්ටයාර් 1,800 ක අළුතින් පැල සිටුවීම් සිදු කරන ලදී. මෙයට අමතරව රුපියල් දශ ලක්ෂ 87 ක ණය ආධාර ක්ෂේත්‍ර වගාවන් සඳහා ද, රුපියල් දශ ලක්ෂ 12 ක ණය ආධාර පැල තවාන් සඳහා ද අනුමත කර ඇත.

*3.2 කර්මාන්ත ශාලා දියුණු කිරීම්*

සී. ටී. සී තේ කර්මාන්තශාලා නවීකරණය සඳහා රුපියල් දශ ලක්ෂ 107 ක දිරි දීමනා මුදලක් ගෙවන ලද අතර, රුපියල් දශ ලක්ෂ 14.5 ක මුදලක් සම්ප්‍රදායික ක්‍රමය පවත්වාගෙන යන කර්මාන්ත ශාලා නවීකරණය සඳහා ගෙවන ලදී. එයට අමතරව තේ බෑග් කිරීමට අවශ්‍යවන යන්ත්‍රෝපකරණ 43 ක් මිළදී ගැනීම සඳහා දිරි දීමනා වශයෙන් රුපියල් දශ ලක්ෂ 27.4 ක මුදලක් ගෙවන ලදී. තවද කර්මාන්ත ශාලා පුනරුත්ථාපන කටයුතු සඳහා රුපියල් දශ ලක්ෂ 68 ක ණය ආධාර මුදල් සපයා දී ඇත.

*3.3 වැදගත් සිදුවීම්*

ජාත්‍යන්තර තේ නිෂ්පාදකයින්ගේ සාකච්ඡා මාලාවේ මූලික රැස්වීම කොළඹ දී පවත්වන්නට යෙදුනි. මෙම රැස්වීම වැදගත් වන්නේ ලෝකයේ තේ නිෂ්පාදන කරන්නන්ගේ අන්‍යෝන්‍ය සහභාගිත්වය, තේ නිෂ්පාදනයේ මතු දියුණුව සඳහා ලබාගැනීමට කරන ලද සාර්ථක වෑයමක් ලෙස හැඳින්විය හැකි හෙයිනි.

(ආ) රබර්


1. නිෂ්පාදනය

පහත සඳහන් සටහන අනුව 1995 වසරේ ජුනි දක්වා කරන ලද මුළු රබර් නිෂ්පාදනය කිලෝ ග්‍රෑම් දශ ලක්ෂ 55.9 ක් ලෙස සටහන් වේ. එම නිෂ්පාදිතය 1994 වසරේ ජුනි දක්වා කරන ලද මුළු රබර් නිෂ්පාදන ප්‍රමාණයට වඩා 9.4% ක වැඩිවීමක් පෙන්නුම් කරයි. පසුගිය දශක දෙක තුළ දී ඉහත කී නිෂ්පාදන ප්‍රමාණය ඉක්ම වූයේ 1975 හා 1983 යන වර්ෂවලදී පමණකි. නිරීක්ෂණ කාලය තුළ දී දුම් ගසන ලද රබර් හා සුදු පැහැති ක්‍රේප් රබර් නිෂ්පාදන සැලකිය යුතු ප්‍රමාණයකින් වැඩි විය. රබර් වර්ගවල මිළ සංසන්දනය කිරීමේ දි අඩු පිරිවැයකින් යුත් දුම් ගසන ලද රබර්වල මිළ සාපේක්ෂ වශයෙන් ක්‍රේප් රබර් මිළට වඩා වැඩිවීම ඉහතකී නිෂ්පාදන වැඩිවීමට මූලික හේතු සාධක විය.

2. මිළ

ඉහත සඳහන් සටහන අනුව 1995 වර්ෂයේ (අගෝස්තු මස දක්වා) රබර්වල සාමාන්‍ය මිළ 1994 වර්ෂයේ රබර්වල සාමාන්‍ය මිළට වඩා ඉහල බව පෙන්නුම් කරයි. 1994 වර්ෂයේ ජුනි මස නැව් ගත කරන ලද රබර්වල සාමාන්‍ය මිළ රුපියල් 45.30 ක් වූ අතර, 1995 වර්ෂයේ දී එය රුපියල් 82.20 දක්වා වැඩි විය. ආර්. එස්. එස්. 1 රබර් කිලෝවක සාමාන්‍ය මිළ 1994 වර්ෂයේ දී රුපියල් 41.73 ක් වූ අතර, 1995 වර්ෂයේ දී එම මිළ ගණන් රුපියල් 77.62 දක්වා වැඩි විය.

මුළු රබර් නිමැවුම සහ මිළ ගණන්





මූලාශ්‍රය : රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව.

3. අපනයන

මෑත වර්ෂවල දී රබර් අපනයන ප්‍රමාණයන් අඩු වීමට මූලික හේතුවූයේ මුළු රබර් නිෂ්පාදනයෙහි අඩු වීමත්, අමු රබර් කිරි වැඩි ප්‍රමාණයක් දේශීය කර්මාන්ත සඳහා යොදා ගැනීමත් නිසාය. පහත සඳහන් සටහන අනුව රබර් අපනයනවල වටිනාකම 1991 වර්ෂයට පසුව වැඩිවූයේ රබර් සඳහා ලැබෙන රුපියල් මිළ වැඩිවීම හේතුවෙනි.

රබර් : අපනයන පරිමාව සහ අගයන්




මූලාශ්‍රය : මහ බැංකු වාර්තාව.

4. රජයේ ක්‍රියාකාරී සහාය

*4.1 පැල සිටුවීම*

රබර් නැවත වගාව සහ අළුත් වගාවන් සඳහා සපයන ලද රබර් සහනාධාරය 1995 ජනවාරි මාසයේ සිට ක්‍රියාත්මක වන පරිදි 30% ප්‍රමාණයකින් වැඩි කරන ලදී. ඒ අනුව නැවත වගාව සඳහා අක්කරයකට රුපියල් 15,000 ක සහනාධාර මුදලක් ද, අළුත් වගාවන් සඳහා අක්කරයකට රු. 14,500 ක සහනාධාර මුදලක් ද ගෙවීමට නියම විය. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් සුළු පරිමාණ රබර් වතු හෙක්ටයාර් 2,031 ක නැවත පැළ සිටුවීම සිදු කරන ලද අතර, හෙක්ටයාර් 723 ක අළුතින් පැල සිටුවීම සිදු කරන ලදී. එයට අමතරව රබර් පැල සැපයීම් වැඩි කිරීම සඳහා ගන්නා ලද ක්‍රියා මාර්ගයක් වශයෙන් පැළ තවාන් 20 ක හරිත බද්ද කිරීම් හා දුඹුරු බද්ද කිරීමේ තාක්ෂණය සුළු පරිමාණ වතු හිමියන්ට හඳුන්වා දෙන ලදී. තවද රබර් කිරි කපන දවස් ගණනින් වැඩි කිරීම සඳහා වැසි ආරක්ෂණ වශයෙන් යොදා ගැනීමට පොලිතින් ආවරණ නොමිළයේ බෙදා දෙන ලදී.

*4.2 සමුපකාර සංවිධාන*

කුඩා වතු හිමියන්ගේ සමුපකාර සංගම් 229 ක් ඇති කරන ලද අතර, කළුතර දිස්ත්‍රික්කයේ කුඩා වතු හිමියන්ගේ සමුපකාර සමාගම් සෘජු රබර් අපනයනයන් කිරීමේ හැකියාව දක්වා දියුණුව ලබා ඇත.

*4.3 පුහුණු කිරීම්*

ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘතිවල සහභාගීත්වය ඇතිව ගාල්ල සහ මාතර දිස්ත්‍රික්කවල 600 ක් පමණ රබර් කිරි කපන්නන්ට ඒ සඳහා පුහුණුව ලබා දී ඇත.

(ඇ) පොල්


1. නිෂ්පාදනය

1995 වසරේ ජනවාරි සිට ජුනි මස දක්වා පොල් නිෂ්පාදනය පොල්ගෙඩි දශ ලක්ෂ 1,334 ක් විය. එය 1994 වර්ෂයේ එම කාලය තුළ නිෂ්පාදනය කරන ලද පොල්ගෙඩි දශ ලක්ෂ 1,233 ට වඩා 8% වැඩි වීමක් බව පෙන්නුම් කෙරේ.

2. මිළ

ඉහත සඳහන් සටහන අනුව 1995 වසරේ දේශීය වෙළඳ පොලෙහි අමු පොල් ගෙඩිවල මිළ ගණන් 1994 වෙළඳ පොල මිළට වඩා අඩු බව සටහන් වේ. එමෙන්ම පොල් මද ආශ්‍රිත නිෂ්පාදනවල නැව්ගත කරනලද සාමාන්‍ය අපනයන මිළ ද 1994 වසරේ මිළට වඩා පහතින් සනිටුහන් කෙරේ.

පොල් මුළු නිමැවුම සහ මිළ ගණන්




මූලාශ්‍රය : පොල් සංවර්ධන අධිකාරිය.
සටහන : 1995 මිල ගණන් ජූලි මස දක්වා පමණි.




6-

3. අපනයන

1995 වසරේ නිරීක්ෂණ කාලය තුළ දී පොල් මද ආශ්‍රිත නිෂ්පාදන අතුරින් අමු පොල් ගෙඩි අපනයන ප්‍රමාණයේ ආන්තික අඩුවීමක් පෙන්නුම් කෙරේ. එහෙත් 1994 වර්ෂයේ කොප්පරා, පොල්, තෙල් හා කපාපු පොල් අපනයනයන් පිළිවෙලින් මෙට්‍රික් ටොන් 913ක්, මෙට්‍රික් ටොන් 2,188 ක් හා මෙට්‍රික් ටොන් 19,239 ක් විය. මෙම අපනයන ප්‍රමාණයන් 1995 වසරේ දී පිළිවෙලින් 36%, 16.8% ක් හා 28.7% යන ප්‍රමාණවලින් වැඩි වන ලදී. තවද පොල් මද ආශ්‍රිත නොවන නිෂ්පාදන අතුරින් පොල් කටු ආශ්‍රයෙන් ගන්නා කාබන්වල 2%ක වැඩිවීමක් ඇතිවිය.

පොල් අපනයන පරිමාව සහ අගයන්




මූලාශ්‍රය : මහ බැංකු වාර්තාව

4. රජයේ ක්‍රියාකාරී සහාය

*4.1 පැල සිටුවීම*

හෙක්ටයාර් 1,202 ක පොල් නැවත වගාව කෙරුණු අතර, හෙක්ටයාර් 1,030 ක අළුතින් පොල් වගාව සිදු කෙරුණි. පොල් වතුවල අතුරු භෝග වගාව හෙක්ටයාර් 1,207 ක දී සිදු කෙරුණි. තවද හෙක්ටයාර් 9,365.7 ක ගෙවතු වගාව ආශ්‍රයෙන් පොල් පැල සිටු වීම කෙරුනු අතර, පොල් වතුවල තෙතමන සංරක්ෂණය හෙක්ටයාර් 1,481 දී සිදු කෙරුනි.

*4.2 පොල් සැකසුම් කිරීම*

රුපියල් දශ ලක්ෂ 6.3 ක් වටිනා සහනාධාර මුළු මුදලක් කපාපු පොල් සකස් කිරීමේ මෝල් 15ක් සඳහාත්, කොහු මෝල් 41 ක් සඳහාත්, ඒවායේ සංවර්ධන කටයුතු සඳහාත් ගෙවා ඇත.

*ප්‍රතිසංස්කරණ පිළිබඳ ගැටළු*


වේතන හා යටිතල පහසුකම් තිරසාර අයුරින් වැඩි දියුණු කිරීමේ මාර්ගයක් ලෙස ඵලදායිතාවය වැඩි කරනු වස් දිගු කාලීන ප්‍රාග්ධන විදීමක් මේ අංශයට ඉතා ඉක්මනින් අවශ්‍ය වේ. ඉඩම් භාවිතය පිළිබඳව ඉහළ නම්‍යතාවයක් සහ පැවරිය හැකි දිගු කාලීන බදු ක්‍රමයක් ඇති කිරීමට පවතින නීති රීති වෙනස් කරනු ලැබේ. මේ බදු දීම් සඳහා ඉල්ලුම් කිරීමට දැනට තිබෙන සමාගම්වලට මෙන්ම, අළුත් ආයෝජකයින්ට ද ඉඩ ප්‍රස්ථාව සලසනු ලැබේ. තෝරා ගන්නා ඉල්ලුම් කරුවන් විසින් කොටස් ප්‍රාග්ධනය සැපයිය යුතුවේ.

සේවකයින්ගේ හා කළමනාකාරිත්වයේ අන්‍යෝන්‍ය යුතුකම් හා වගකීම් හඳුනා ගන්නා වතු සමාගම් හා වෘත්තීය සමිති අතර ඇති කර ගන්නා සාමූහික ගිවිසුම් දිරිමත් කරනු ලැබේ.

5. රාජ්‍ය වැවිලි අංශය

1992 සිට සැහෙන ප්‍රමාණයක තේ නිෂ්පාදනයක් රාජ්‍ය වැවිලි අංශයෙන් සිදු කෙරුණි. 1985 සිට 1995 දක්වා කාලය තුළදී වැඩිම තේ නිෂ්පාදනයක් කර ඇත්තේ වර්ෂ 1994 දීය. රාජ්‍ය වැවිලි අංශයේ හා පෞද්ගලික වතු සමාගම්වල කාර්ය සාධනය සංසන්දනය කිරීමේ දී 1994 නිරීක්ෂණ කාලයට වඩා ඉහල මට්ටමේ සංවර්ධනයක් 1995 වසරේ නිරීක්ෂණ කාලය තුළදි සහ ඉන් ඉදිරියටත් පෞද්ගලික වතු සමාගම්වල තේ නිෂ්පාදනයෙන් බලාපොරොත්තු විය හැකි බව පෙනේ.


රජයේ වැවිලි අංශයේ
තේ නිමැවුම




සටහන : 1992 - පෞද්ගලීකරණ වැඩ සටහන හේතුවෙනි.

මෙවැනිම නැමියාවන් රබර් නිෂ්පාදනයෙහි ද ඇති බව පෙන්නුම් කරයි. කෙසේ වුව ද, රාජ්‍ය වැවිලි අංශයේ රබර් වතුවල නිෂ්පාදනයේ අඩුවක් 1995 වසරේ මුල් පස් මාසය තුළ දී දක්නට ඇත. එයට හේතු වශයෙන් දැක්විය හැක්කේ රබර් වගා කරන ප්‍රදේශවල නොකඩවා පැවති අධික වර්ෂාව හේතු කොට ගෙන කිරි කපන දින ගණන් අඩු වීමයි.

රජයේ වැවිලි අංශයේ
රබර් නිමැවුම




සටහන : 1992 පෞද්ගලීකරණ වැඩ සටහන හේතුවෙනි.

*5.1 සමාජයීය යටිතල පහසුකම් දියුණු කිරීම*

රාජ්‍ය වැවිලි අංශයේ වතුවල නිවැසියන්ගේ සමාජයීය යටිතල පහසුකම් දියුණු කිරීම ගැන දැඩි උනන්දුවක් හා කැප වීමක් පෙර කිසිදා නොවූ අන්දමින් සැලකිල්ට භාජන වී ඇත. පහත සඳහන් කටයුතු සමාජයීය යටිතල පහසුකම් දියුණු කිරීම සඳහා කර ඇති කාර්‍යයන් ගෙන් සමහරක් ලෙස පෙන්වා දිය හැක.

- පවුල් 2,780 ක් සඳහා ස්වයං ආධාර නිවාස සෑදීමේ යෝජනා ක්‍රම 138 ක් ආරම්භ කර ඇත. පවුල් 20 ක් සඳහා දැනටමත් එම වැඩ පිළිවෙල සම්පූර්ණ කර ඇත.
- පවුල් 2,051 ක් සඳහා ලයින් කාමර 412 ක් නැවත සෙවිලි කිරීමට යෝජනා කර ඇත. මේ අන්දමින් ලයින් කාමර 16 ක් නැවත සෙවිලි කිරීමේ කටයුතු ආරම්භ කර ඇත.
- පවුල් 14,460 ක් සඳහා ජලය සැපයීමේ යෝජනා ක්‍රම 264ක් ක්‍රියාත්මක වේ. තවද පවුල් 30,094 ක් සඳහා ජලය සැපයීමේ යෝජනා ක්‍රම 487 ක් දැනටමත් ක්‍රියාත්මක වේ.
- වැසිකිළි 2,592ක් තැනීමේ කටයුතු නිමකර ඇති අතර, තවත් වැසිකිළි 13,999 ක් තැනීම කරගෙන යනු ලැබේ.
- පවුල් 28,350ක් සඳහා ළමා සෞඛ්‍ය ඒකක පිහිටුවීමට යෝජනා කර ඇත. එයට අමතරව පවුල් 40,052 ක් සඳහා ළමා සෞඛ්‍ය ඒකක 243ක් දැනටමත් ක්‍රියාත්මක වෙමින් පවතී.

5.2 වෙනත් ප්‍රධාන මූලාරම්භයන්

වර්තමානයේ වතු වගා අංශයන්හි එක් එක් භෝග සඳහා පවතින අභියෝගවලට මුහුණ දීම සඳහා එම භෝග වගාවන් හා අදාළ ආයතනයන්හි කටයුතු නිරීක්ෂණය කිරීම හා ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා කටයුතු පිළියෙල කර ඇත.

ශ්‍රී ලංකා තේ මණ්ඩලය, කුඩා තේ වතු හිමියන්ගේ සංවර්ධන අධිකාරිය, පොල් වගා කිරීමේ මණ්ඩලය සහ සීනි පර්යේෂණ ආයතනයන්හි කටයුතු අධීක්ෂණය කිරීමේ කටයුතු නිමාකර යෝජනා සකස් කර ඇති අතර, රබර් පර්යේෂණ ආයතනයේ නිරීක්ෂණ යෝජනා නිම කෙරෙමින් පවතී. තේ පර්යේෂණ ආයතනයේ යෝජනා බොහොමයක් දැනටමත් ක්‍රියාත්මක කර ඇත.

1994 වර්ෂයේ දී ප්‍රාදේශීය වැවිලි සමාගම්වල කළමනාකරන සමාගම් 10 ක් විසින් මෙහෙයුම් ලාභ උපයන ලදි. මෙම සමාගම් විසින් කොළඹ කොටස් වෙළෙඳ පොලෙහි 20% ක කොටස් විකිණීම මගින් නිර්ණය වූ මිළකට ප්‍රාදේශීය වැවිලි සමාගම්වල පාලනය කිරීමේ අයිතිවාසිකම් මිළට ගනු ලැබිනි.

බොගවන්තලාව වැවිලි සමාගම, අගලවත්ත වැවිලි සමාගම, කෑගල්ල වැවිලි සමාගම, කොටගල වැවිලි සමාගම යන වැවිලි සමාගම්වල කොටස් විකිණීම දැනටමත් ආරම්භ කර ඇත. තවත් ප්‍රාදේශීය වැවිලි සමාගම් විසි තුනක කොටස් පෞද්ගලීකකරණය කිරීමේ කටයුතු සම්පූර්ණ කිරීම මාස 6-9 අතර තුර නිම කිරීමට බලපොරොත්තු වේ.

ආසියානු සංවර්ධන බැංකුව මගින් වැවිලි කර්මාන්ත අංශයේ ප්‍රධාන ආයෝජන වැඩ සටහන් සඳහා ඇමෙරිකානු ඩොලර් දශලක්ෂ 60 ක ණය ආධාර ලබා ගැනීමට කටයුතු පිළියෙල කර ඇති අතර, 1996 වසරේ දී එම ආයෝජන වැඩ කටයුතු ක්‍රියාත්මක කිරීම ඇරඹෙනු ඇත.

ජාතික වතු සංවර්ධන මණ්ඩලය හා ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව යටතේ පවතින සශ්‍රීකත්වයෙන් අඩු ඉඩම් දියුණු කිරීම සඳහා ඇ. ඩො. දශලක්ෂ 20ක් ආසියානු සංවර්ධන බැංකුවෙන් ලබා ගැනීම සඳහා සාකච්ඡා පවත්වා ඇත. 1997 වසරේ දී එම යෝජනා ආරම්භ කිරීම බලාපොරොත්තු වේ.

## (iv) අ ධීවර කටයුතු

### 1. ප්‍රතිපත්ති රාමුව

ධීවර අංශයීය සංවර්ධනයෙහිලා රජයේ වැයමෙහි මූලික අවධාරණය වනුයේ, මත්ස්‍ය නිෂ්පාදනය, සකස් කිරීම සහ අලෙවිකරණය සම්බන්ධයෙන් පෞද්ගලික අංශය මත වඩාත් විශ්වාසය තැබීමයි. මෙහි දී වෙළඳපොල මත පදනම් වූ සම්පත් කළමනාකරණය සහ නිතිරීති සම්පාදනය වෙත රජයේ කාර්ය භාරය නැඹුරුවනු ඇත.

මෙම අංශය නවීකරණය කිරීම සඳහා වන රජයේ වැඩ සටහන්වල ප්‍රධාන මූලධර්මයන් වනුයේ–

- රාජ්‍ය අංශය මගින් යටිතල පහසුකම් සැපයීම.
- ප්‍රතිලාභ දයකත්වය ඉහළ මට්ටමකට ගෙන ඒම.
- යන්ත්‍රනවීකරණය කිරීම සඳහා විශේෂ වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කිරීම.
- මුහුදු සහ ජල සම්පත් ආරක්ෂා කිරීමට නීති සම්පාදනය කොට ක්‍රියාත්මක කිරීම සහ
- ධීවර විශ්ව විද්‍යාල ආයතනයක් පිහිටුවීම.

### 2. නිෂ්පාදනය

1995 වර්ෂයේ ජනවාරි මස සිට අගෝස්තු මාසය දක්වා වූ කාල පරිච්ඡේදය තුළ සම්පූර්ණ මුහුදු සහ අභ්‍යන්තර (මිරිදිය) මත්ස්‍ය නිෂ්පාදනය, 1994 වර්ෂයේ එම කාල පරිච්ඡේදය තුළ වූ නිෂ්පාදනය හා සැසඳීමේ දී මෙට්‍රික් ටොන් 1,32,900 දක්වා 5% ක වැඩිවීමක් දක්නට ලැබුණි.

මත්ස්‍ය නිෂ්පාදනය (මෙට්‍රික් ටොන්)

| | කරදිය | අභ්‍යන්තර | එකතුව |
|---|---|---|---|
| 1994 ලබාගන්නා ලද | 212,200 | 12,000 | 224,200 |
| 1995 ඉලක්කය | 226,119 | 17,300 | 243,499 |
| 1994 ජනවාරි ජුනි ලබාගත් | 117,600 | 9,000 | 126,600 |
| 1995 ජනවාරි ජුනි ලබාගත් | 121,900 | 11,000 | 132,900 |

3. අපනයන

දේශීය හා විදේශීය ඒකාබද්ධ ව්‍යාපාරික ආයතන සතු විශාල බෝට්ටු 24ක් සඳහා බලපත්‍ර නිකුත් කරන ලදී. එහි ප්‍රතිඵලයක් වශයෙන් අල්ලා ගන්නා ලද ටොන් 3,127 ක් වූ මත්ස්‍ය ප්‍රමාණයෙන් ටොන් 2,421 ක මත්ස්‍ය ප්‍රමාණයක් අපනයනය කරන ලදී. රැකියා නිෂ්පාදනය 100ක් පමණ විය. ආයෝජන මණ්ඩලය විසින් රුපියල් දශ ලක්ෂ 1690 ක ආයෝජන වටිනාකමක් ඇති ව්‍යාපෘතීන් 7ක් සඳහා අනුමැතිය ලබා දී ඇත. ඉන් බලාපොරොත්තු වන රැකියා නිෂ්පාදනය 870කි. දෙපක්ෂයේ අන්‍යෝන්‍ය ආරක්ෂාව හා ධීවර කර්මාන්තයේ ප්‍රවර්ධනය සඳහා ශ්‍රී ලංකා-මාලදිවයින් ධීවර අනු කමිටුව ස්ථාපිත කරන ලදී.

4. රජයේ ක්‍රියාකාරී සහාය

*4.1 ධීවර වරායවල්*

ධීවර අංශය සඳහා රජයේ මූලික ආයෝජන ක්ෂේත්‍රය වනුයේ ධීවර වරාය පුනරුත්ථාපනය කිරීමය. රුපියල් දශ ලක්ෂ 1,000 ක වියදමකින් කිරින්ද ධීවර වරාය පුනරුත්ථාපනය කරන ලදී. මෙමගින් දක්ෂිණ හා නැගෙනහිර වෙරළ දිගේ ධීවර බෝට්ටු 200 කට පමණ වරාය පහසුකම් ලබාදිය හැකිවේ. රුපියල් දශ ලක්ෂ 3.2ක වියදමකින් මෝදර ධීවර වරාය මීටර් 42ක් විශාල කෙරිණ. වැඩිමනත් ධීවර බෝට්ටු 35ක් සඳහා වරාය සහ නැංගුරම් පහසුකම් ලබාදුන් අතර එමගින් වසර පුරාම ඈත මුහුදේ මසුන් ඇල්ලීමට හැකිවෙයි. පුරාණවැල්ල, මිරිස්ස සහ බේරුවල වරාය පුනරුත්ථාපන කටයුතු සිදු වූ අනෙකුත් ස්ථාන වේ. මෙම පුනරුත්ථාපන කටයුතු සඳහා රුපියල් දශ ලක්ෂ 68ක් වැය වී ඇත.

*4.2 අළුත් ධීවර වරායවල් ඉදිකිරීම*

ධීවර වරාය හා නැංගුරම් ඉදිකිරීම් සඳහා ශක්‍යතා පරීක්ෂණ කටයුතු හලාවත, දික්ඕවිට, හික්කඩුව, කෝට්ටේගොඩ සහ කුඩාවැල්ල යන වෙරළාසන්න ප්‍රදේශ තුළ දියත් කරන ලදී.

*4.3 වෙරළ සංරක්ෂණය*

උනාවටුන, කහව, ත්‍රිකුණාමලය සහ කල්මුනේ යන වෙරළාසන්න ප්‍රදේශ ආරක්ෂාව සඳහා වෙරළ සංරක්ෂණ ක්‍රම අනුගමනය කරන ලදී. කෝට්ටේගොඩ, ඒදණ්ඩාවෙල සහ මිරිස්ස යන ප්‍රදේශවල වෙරළ පරීක්ෂණ කටයුතු සිදු කෙරුනු අතර, ආසියානු සංවර්ධන බැංකුවේ ආධාර මත ගුවනින් කරණ ලද වෙරළ සංගණන කටයුතු තංගල්ල සහ කල්පිටිය අතර වෙරළ තීරයේ කරන ලදී. මෙම වෙරළ සංරක්ෂණ කටයුතු කරන ලද කාලය තුළ වියදම රුපියල් දශ ලක්ෂ 74.9කි.

*4.4 බෝට්ටු සහනාධාර යෝජනා ක්‍රම*

විශේෂ සහනාධාර යෝජනා ක්‍රමයක් යටතේ සම්ප්‍රදායික ධීවර යාත්‍රා 757ක් ද, එක් දින බෝට්ටු (යාත්‍රා) 152ක් ද, බහුදින බෝට්ටු (යාත්‍රා) 42ක් ද, සහ බෝට්ටු එන්ජින් 106ක් ද ලබා දී ඇත. සම්පූර්ණ සහනාධාර ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 92ක් විය. මෙමගින් මත්ස්‍ය නිෂ්පාදනය ටොන් 5,800 කින් ද රැකියා නිෂ්පාදනය 3,500 කින් ද වැඩි වීමක් බලාපොරොත්තු විය.

*4.5 බදු සහන*

බෝට්ටු එන්ජින් සහ අනෙකුත් ධීවර ආම්පන්න පිරිවැටුම් බද්දෙන් නිදහස් කරන ලදී. ධීවර දැල්, නූල් සහ ලණු සඳහා රේගු බදු 10%ක් අඩු කරන ලදී.

*4.6 නැව් තටාකාංගනය*

මට්ටක්කුලිය නැව් තටාකාංගනය නැවත විවෘත කෙරිනි. ෆයිබර් ග්ලාස් බෝට්ටු 80ක් සහ බහු දින බෝට්ටු (යාත්‍රා) 2ක් ද මෙම කාලය තුළ නිපදවා ඇත. පුද්ගලයින් 20කට රක්ෂා පහසුකම් ලැබී තිබේ.

### 4.7 ධීවර ආම්පන්න සහ බෝට්ටු එන්ජින්

රුපියල් දශ ලක්ෂ 90 ක් වටිනා ධීවර ආම්පන්න මෙම කාලය තුළ නිෂ්පාදනය කර ඇත. ලුනුවිල දැල් විවීමේ මධ්‍යස්ථානය සඳහා දැල් විවීමේ යන්ත්‍ර දෙකක් ඇණවුම් කර ඇත. පුද්ගලයින් 20 කට රැකියා අවස්ථා ලබා දෙමින් මාතර දැල් විකිණීමේ මධ්‍යස්ථානයක් විවෘත කළ අතර, තවත් මධ්‍යස්ථානයක් හලාවත විවෘත කිරීමට සැලසුම් කර ඇත. ශ්‍රී ලංකාවට චීනයෙන් බෝට්ටු එන්ජින් ආනයනය කිරීම ආරම්භකර ඇති අතර, දැනටමත් එන්ජින් 4ක් ගෙන්වා ඇත. මෙම එන්ජින් පෙර පැවති වෙළඳ පල මිළට වඩා අඩු මිළකට ලබාගත හැකිය.

### 4.8 ශීතකරණ ගබඩා

ආසියානු සංවර්ධන බැංකුවේ ආධාර මත මඩකලපුව සහ අනුරාධපුරය ශීතකරණ ගබඩා පුනරුත්ථාපනය කරන ලදී. රුපියල් දශ ලක්ෂ 25ක වියදමකින් යුත් අයිස් නිපදවනු ලබන අළුත් යන්ත්‍ර දෙකක් මෙම ශීතකරණ ගබඩා දෙකට සවි කරණ ලදී.

### 4.9 දේශීය වෙළඳපොල

පාරිභෝක ජනතාව සඳහා අඩුමිළට මසුන් ලබාදීමේ පරමාර්ථයෙන් ධීවර සංස්ථාව මගින් අලවි මධ්‍යස්ථාන 25ක් විමර්ශනයට ලක් වූ කාල පරිච්ඡේදය තුළ දී ආරම්භ කරන ලදී. එමගින් රැකියා අවස්ථා 50ක් ඇති විය.

### 4.10 පර්යේෂණ හා පුහුණු කිරීම්

එන්ජින්, ධීවර කටයුතු සහ අනෙකුත් තාක්ෂණික ක්ෂේත්‍රයන්හි පුද්ගලයින් 648 පුහුණු කරවනු ලැබිණ. පුහුණු කිරීම් සඳහා රුපියල් දශ ලක්ෂ 21.3ක් වැය විය. ආසියානු සංවර්ධන බැංකුවේ ආධාර ලැබීමෙන් ධීවර සම්පත් සංගණනයක් මාස 24ක් තුළ කෙරුණි. එයට අතිරේකව මෙම කාල පරිච්ඡේදය තුළ ජලජීවී සහ සමාජ ආර්ථික පර්යේෂණ අධ්‍යයන ගණනාවක් ක්‍රියාත්මක විය.

### 4.11 පොදු පහසුකම් සැපයීම

ධීවර ජනතාවගේ සුභ සාධනය වැඩි දියුණු කිරීම සඳහා නිසි ක්‍රියා මාර්ගයන් දියත් කරන ලදී. බීමට ජලය සැපයීම, විදුලිය ලබාදීම, මාර්ග පහසුකම්, සෞඛ්‍ය පහසුකම්, සනීපාරක්ෂක කටයුතු, අධ්‍යාපන කටයුතු, ක්‍රීඩා පහසුකම් සහ බීකොන් ලාම්පු ආදිය ලබාදෙන ලදී. එසේ ලබාදෙන ලද පහසුකම් පිළිබඳ සංඛ්‍යා පහත දක්වා ඇත.

| | |
|---|---|
| බීමට ජලය ලබා ගන්නා ළිං | 24 |
| ප්‍රජාශාලා මධ්‍යස්ථාන | 19 |
| ළමා උද්‍යාන | 07 |
| වැසිකිළි | 558 |
| බීකොන් ලාම්පු | 10 |

මෙම ව්‍යාපෘතියෙන් ගම් 385 ක් පහසුකම් හා ප්‍රයෝජන ලබා ඇත. තවද, පුද්ගලයින් 4,100 කට තාවකාලික රැකියා අවස්ථා උදා වී තිබේ. ව්‍යාපෘතිය සඳහා සම්පූර්ණ වියදම රුපියල් දශ ලක්ෂ 20.76ක් වේ.

### 4.12 සමාජ ආරක්ෂණය

ධීවර, විශ්‍රාම හා සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රමය යටතේ ධීවරයින් 1,561ක් ලියා පදිංචි වී සිටිති. මෙම යෝජනා ක්‍රමය සඳහා රජයේ සහභාගිත්වය රුපියල් දශ ලක්ෂ 63.9කි.

### 5. අභ්‍යන්තර ධීවර කටයුතු

අභ්‍යන්තර ධීවර සංවර්ධන කටයුතු සඳහා 1990 වර්ෂයේ දී රජයේ ආධාරය ඉවත් කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් 1989 වර්ෂයේ දී ලබාගත් මෙට්‍රික් ටොන් 40,000 වූ ඉහළම මත්ස්‍ය නිෂ්පාදනය 1994 වර්ෂය වන විට මෙට්‍රික් ටොන් 12,000 දක්වා පහළ මට්ටමකට වැටුනි. ගැමි ජනතාවගේ රැකියා අහිමි වීම සහ මන්දපෝෂණය මෙහි ප්‍රතිඵලයක් විය. අභ්‍යන්තර ධීවර කර්මාන්ත සඳහා ආධාර සහ සහයෝගය ලබාදීම වර්තමාන රජයේ ප්‍රධාන ප්‍රතිපත්තියකි.

#### *5.1 මිරිදිය මත්ස්‍ය සංවර්ධන මධ්‍යස්ථාන*

උඩවලවේ සහ දඹුල්ල මිරිදිය මත්ස්‍ය සංවර්ධන මධ්‍යස්ථාන පුනරුත්ථාපනය සඳහා රුපියල් දශ ලක්ෂ 6.13ක් වැයකර ඇත.

#### *5.2 මත්ස්‍ය පැටව් නිෂ්පාදනය සහ මිරිදිය ජලාශ*

උඩවලවේ සහ දඹුල්ල මිරිදිය මත්ස්‍ය සංවර්ධන මධ්‍යස්ථානවල දී දශ ලක්ෂ 7ක ඉන්දියානු කාප් සහ දේශීය කාප් යන වර්ගවල බීජ නිෂ්පාදනය කර මාළු පැටවුන් තෙක් වර්ධනය කරන ලදී. මෙම ප්‍රමාණයෙන් මාළු පැටවුන් 3,50,000ක ප්‍රමාණයක් රත්නපුර, හම්බන්තොට, මොණරාගල සහ මාතලේ යන දිස්ත්‍රික්කවල අභ්‍යන්තර ජලාශ 36 ක ද, බදුල්ල සහ කුරුණෑගල යන දිස්ත්‍රික්කවල සුළු ජලාශ ප්‍රමාණයක ද ව්‍යාප්තකර ඇත. මාතර, රත්නපුර, හම්බන්තොට, මොණරාගල සහ බදුල්ල යන දිස්ත්‍රික්කවල අභ්‍යන්තර ධීවර සංවර්ධන කටයුතු හා සම්බන්ධ සේවක පිරිස් හා තෝරා ගන්නා ලද ගොවි කණ්ඩායම්වල දනීම වර්ධනය කිරීම සඳහා සම්මන්ත්‍රණයක් පවත්වන ලදී.

#### *5.3 ඉස්සන් වගාව*

ඉස්සන් වගාව සඳහා ව්‍යාපෘතීන් 29 කට අවසර පත්‍ර ලබා දී ඇත. මෙයට වඩා විශාලත්වයකින් යුත් ව්‍යාපෘති 06ක් ඇතුළත් වන අතර ඉතිරිය හෙක්ටයාර 4ට වඩා අඩු ව්‍යාපෘති වේ.

මෙම මධ්‍යස්ථාන හෙක්ටයාර් 94 ක් තුළ ව්‍යාප්ත වී ඇත. රැකියා උත්පාදනය 700කි. නිපැයුම මෙට්‍රික් ටොන් 360 ක වැඩිවීමක් බලාපොරොත්තු වේ. මෙයට අමතරව තවත් ඉස්සන් වගාකිරීමේ ව්‍යාපෘතියක් පුත්තලම් දිස්ත්‍රික්කය සඳහා සැලසුම් කර ඇත.

අනුමත කරන ලද ඉස්සන් බෝකිරීමේ ව්‍යාපෘතීන් ගණන 20කි. මෙමගින් වර්ෂයකට ඉස්සන් පැටවුන් දශ ලක්ෂ 298 ක් ලබාගැනීමට හා පුද්ගලයන් 150කට රැකියා සැපයීමට ද බලාපොරොත්තු වේ. බලාපොරොත්තු නිෂ්පාදන වටිනාකම රුපියල් දශ ලක්ෂ 150කි.

#### *5.4 වෙනත් ප්‍රතිපත්තිමය ක්‍රියා මාර්ග*


කඩින්කඩ දකුණු පළාතේ කෙරිගෙන යන ධීවර කටයුතු තහනම් කිරීම, සප්‍රාණි ජලජීවීන් ආනයනය කිරීමේ නීති රීති සකස් කිරීම සහ පරණ ධීවර හා ජලජ සම්පත් පනත වෙනුවට අළුත් ධීවර හා ජලජ සම්පත් පනත සකස් කිරීම, නිරීක්ෂණයට පාත්‍ර වූ කාල පරිච්ඡේදය තුළ කෙරෙමින් තිබුණු අනෙක් ප්‍රතිපත්තිමය ක්‍රියාවන් අතර විය.

### අ (V) පශු සම්පත් අංශය

#### 1. නිෂ්පාදනය

කිරි නිෂ්පාදන කර්මාන්තය දියුණු කිරීම පශු සම්පත් අංශයේ විශේෂ ප්‍රමුඛතාවයක් දී ඇති ක්‍රියාවලියකි. 1990 දී සහ 1994 තුළ දී ඇති වූ කිරි නිෂ්පාදිත මිල වැඩි කිරීම් නිසා 1989න් පසු එක් රැස් කරන කිරි ප්‍රමාණයෙහි පැහැදිලි වැඩිවීමක් පෙන්නුම් කර ඇති අතර, 1994 දී වාර්තාගත වැඩි වීමක් දක්නට ඇත. කෙසේ වුවත් 1980 ගණන්වල මැද භාගයේ සිට දේශීය කිරි ගොවීන්ට ගෙවන කිරි මිලෙහි නියම වටිනාකමෙහි වෙනස් වීමක් සිදු වී නොමැත.

කිරි : කිරි එක්රැස් කිරීමේ ප්‍රවණතා සහ කිරිවල නිෂ්පාදිත මිල ගණන්




මූලාශ්‍රය : පශු සම්පත් සංවර්ධන අමාත්‍යාංශය.
සටහන : 1995 ජනවාරි සිට ජූලි දක්වා පමණයි.

මෙම නිරීක්ෂණයට භාජනය වූ කාලය තුළ බහුල වශයෙන් පෞද්ගලික අංශයේ මැදිහත්වීම මත කෙරෙන කුකුල් පාලන කර්මාන්තය ඉතාමත් දිරිගැන්වෙන සුළු ප්‍රතිඵල පෙන්නුම් කර ඇත. සත්ව ආහාර සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය, අභිජනනය සඳහා සතුන් ආදී දේ ආනයනය කිරීමේ දී තීරුබදු සහන ලබා දීමෙන් කුකුල් පට්ටි පාලනයේ පෞද්ගලික අංශයේ මැදිහත් වීම් තවදුරටත් ඉදිරියට ගෙන යාමට අධාර කර ඇත. මෙම කාලය තුළ කුකුල් පැටවුන් නිපදවන ගොවිපලවල ගණන 46 දක්වා ඉහළ ගොස් ඇති අතර, මසට ඇති කරන පැටවුන් මිලියන 46ක් ද, බිත්තර සඳහා ඇති කරන පැටවුන් මිලියන 25ක් ද බෝ කර ඇත. තවද, බිත්තර සහ මස් නිෂ්පාදනය පැහැදිලි වශයෙන් ම ඉහළ ගොස් ඇති අතර, ඒක පුද්ගල පරිභෝජන ප්‍රමාණය බිත්තර 44.4 සහ මස් කිලෝ ග්‍රෑම් 2.17 දක්වා ද වැඩි වී ඇත.

2. රජයේ ක්‍රියාකාරී සහාය

*2.1 සතුන් බෝ කිරීම සහ පට්ටි සංවර්ධනය*

නිරීක්ෂණ කාලය තුළ දී ආසන්න වශයෙන් කෘතිම සිංචන 93,860ක් සිදු කර ඇත. කිරි ගොවීන්ගේ සේවය වැඩි දියුණු කිරීම සඳහා කෘතිම සිංචන ශිල්ප ක්‍රමය යටතේ තරුණයින් 100ක් පුහුණු කර ඇත. රුපියල් මිලියන 16ක් වටිනා කෘතිම සිංචන උපකරණ මිළ දී ගැනීමට කටයුතු කර ඇත.

වැස්සි පැටවුන් ඇති දැඩි කිරීම සඳහා මාස 30ක කාලයකට ආධාර දීමේ යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක විය. මෙම වැඩ සටහන් ග්‍රාමීය කිරි ගොවීන්ගේ වටිනා වැස්සි පැටවුන් වඳවී යාම වැළැක්වීමට ආධාර වේ. රුපියල් මිලියන 15ක රජයේ ආයෝජනයන් සමග මෙම වැඩ සටහන යටතේ ආධාර ලබන ගොවීන්ගේ සංඛ්‍යාව 5,767 දක්වා ඉහල ගොස් ඇත. බෝ කිරීම හා ඇති කිරීම සඳහා බෙදා දෙනු ලබන සතුන්ගේ සංඛ්‍යාව ඉහළ ගොස් ඇත. සංඛ්‍යා වශයෙන් පිළිවෙලින් ගොනුන්, ගොන් වස්සන් හා එළදෙනුන් 8,693ක් ද, මී ගවයින්, මී වස්සන් හා මී වැස්සියන් 2,679ක් ද, එළුවන් 17,961ක් ද, බෝ කිරීම සහ මස් සඳහා පිරිමි හා ගැහැණු සූකරයන් 26,109ක් ද, බිත්තර හා මස් සඳහා කුකුළු පැටවුන් මිලියන 13.47ක් ද නිකුත් කර ඇත.

පුධු ගොවීන්ගේ ඉහළ යමින් පවත්නා කුකුළු පැටවුන් සඳහා වූ ඉල්ලුම සපුරා ලීමට මිලියන 3 දක්වා බ්‍රොයිලර් කුකුළු පැටවුන් ද, බිත්තර සඳහා කිකිළි පැටවුන් මිලියන 1.7 දක්වා ද වර්ධනය කිරීමට ධාරිතාව ඇති නව බීජෞෂණ යන්ත්‍ර දෙකක් ජාතික පශු සම්පත් මණ්ඩල බීජ රක්තාගාරයන් හි සවි කර ඇත.

*2.2 රෝග මර්ධනය*

කුකුළන් මිලියන 12.1ක් ද, හරකුන් හා මී හරකුන් මිලියන 1.4ක් ද, ඌරන් 33,000ක් ද, පොදු සත්ව රෝග මර්දනය සඳහා එන්නත් කර ඇත.

"ගව වසංගත" රෝගය වැළැක්වීම සඳහා ව්‍යාපෘතියක් දියත් කර ඇත. මේ සඳහා ආහාර හා කෘෂිකර්ම සංවිධානය ඇමරිකානු ඩොලර් මිලියන 0.3කින් ආධාර කර ඇත. එක්සත් ජාතීන්ගේ අන්තර් ජාතික පරමාණු ශක්ති අධිකාරිය කුකුළු අභිජනන ගොවිපලවල රෝග තත්ත්වය පරීක්ෂා කිරීම සඳහා ආධාර ව්‍යාප්ත කර ඇත. එම මුළු ප්‍රදානය මිලියන 10ක් වේ.

*2.3 ගොවි පුහුණුව*

ක්ෂේත්‍ර පශු වෛද්‍යවරුන් විසින් ක්ෂේත්‍ර දින 8,290 ක් සහ අභ්‍යාස පන්ති ද ඊට අමතරව වෙනත් අභ්‍යාස වැඩ සටහන් ද නිරීක්ෂණ කාලය තුළ දී පවත්වා ඇත. මෙම වැඩ සටහන් සඳහා ගොවීන් 1,21,126 ක් සහභාගී වී ඇත.

*2.4 අනුමත සේවක සංඛ්‍යා වර්ධනය*

පශු වෛද්‍යවරුන්ගේ අනුමත සේවක සංඛ්‍යාව නව තනතුරු 116 දක්වා වැඩි කර ඇත. මෙම පශු වෛද්‍යවරුන්ගේ සේවය රට පුරා ගැමි ගොවීන්ට ලබා ගැනීමට පහසුකම් සලස්වා ඇත.

*2.5 ශ්‍රී ලංකා-ආසියානු සංවර්ධන බැංකුවේ පශු සම්පත් සංවර්ධන ව්‍යාපෘතිය*

කිරි නිෂ්පාදන අංශය දියුණු කිරීමේ මූලික අරමුණින් ඩොලර් මිලියන 25ක් පමණ ඇස්තමේන්තු කරන ලද ව්‍යාපෘතියක් සඳහා මෙම නිරීක්ෂණ කාලය තුළ දී සාකච්ඡා පැවැත්වෙමින් පවතී.

(ආ) කර්මාන්ත සංවර්ධනය

1. හැඳින්වීම

ශ්‍රී ලංකාවේ අනාගත සංවර්ධනය ගැන සලකා බැලීමේ දී, නිෂ්පාදන ශක්තිය සහ රැකියා අවස්ථා සීඝ්‍රයෙන් වැඩි කිරීම සඳහා උපරිම දායකත්වයක් ලබා දිය හැකි අංශය වශයෙන් කර්මාන්ත අංශය සැලකිය හැක. මේ තත්ත්වය ළඟා කරගත හැක්කේ, විවෘත, නිදහස් සහ ස්ථාවර ආර්ථිකයක් සකස් කර ගැනීම තුළින් පමණකි.

2. සංවර්ධන ඉලක්ක සහ ප්‍රතිපත්ති

1995 ජනවාරි මස ඉදිරිපත් කරන ලද නව රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ කර්මාන්ත සංවර්ධනය සම්බන්ධයෙන් එන ප්‍රතිපත්ති රාමුවේ පැතිකඩ පහත දැක්වේ.

(අ) අපගේ ආර්ථික ප්‍රතිපත්තිය ආසියාවේ ඉහල මට්ටමක වර්ධනයක් ලබමින් ක්‍රියාත්මක වන ආර්ථිකයන් ලබා ඇති අත්දැකීම් පදනම් කොට සකසා ගත් එකකි. උද්ධමනය සහ පොළී අනුපාත අඩු කිරීමට තුඩු දෙන සාර්ව ආර්ථික ස්ථායීතාවයක් ඇති කිරීම තුළින් පරිසරයට හිතකර සහ තිරසාර කාර්මික වර්ධනයක් සඳහා ක්‍රියාකරනු ඇත. මෙම තත්වයන් වඩාත් විවෘත වෙළඳ ක්‍රමයක්

හා නම්‍යශීලී විනිමය අනුපාතයක් සමඟ එක්වූ විට, බෙහෙවින් ප්‍රාණවත්ව ක්‍රියාත්මක වන්නා වූ, ජාත්‍යන්තර වශයෙන් සාර්ථකව තරඟකාරී වූ ත්, අපනයනයට යොමු වූ හා විවිධාංගීකරණයට පත් කරවන සුලුවූත්, කාර්මික අංශයක් බිහිවනු ඇත. එය වඩ වඩාත් තාක්ෂණික නවීකරණයට ද භාජනය වනු ඇත.

(ආ) අපගේ රජය විවෘත හා ඉතාමත් පැහැදිලි නීතිමය රාමුවක් හා වෙළඳ පොලට හිතකර ආයෝජන වාතාවරණයක් පෞද්ගලික අංශයට සපයා දෙනු ඇත. අවශ්‍යතා සැපයීමට වෙළඳපොල පැහැදිලිවම අසමත් වූ ක්ෂේත්‍රයන්ට පමණක් රජයේ මැදිහත් වීම සීමා කෙරෙනු ඇත.

(ඇ) අකාර්යක්ෂම කර්මාන්ත ආරක්ෂා කිරීමේ ප්‍රතිපත්තිය සීඝ්‍ර හා ස්ථාවර කර්මාන්ත සංවර්ධනයකට හෝ සමාජ සාධාරණත්වයට දායක නොවේ. චීනය හා වියට්නාමය ඇතුළු වේගවත් වර්ධනයෙන් යුත් ආසියාතික ආර්ථිකයන් විසින් එබඳු ප්‍රතිපත්ති ප්‍රතික්ෂේප කර තිබේ.

(ඈ) මේ ක්ෂේත්‍රයේ සුදුසු වෙනස්කම් ඇති කිරීමටත්, වඩාත් සරල සහ විනිවිද පෙනෙන දිරි ගැන්වීම් ක්‍රමයක් හඳුන්වා දීමටත් ආණ්ඩුව පියවර ගන්නවා ඇත. ඒ මගින්, දැනට ක්‍රියාත්මක වන නිදහස් වෙළඳ ප්‍රතිපත්තියේම අංගයක් වශයෙන්, දූෂණය සහ ආකාර්යක්ෂමතාවය පිටු දැකීමට හැකිවේ.

(ඉ) පුළුල් ලෙස පැතිරෙන කාර්මිකකරණයේත්, සේවා නියුක්ති අවකාශ වර්ධනය වීමේත්, ආධාරකයක් වන කුඩා සහ මධ්‍ය පරිමාණයේ කර්මාන්ත අංශයක් පිහිටුවීමට ආණ්ඩුව ආධාර කරනු ඇත.

(ඊ) ආර්ථිකයේ හා ශ්‍රම වෙළඳ පොලේ ඉල්ලුම මගින් මෙහෙයවන පරිදි වෘත්තීය අධ්‍යාපන ක්‍රමය පුළුල් ලෙස ප්‍රතිසංවිධානය කෙරෙනු ඇත. එසේ කිරීමේ දී, අනාගත සේවායෝජකයන් වන පෞද්ගලික අංශයේ සහයෝගය ද ලබා ගැනේ. එමෙන්ම නිපුණතා පුහුණුව ලබා ගැනීම අරමුණු කර ගත් සාර්ථක වෘත්තීය අධ්‍යාපන ක්‍රමයක් ගොඩ නැගීමට නිපුණතා සංවර්ධන අරමුදලක් ද පිහිටුවනු ඇත.

(උ) එමෙන්ම පෞද්ගලික අංශයේ සක්‍රිය සහභාගීත්වය ඇතිව ආණ්ඩුවේ කාර්මික, පර්යේෂණ හා සංවර්ධන ආයතන ඉතා පුළුල් ලෙස ප්‍රතිසංවිධානය කෙරේ.

(ඒ) ප්‍රාදේශීය සංවර්ධනයේ අරමුණ ඇතිව, පරිසරයට හානි නොපමුණුවන කුඩා ප්‍රමාණයේ කර්මාන්ත ග්‍රාමීය ප්‍රදේශවල පිහිටු වීමට ආණ්ඩුව දිරි දෙනු ඇත. මේ ප්‍රදේශවල පෞද්ගලික ආයෝජන දිරි ගැන්වෙන පරිදි යටිතල පහසුකම් ද වර්ධනය කරන්නෙමු.

(ඔ) කෘෂිකර්මය පදනම් කොටගත් කර්මාන්ත උනන්දු කරවීමටත්, නිමි කෘෂි භාණ්ඩ නිෂ්පාදනය කිරීමටත්, ආණ්ඩුව ප්‍රමුඛතාවයක් ලබා දෙයි.

## 3. කර්මාන්ත අංශයේ ප්‍රගතිය

### *3.1 කාර්මික වර්ධනය සහ විවිධාංගීකරණය*

1994 වර්ෂයේ ප්‍රථම භාගය හා සැසැඳීමේ දී 1995 වර්ෂයේ නිමැවුමේ වැඩිවීම 8% කි. පුද්ගලික අංශයේ නිෂ්පාදන වැඩිවීම 12% කි. සාම්ප්‍රදායික උප අංශයන් වන රෙදිපිළි හා ඇඟලුම්, සම් භාණ්ඩ, ආහාරපාන, දුම්කොළ, දැව හා දැව නිෂ්පාදන සතුටුදායක වර්ධනයක් වාර්තා වන අතර නව නිර්යාත මත පදනම් වූ නිෂ්පාදන වන ස්වර්ණාභරණ, යාන්ත්‍රික, විදුලි සහ රසායනික නිෂ්පාදන වල ද විශාල දියුණුවක් දක්නට ඇත.

### *3.2 කාර්මික අපනයන*

1994 වර්ෂයේ මුල් අටමාසය, 1995 එම කාලය හා සසඳන විට කාර්මික අපනයන රුපියල් බිලියන 74 සිට රුපියල් බිලියන 93 දක්වා 25% කට ආසන්න වර්ධනයක් පෙන්නුම් කරයි. (සටහන 3 ආ 1)

සටහන 3 ආ 1

**තෝරාගත් කාර්මික හා ඛනිජ අපනයනයන්**

(රුපියල් මිලියන)

| ද්‍රව්‍ය | ජනවාරි– අගෝස්තු 1994 | ජනවාරි– අගෝස්තු 1995 | % වෙනස්වීම |
|---|---|---|---|
| නිෂ්පාදිතයන් | | | |
| *1. ආහාරපාන සහ දුම්කොළ | 2.6 | 3.2 | 25.9 |
| *2. රෙදිපිළි හා ඇඟලුම් | 48.4 | 40.6 | 25.1 |
| *3. රසායනික නිෂ්පාදිත | 1.3 | 1.7 | 31.4 |
| 4. ඛනිජ තෙල් නිෂ්පාදිත | 2.5 | 2.6 | 1.9 |
| 5. සම්භාණ්ඩ, රබර්, කඩදාසි, ලී සහ පිඟන් භාණ්ඩ | 10.8 | 13.6 | 25.5 |
| *6. යන්ත්‍රසූත්‍ර, කාර්මික සහ විදුලි උපකරණ | 2.9 | 3.9 | 36.2 |
| *7. ස්වර්ණාභරණ | 0.5 | 1.1 | 84.6 |
| 8. දියමන්ති | 4.2 | 4.8 | 14.3 |
| 9. වෙනත් | 0.8 | 1.0 | 29.1 |
| මුළු නිෂ්පාදිතයන් | 74.1 | 92.5 | 24.8 |

* වැඩි දියුණුවක් සටහන් වී ඇති අංශ.

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව.

*3.3 රැකීරක්ෂා*

1995 වර්ෂයේ පළමු කාර්තුව වන විට කැණීම් හා නිෂ්පාදන අංශයේ රැකියාවල නියුක්ත වූවන්ගේ සංඛ්‍යාව 9,20,000 දක්වා වැඩිවී ඇත. එය 1994 වර්ෂයේ දෙවැනි කාර්තුව හා සසඳන විට 20% ක වැඩිවීමක් විය.

4. රජයේ ක්‍රියාකාරි සහාය

*4.1 ප්‍රාදේශීය කර්මාන්ත සංවර්ධනය*

පෞද්ගලික අංශයේ ආයෝජන සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සැපයීම පිණිස කර්මාන්ත සංවර්ධන අමාත්‍යාංශය විසින් "කාර්මික ජනපද සංවර්ධනය" සඳහා වැඩ සටහනක් දියත් කර තිබේ. කොළඹ සහ කොළඹ අවට ඇති තදබදය නිසා නිවාස, ඉඩම්, පරිසරය, සෞඛ්‍ය පහසුකම් ආදියට ඇතිවී තිබෙන පීඩනය අඩු කිරීමට මෙම ජනපද ඈත ප්‍රදේශවල ව්‍යාප්ත කරනු ඇත. පරිසරයට හිතකර සංවර්ධනයකට ගැලපෙන පරිදි එය සිදුකරනු ඇත.

කාර්මික ජනපද වැඩ සටහන යටතේ රුපියල් බිලියන 2 ක පමණ වියදමින් අන්තර් ජාතික මට්ටමට සැසඳෙන කාර්මික ජනපද දෙකක් ඉදි කරනු ඇත.

සීතාවක කාර්මික ජනපදය : අක්කර 400 කින් සමන්විත මෙහි කර්මාන්ත ඒකක 70 ක් සඳහා පහසුකම් සැපයේ. එමගින් සෘජු රැකියා 20,000 ක් උත්පාදනය වන අතර, වක්‍රව සැපයෙන රැකියා අවස්ථා සංඛ්‍යාව 40,000 ක් පමණ වේ.

ජනාධිපති කාර්යාලය
පුස්තකාලය

මැණික් හා ස්වර්ණාභරණ, රබර් පදනම් කරගත් කර්මාන්ත, ආහාර සැකසීම, රෙදිපිළි සහ සළාක රහිත ඇහලුම් සහ වෙනත් ලුහු ඉංජිනේරුමය කර්මාන්ත ආදී විවිධ වර්ගවල කර්මාන්ත මෙහි ස්ථාපනය කෙරේ.

කටාන කාර්මික ජනපදය : අක්කර 200 කින් යුත් මෙහි කර්මාන්ත ඒකක 40 ක් සඳහා පහසුකම් සැපයේ. මෙයින් සෘජු රැකියා 8,000 ක් ද වක්‍රව රැකියා අවස්ථා 16,000 ක් පමණ ද ඇති කෙරේ.

කර්මාන්ත වර්ග නම් බර යන්ත්‍ර, විද්‍යුත් උපකරණ, පිරිමි ශ්‍රම බලකායට විශේෂිත වූ එකලස්කළ ලෝහ වැනි කර්මාන්තයනුත්ය.

II. තවත් ප්‍රාදේශීය මට්ටමේ කර්මාන්ත භූමි භාග 19 ක් සඳහා ස්ථාන හඳුනා ගෙන ඇති අතර, ඒවායේ සංවර්ධන කටයුතු පෞද්ගලික අංශය මගින් සිදු කරනු ලැබේ. කර්මාන්ත ජනපද භූමිය දක්වන සීමාව තෙක් පමණක් යටිතල පහසුකම් රජය මගින් සපයනු ලැබේ. 1995 වසර අවසානයේ මින් කීපයක සංවර්ධන කටයුතු ආරම්භ කරනු ඇති අතර, 1996 වර්ෂයේ දී කළුතර, මාතලේ, තඹුත්තේගම සහ ආරච්චිකට්ටුව කාර්මික ජනපදවල වැඩ ආරම්භ කරනු ඇත.

දැනට හඳුනාගෙන ඇති කාර්මික ජනපද සඳහා වන භූමිභාග

| දිස්ත්‍රික්ක | ප්‍රදේශීය ලේකම් කොට්ඨාශය | ඉඩම් ප්‍රමාණය | ඉඩමේ නම |
|---|---|---|---|
| ගම්පහ | මිනුවන්ගොඩ | 5.6 හෙක්ටයාර් | වල්ජාපාල වත්ත |
| හම්බන්තොට | අම්බලන්තොඩ | 37 හෙක්ටයාර් | ලුනමකන්ද |
| හම්බන්තොට | කටුවාන | 20 හෙක්ටයාර් | මිද්දෙනිය |
| අනුරාධපුර | පලුගස්වැව | 75 හෙක්ටයාර් | හබරණ රජයේ ඉඩම |
| අනුරාධපුර | තඹුත්තේගම | 17 හෙක්ටයාර් | මහවැලි ඉඩමක් |
| අනුරාධපුර | ඉපලෝගම | 4 හෙක්ටයාර් | සේනපුර |
| අනුරාධපුර | තලාව | 37 හෙක්ටයාර් | අමුණුකොලේ |
| කළුතර | කළුතර | 20 හෙක්ටයාර් | පුලටන් වත්ත |
| ගාල්ල | කරන්දෙණිය | 20 හෙක්ටයාර් | ඌරගස්මන් හන්දිය රජයේ ඉඩම |
| මාතලේ | මාතලේ | 50 හෙක්ටයාර් | නාලන්ද වත්ත |
| මාතර | වැලිපිටිය | 64 හෙක්ටයාර් | උඩුකාව ලංගම ඉඩම |
| බදුල්ල | රිදිමාලියැද්ද | 30 හෙක්ටයාර් | වියානි කඳවුර |
| මොණරාගල | බුත්තල | 18 හෙක්ටයාර් | රජයේ ඉඩම |
| මොණරාගල | බිබිලේ | 26 හෙක්ටයාර් | පිටකුඹුර රජයේ ඉඩම |
| පුත්තලම | ආරච්චිකට්ටුව | 27 හෙක්ටයාර් | මානාවේරිය |
| පුත්තලම | ආරච්චිකට්ටුව | 27 හෙක්ටයාර් | තබන්කැලේ |
| පුත්තලම | ආරච්චිකට්ටුව | 75 හෙක්ටයාර් | සාන්ත මාටින් වත්ත |

4.2 *රෙදිපිළි ඇඟලුම් කර්මාන්තය සඳහා මිනිස්බල පුහුණුව*

මෙම කර්මාන්තයට මිනිස්බල පුහුණු කිරීම්, ඒ පිළිබඳ විශේෂඥ ආයතන දෙකක් මගින් සිදු කෙරේ.

ඇඟලුම් කර්මාන්ත අභ්‍යාස ආයතනය (CITI) සහ රෙදි පිළි පුහුණු හා සේවා මධ්‍යස්ථානය (TTSC) යන ආයතන දෙක මගින් පසුගිය වර්ෂය තුළ පුද්ගලයින් 2,000 කට අධික සංඛ්‍යාවක් පුහුණු කරන ලදී. තරඟකාරී වෙළඳපොලෙහි රැඳී සිටීමට නම් රෙදිපිළි අංශයේ තත්ත්වය හා ඵලදායිතාවය දියුණු කිරීම ඉතා වැදගත්වන හෙයින් මේ පුහුණු ආයතන වෙළඳපලේ අවශ්‍යතාවයන්ට ගැලපෙන අයුරින් තත්ත්වයෙන් උසස් කිරීම කළ යුතුය. රෙදිපිළි සහ ඇඟලුම් කර්මාන්තයේ නියුක්ත මෙම පුහුණු ආයතන දෙක වැඩි දියුණු කිරීම සඳහා ජපන් ජාත්‍යන්තර සහයෝගිතා ආයතනය (JICA) ආධාර ලබාගැනීමට රජය විසින් කටයුතු සලසා ඇත. ඒ අනුව පස් අවුරුදු කාර්මික සහයෝගීතා ව්‍යාපෘතියක් 1996 දී ආරම්භ කිරීමට නියමිතය..

### 4.3 කුඩා සහ මධ්‍යම පරිමාණ කර්මාන්ත

රැකියා උත්පාදන ප්‍රතිපත්තියට දායක වනු පිණිස කාර්යක්‍ෂම ඒකක ඇතිකිරීමට හැකි වන පරිදි කුඩා හා මධ්‍යම පරිමාණ කර්මාන්ත සඳහා ආධාර සපයනු ලැබේ. එම අංශය මගින් ඉදිරි වර්ෂ පහ සඳහා රැකියා අවස්ථා 250,000 ක්·ඇති කිරීමට ඇස්තමේන්තු කර ඇත. ලෝක බැංකු ආධාර යටතේ ක්‍රියාත්මක වන ණය යෝජනා ක්‍රම යටතේ මේ දක්වා රුපියල් මිලියන 3,396 ක් ලබාගෙන ඇති අතර, 1994 අවසානය වන විට ව්‍යාපෘති 6,461 ක් ස්ථාපිත කර ඇත. නිෂ්පාදන ශිල්පක්‍රම, නිෂ්පාදනවල ගුණාත්මක භාවය, ශ්‍රම පුහුණුව, අලෙවිය සහ මූල්‍යකරණය සම්බන්ධ ගැටළු ආදිය නිරාකරණය කිරීම සඳහා ප්‍රායෝගික උපාය මාර්ග හඳුන්වාදෙන අතර, වෙළඳාම, උප කොන්ත්‍රාත් ක්‍රම භාවිතය ආදී අංශ පිළිබඳ උපදෙස් සහ මග පෙන්වීම් ද කරනු ලැබේ.

ආයෝජන මණ්ඩලයේ ව්‍යාපෘති, වෙළඳ සමාගම් සහ නවීන හා මහා පරිමාණ කාර්මික සංවිධාන සමග කුඩා සහ මධ්‍යම පරිමාණ කර්මාන්ත අතර, සුදුසු පරිදි සම්බන්ධතා ඇති කිරීමට අනුබල දෙනු ලැබේ. දැනට පවත්නා වෙළඳ සහ සංවර්ධන මූල්‍ය ආයතන ව්‍යුහය තුළ සුළු ව්‍යාපාර ඇතුළුව කුඩා හා මධ්‍යම පරිමාණයේ කර්මාන්ත සඳහා විශේෂ ණය පහසුකම් හෝ ණය ලබාගැනීමේ මාර්ග පිළියෙල කරනු ලැබේ. ප්‍රාග්ධන වියදම් අඩු කිරීම සහ වාණිජ ණය ලබාගැනීම සඳහා සුරැකුම් ඉදිරිපත් කළ නොහැකි වන කුඩා හා මධ්‍යම ප්‍රමාණ කර්මාන්තකරුවන් සඳහා උපකාර කිරීමේ අරමුණින් කොටස් ප්‍රාග්ධන අරමුදලක් පිහිටුවීමට කටයුතු ආරම්භ කර තිබේ.

සටහන 3 ආ 2

සුළු හා මධ්‍යම පරිමාණයේ IV වන ව්‍යාපෘතියේ ප්‍රගතිය

| | අගෝස්තු 93–94 | අගෝස්තු 94–95 | % වැඩිවීම |
|---|---|---|---|
| 1. ව්‍යාපෘති ගණන | 1,827 | 1,183 | – |
| 2. ආයෝජන (රුපි. මිලියන) | 4,787.33 | 5,064.86 | 5.8 |
| 3. උප ණය (රුපි. මිලියන) | 929.27 | 1,055.27 | 13.5 |
| 4. රැකියා අවස්ථාවන් (ගණන) | 8,544 | 7,311 | – |

මූලය : ජාතික සංවර්ධන බැංකුව.

### (ඇ) වෙළඳාම සහ සංචාරක කර්මාන්තය

1. හැඳින්වීම

පුළුල් ජාත්‍යන්තර වෙළඳ අංශයකින් යුත් විවෘත ආර්ථිකයෙහි පවත්නා බැවින්, බාහිර හා අභ්‍යන්තර යන දෙවර්ගයටම අයත් නිදහස් වෙළඳ ප්‍රවාහයක් ප්‍රවර්ධනය කිරීම ශ්‍රී ලංකාවේ සංවර්ධන ක්‍රියාවලියේ වැදගත් අරමුණක් සේ සැලකේ. වෙළඳ ප්‍රතිපත්ති විශේෂයෙන් තීරු බදු, වෙළඳ බලපත්, සලාක, වෙළඳ සංවිධාන, ජාත්‍යන්තර හා ප්‍රාදේශීය වෙළඳ ගිවිසුම් වැනි දෑ හා සම්බන්ධ වන බැවින් එය දේශීය නිෂ්පාදිතය, මිල මට්ටම් සහ ආදායම් ආදිය කෙරෙහි වැදගත්කමක් උසුලනු ඇත.

2. ප්‍රතිපත්ති හා ගැටළු (විදේශ වෙළඳාම)

නිදහස් වෙළඳ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක වීමේ පදනම මත පසුගිය වර්ෂය තුළ රටේ වර්ධන උපාය මාර්ග පහත සඳහන් අයුරින් ක්‍රියාත්මක විය.

- විදේශ වෙළඳාම බලපත්‍ර මගින් පාලනය කිරීම අඩු මට්ටමකින් සිදුකිරීම.
- තීරු බදු ව්‍යුහය තාර්කිකරණය කිරීම.
- නම්‍යශීලී විදේශ විනිමය අනුපාත ක්‍රමයකට යොමුවීම.
- ආනයන අපනයන ක්‍රියාවලිය ලිහිල් කිරීම.

බලපත්‍ර මගින් අපනයන පාලනය බලපෑමට අංශ හතරක් සඳහා පමණි.

- කොරල් සහ සිප්පි කටු.
- දැව හා ආශ්‍රිත නිෂ්පාදිත.
- ඇත් දළ හා ඇත් දළ වලින් නිෂ්පාදිත දෑ.
- 1945 ට පෙර ලියාපදිංචි කළ මෝටර් වාහන.

ආනයනය කරනු ලබන ද්‍රව්‍ය 280 ක් සඳහා ආනයන බලපත්‍ර ක්‍රියාත්මකවීම තවදුරටත් සිදුවෙන අතර, තීරු බදු ව්‍යුහය 35%, 20% සහ 10% වශයෙන් මට්ටම් 3ක් දක්වා අඩු කරන ලදී.

මෙම ප්‍රතිපත්තියේ මධ්‍යකාලීන අරමුණ වනුයේ සියළුම කාර්මික ආනයන සඳහා වැඩි තරඟකාරීත්වයක් ඇති කිරීමයි. තවද ජාත්‍යන්තර වෙළඳාමෙන් වාසි ලබාගැනීම සඳහා ශ්‍රී ලංකාව උරුගුවේ වටය අවසන් ව්‍යවස්ථාව සහ ලෝක වෙළඳ සංවිධානයේ 1994 ගිවිසුම ද අනුමත කරන ලදී.

රෙදි පිළි හා ඇඟලුම්, නිදහස් වෙළඳාම/ලෝ. වෙ. සං. (WTO )/තී. බ. හා වෙ. ස. පො. ස. (GATT) / සමඟ ඒකාබද්ධවීම සම්බන්ධයෙන් පැන නැගිය හැකි ගැටළු රජය විසින් අධ්‍යනය කරගෙන යනු ලැබේ. ලෝක වෙළඳ සංවිධානයේ අනර්ථකාරී භාණ්ඩ පිවිසීම වැළැක්වීමේ සම්මුතිය ක්‍රියාත්මක කිරීම පිළිබඳව රජයේ අවධානය යොමු වී ඇති අතර, ගිවිසුම තුළ පැහැදිලිව පෙන්වන අනර්ථකාරී භාණ්ඩ මගින් දේශීය කර්මාන්තවලට වන ද්‍රව්‍යමය හානි වළක්වාලීම හෝ පාඩු පිරිමසා ගැනීම සඳහා විශේෂ නීති මාලාවක අවශ්‍යතාව පිළිබඳව ද රජය අධ්‍යයනය කරයි.

ප්‍රාදේශීය ආර්ථික සහයෝගීතාව සහ වෙළඳාම වර්ධනය කිරීමේ දර්ශනයක් සමඟ ශ්‍රී ලංකාව දකුණු ආසියාතික අනුග්‍රහ පූර්වක වෙළඳ සංවිධානයට සහභාගී වෙයි. සාමාජික රටවල් සඳහා ප්‍රදානයන් ලැබීමට ඒකක 226 න් යුත් ජාතික පිළිවෙතක් සඳහා 1995 දී අනුමැතිය දෙන ලදී. අපනයන ව්‍යුහය විවිධාංගීකරණය සඳහා තීරුබදු සහනක්‍රම, නිෂ්පාදන සඳහා බැඳුම්කර, තීරුබදු රහිත යන්ත්‍ර සූත්‍ර නිදහස් කිරීම්, වැනි මූල්‍ය දිරිගැන්වීම් ක්‍රම තව දුරටත් ක්‍රියාත්මක කෙරේ.

3. අපනයන සංවර්ධන මණ්ඩලයේ ක්‍රියාකාරකම්

රජය විසින් අපනයන වර්ධනය සඳහා සහ 10%ක අපනයන වර්ධන ඉලක්කය ළඟාකර ගැනීම සඳහා "අපනයන දශකය තුළ" විවිධ පියවරයන් ගනු ලැබිණි.

අපනයන සංවර්ධන මණ්ඩලය විසින් (1996 – 2000 දක්වා) ජාතික අපනයන සංවර්ධන සැලසුම සකස් කිරීම.

විදේශයන්හි පිහිටි ශ්‍රී ලංකා තානාපති කාර්යාලයන්හි කාර්මික නිෂ්පාදන ප්‍රදර්ශන සඳහා අපනයන සංවර්ධන කවුළු වැඩසටහන් දියත් කිරීම.

ලියකියවිලි පිළිබඳ සියලු අවශ්‍යතාවයන් එක ස්ථානයකදී ඉටුකරගත හැකිවන පරිදි වෙළඳ මධ්‍යස්ථාන ඇති කරන ලදී. වැඩ සටහන් 12ක් සඳහා මූල්‍ය ආධාර වශයෙන් රුපියල් මිලියන 35 ක් ප්‍රදානය කරන ලදී. එවැනි ආධාර ලබාදීම මගින් බලාපොරොත්තු වන අරමුණ වන්නේ –

- කළමනාකරණ හැකියාවන් වර්ධනය කිරීම.
- වෙළඳාම සහ නිෂ්පාදනයේ සංවර්ධනය.
- වෙළඳ සල්පිල් හා ප්‍රදර්ශන සඳහා සහභාගීවීම.
- අපනයන ප්‍රවර්ධනය සහ අපනයන වෙළඳාමේ සමාගම් සඳහා විදේශ කාර්යාලයන් පිහිටුවීම.
- අපනයන මූල්කරගත් ව්‍යාපෘති සඳහා කොටස් ප්‍රාග්ධන දායකත්වය.

අපනයන සංවර්ධන මණ්ඩලය මගින් තෝරාගත් නිෂ්පාදන සඳහා ඒකාබද්ධ සංවර්ධන වැඩ සටහන් ඇති කිරීම මගින් නිෂ්පාදන කළමනාකරණයන්ගේ විවිධ දෘෂ්ටීන් අවබෝධ කර ගැනීමට ප්‍රයත්න දරන ලදී. නිදසුන් වශයෙන් ජපන් වෙළඳපල සඳහා වූ මෝස්තර සකස් කිරීමෙන් ටෝකියෝ ස්වර්ණාභරණ ප්‍රදර්ශනයෙන් රුපියල් මිලියන 20ක ඇණවුම් ලැබීම සඳහන් කළ හැකිය.

නව සංකල්පයක් වශයෙන් ප්‍රාදේශීය මට්ටමෙන් අපනයන සංවර්ධනය සඳහා වැඩ සටහනක් දියත්කර ඇත. රුපියල් මිලියන 4ක වියදමින් මධ්‍යම, වයඹ හා දකුණු පළාත්වල කාර්යාල පිහිටුවා ඇති අතර, හඳුනාගත් ආයතන 200 කට අපනයන අවස්ථාවන් ඇතිකර දී තිබේ.

1994 ඔක්තෝබර් මස දී එක්ස්පෝ ( EXPO ) 94 වෙළඳ ප්‍රදර්ශනය පැවැත්වීමෙන් රුපියල් මිලියන 720 ක් වටිනා අපනයන ආදායමක් උත්පාදනය කර ගැනීමට හැකිවිය.

4. අභ්‍යන්තර වෙළඳාම

අභ්‍යන්තර වෙළඳ ප්‍රතිපත්තියක් එළිදැක්වීමේ ප්‍රධානතම අරමුණ වනුයේ පාරිභෝගිකයා ආරක්ෂා කිරීම සහතික වීමකි. අභ්‍යන්තර වෙළඳ දෙපාර්තමේන්තුව පාරිභෝගික සේවාවන් උසස් මට්ටමකට ගෙන ඒමට වැඩි අවධානයක් යොමුකර තිබේ.

*4.1 සමුපකාර තොග වෙළඳ සංස්ථාවේ ක්‍රියාකාරකම්*

අභ්‍යන්තර වෙළඳ ජාලය වර්ධනය කිරීම මගින් පාරිභෝගික සුභ සාධනය සඳහා සමුපකාර තොග වෙළඳ සංස්ථාවේ ක්‍රියාකාරකම් පුළුල් කරන ලදී. ඒ සම්බන්ධයෙන් පහත සඳහන් වැඩ සටහන් ක්‍රියාත්මක කරන ලදී.

*4.2 සිල්ලර වෙළඳ සේවාව*

(අ) නව සිල්ලර වෙළඳ සැල් තෝරාගත් නගර මධ්‍යයේ පිහිටුවීම.
උදා : වේයන්ගොඩ , බත්තර මුල්ල, වෙන්නප්පුව, හක්මන, කොග්ගල සහ නාවල.

(ආ) පැවති සිල්ලර වෙළඳසැල් රුපියල් මිලියන 1.3 ක වියදමක් දරා තම රටටම ඔබින පරිදි නවීකරණය කිරීම.

(ඇ) හම්බන්තොට ප්‍රදේශයේ නැවත සිල්ලර වෙළඳසැල් ආරම්භ කිරීම.

*4.3 වරලත් අලෙවි නියෝජිත ව්‍යාපෘතිය*

මේ යටතේ වරලත් පෞද්ගලික නියෝජිත අලෙවි සැල් 6,369 ක් ද, සමුපකාර ක්ෂේත්‍රයේ වරලත් සමුපකාර අලෙවි හල් 1,528 ක් ද, ස. තො. ස. කීර්තිනාමය යටතේ අලෙවි වරම් ලබා සිටිති. අත්‍යවශ්‍ය පාරිභෝගික භාණ්ඩ සැපයුම් සේවාව ගම් මට්ටම දක්වා පුළුල් කිරීම මෙහි අරමුණ වේ.

*4.4 ස. තො. ස. එළවළු ව්‍යාපෘතිය*

මෙම ව්‍යාපෘතිය මගින් ස.තො.ද එළවළු මිළ දී ගැනීම සඳහා රුපියල් මිලියන 6.4 ක වියදමක් දරා මිළ දී ගැනීම් මධ්‍යස්ථාන 5ක් විවෘතකර ඇත. මෙම එළවළු ව්‍යාපෘතියෙන් අරමුණු දෙකක් අපේක්ෂා කෙරේ. එනම්, ගොවියනට හොඳ මිළක් හා පාරිභෝගික ජනතාවට අළුත් එළවළු සාධාරණ මිළකට මිළ දී ගැනීමේ අවස්ථාව උදාකර දීමත්ය.

*4.5 ඇසුරුම් මධ්‍යස්ථාන*

ස. තො. ස. වරළත් අලෙවි නියෝජිතහල් ව්‍යාපෘතිය මගින් ඉල්ලුම සපුරාලීමේ අරමුණෙන් රුපියල් මිලියන 6.4 ක වියදමක් දරා ඇසුරුම් මධ්‍යස්ථාන දෙකක් රාජගිරිය හා වේයන්ගොඩ යන ප්‍රදේශවල දැනටමත් පිහිටුවා තිබේ.

5. සංචාරක කර්මාන්තය

*5.1 සංචාරක පැමිණීම*

1995 වසරේ මුල් අට මස ඇතුලත සංචාරකයින් 2,81,304 දෙනෙක් මෙරටට පැමිණි අතර, එය 1994 වර්ෂයේ එම කාලයතුළ පැමිණි සංඛ්‍යාව (2,67,189) හා සැසඳු කළ 5% ක් වර්ධනයක් පෙන්නුම් කෙරේ. සංඛ්‍යා ලේඛණවලට අනුව නැගෙනහිර ආසියානු හා මැද පෙරදිග කලාප හැර ලෝකයේ අනෙකුත් ප්‍රධාන කලාපවලින් පැමිණි සංචාරකයින්ගේ ප්‍රමාණය වැඩි වීමක් පෙන්නුම් කෙරේ. (සටහන 3 ඇ 1)

සංචාරක අමාත්‍යාංශය මගින් ඉදිරිපත් කරනු ලැබූ සංචාරක ව්‍යාපාරයේ තියමු සැලැස්මට අනුව පහත සඳහන් වැඩ දැනටමත් ආරම්භ කොට ඇත.

- 1995 වසර තුළ කතරගම, බණ්ඩාරවෙල, නුවරඑළිය, බෙන්තොට, පොළොන්නරුව, හා කළුතර පිහිටි අමාත්‍යාංශයට අයත් සංචාරක නිකේතන වැඩිදියුණු කිරීම.
- බඹරකැලේ නව සංචාරක නිකේතනයක් 1995 අප්‍රේල් මස දී විවෘත කිරීම.
- 1995 වසර තුළ වෙළඳ පොලවල් සඳහා සහභාගීවීමෙන්, සංස්කෘතික සංදර්ශන හා වැඩ මුළු යනාදී කටයුතු මගින් සම්ප්‍රදායික වෙළඳ පොල කටයුතු වර්ධනය කිරීම සඳහා කටයුතු කරන ලදී.

1995 වසර අවසන් වීමට ප්‍රථම ශ්‍රී ලංකා සංචාරක හෝටල් පාසැල් සංකීර්ණයක් ආරම්භ කිරීම සඳහා දැනටමත් සැලසුම් සකස්කර අවසන්ය.

සටහන 3 ඇ 1

සංචාරකයින්ගේ පැමිණීම ප්‍රධාන කලාප අනුව (.000)

| ප්‍රධාන කලාප | ජනවාරි – අගෝස්තු දක්වා | | |
|---|---|---|---|
| | *1994* | *1995* | % වෙනස්වීම |
| උතුරු ඇමරිකාව | 10.4 | 10.7 | 2.8 |
| ලතින් ඇමරිකානු සහ කැරිබියානු රටවල් | 0.3 | 0.4 | 22.8 |
| බටහිර යුරෝපය | 166.5 | 172.1 | 3.4 |
| නැගෙනහිර යුරෝපය | 2.7 | 3.0 | 8.5 |
| අප්‍රිකානු | 0.4 | 0.5 | 16.3 |
| මැද පෙරදිග | 2.7 | 2.4 | 8.0 |
| නැගෙනහිර ආසියාතික | 36.5 | 35.9 | 1.6 |
| දකුණු ආසියාතික | 40.2 | 49.2 | 22.4 |
| ඕස්ට්‍රේලියානු | 7.1 | 6.6 | 6.3 |
| මුළු එකතුව | 267.1 | 281.3 | 5.3 |

මූලය : ශ්‍රී ලංකා සංචාරක මණ්ඩලය.

## 4 පරිච්ඡේදය

# පෞද්ගලික ආයෝජනය සහ රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණය

### 1. හැඳින්වීම

රජයේ ආර්ථික සංවර්ධන උපාය මාර්ගයේ වැදගත් වූ අංශයක් නම්, වර්ධනයේ ප්‍රධාන යන්ත්‍රය ලෙස සැළකෙන පෞද්ගලික අංශය කොටස් කරුවෙක් කරගෙන කටයුතු කිරීමය. ඒ අනුව පුද්ගලික ආයෝජනයන් දිරි ගන්වමින්, රාජ්‍ය ව්‍යවසායයන්හි ඵලදායී අත්‍යවශ්‍ය ප්‍රතිසංස්කරණයන් යොදමින්, දිරි දීමනා සපයමින්, ආධාරක ප්‍රතිපත්ති රාමුවක් සකස් කිරීම එම උපාය මාර්ගයේ ඉහළම තැනක් ගෙන ඇත.

### 2. සංවර්ධන අරමුණු සහ ප්‍රතිපත්ති

මෙම විෂයය ඊට අදාළ වූ ප්‍රතිපත්තිය සහ සම්බන්ධකර පෙන්වීම් වස්, පුද්ගලික ආයෝජන සහ රජයේ ව්‍යවසාය සම්බන්ධයෙන් රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශයන් කිහිපයකම සඳහන් උධෘතයන් පහත දැක්වේ.

(අ) "...... ප්‍රමාණවත් මූලික පහසුකම් පිළිබඳ අවශ්‍යතා සපුරාලීමට අවශ්‍ය සම්පත් ප්‍රමාණය අති විශාල වන බැවින් යටිතල පහසුකම් පිළිබඳ ආයෝජනවලින් සැළකිය යුතු කොටසක් පෞද්ගලික අංශය විසින් කළයුතුව තිබේ. (1994 සැප්තැම්බර් 13)

(ආ) ඉදිකොට ක්‍රියාත්මක කර පවරා දෙන (BOT) සහ ඉදිකොට ක්‍රියාත්මක කර හිමිකර ගන්නා (BOO) පදනම මත විනිවිද පෙනෙන හා ගිණුම් ගත කෙරෙන අගැයීම් සහ පාලන රාමුවක් ඇති වැඩ පිළිවෙලක් යටතේ පුද්ගලික අංශයේ යටිතල ආයෝජනයන් සිදුවනු ඇත. (1994 සැප්තැම්බර් 13)

(ඇ) 1995 වර්ෂය තුළ දී රාජ්‍ය අංශයේ ව්‍යාපාර ප්‍රතිසංස්කරණය කිරීම සඳහා වැඩ සටහනක් ක්‍රියාත්මක කිරීම ඇරඹෙනු ඇත. රාජ්‍ය ආයතන කළමනාකරණය සඳහා පුද්ගලික අංශයට ආරාධනා කෙරෙනු ඇත. එය කරනු ඇත්තේ නිතරම රටේ සේවක කොටස්වල අයිතිවාසිකම් ආරක්ෂා කිරීම අරමුණු කොටගෙන ඒවායේ අයිතිය ආණ්ඩුව වෙත තබා ගනිමිනි.

ප්‍රතිසංස්කරණ ඇතිකිරීමේදී යහපත් කළමනාකරණය හා එම ව්‍යාපාරවල කළමනාකරණය භාරගන්නා පෞද්ගලික අංශයට ලැබිය යුතු ප්‍රතිලාභ තත්වයන්ද ආරක්ෂා වන අන්දමින් ක්‍රියා කරනු ලැබේ. (1995 ජනවාරි 6)

(ඈ) රාජ්‍ය ව්‍යාපාර පෞද්ගලිකකරණය කිරීමේ ප්‍රතිඵලය ලෙස සිදුවනු ඇත්තේ රාජ්‍ය අංශයේ අත්‍යවශ්‍ය ආයෝජනයන් සඳහා වන සම්පත් අරපිරිමැසීම සහ වර්ධනය වීම පමණක් නොවේ. ඒ මගින් පෞද්ගලිකකරණය කළ අංශවල මෙන්ම සමස්තයක් වශයෙන් මුළු මහත් ආර්ථිකය තුළද ආයෝජන, සේවා නියුක්තිය සහ සේවාවන්හි ද ගුණාත්මක අගයේ වැඩි වර්ධනයක් සිදුවනු ඇත. (1995 ජනවාරි 6)

### 3. ආයතනික සංවර්ධනය

ආයෝජන මණ්ඩලය (BOI), යටිතල සංවර්ධන සහ ආයෝජන මහ ලේකම් කාර්යාලය (SIDI), සුරැකුම් පත් හා විනිමය කොමිසම (SEC) වැනි රාජ්‍ය ආයතන ගණනාවක් වර්තමාන රජය බලයට පත්වන අවධියේ දී පුද්ගලික ආයෝජන පහසුකම් සැපයීමට කටයුතු කරමින් තිබුනි.

## 4. රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ කොමිසම

රාජ්‍ය ව්‍යාපාර ප්‍රතිසංස්කරණ පිළිබඳ විධිමත් කොමිසමක් (PERC) ස්ථාපිත කිරීමට පෙරාතුව රාජ්‍ය ව්‍යාපාර ප්‍රතිසංස්කරණ පිළිබඳ ජනාධිපති කාර්ය සාධන මණ්ඩලයක් පත්කරණු ලැබීම මෙම අවුරුද්දේ මාර්තු මාසයේ ඇතිවූ වැදගත් සිද්ධියක් විය. මෙම කොමිසමට පැවරෙන වගකීම වන්නේ රාජ්‍ය ව්‍යාපාර ප්‍රතිසංස්කරණය සම්බන්ධ විවිධ කටයුතුවල දී ආණ්ඩුවට සහාය වීමය. (PERC) ආයතනය පිහිටුවීමට අවශ්‍ය නීති ප්‍රතිපාදන කෙටුම්පත් දැනට ගැසට් පත්‍රයේ පළකර ඇති අතර නුදුරු කාලයේ දී ඒවා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට නියමිතය.

මෙම කොමිසමේ ප්‍රධාන අරමුණු අතර, රජයේ ආයෝජනයන්හි කාර්යක්ෂමභාවය වැඩි කිරීම, වෙළඳ පල තරඟය ශක්තිමත් කිරීම, දීර්ඝ කාලීන පුද්ගලික ඉතිරි කිරීම සහ විදේශ ආයෝජනයන් අද්දවා ගැනීම මගින් ප්‍රාග්ධන වෙළඳපල වැඩි දියුණු කිරීම, රාජ්‍ය ව්‍යවසාය පදනම පිළිබඳ අයිතිය පුළුල් කිරීම, රාජ්‍ය ණය ආපසු ගෙවීම සඳහා සම්පත් ඒකරාශිකර යෙදවීම සහ රජයේ ප්‍රාග්ධන ආයෝජනය සීමා කරවන බාධක ලිහිල් කිරීම ද වේ. මේ සියල්ල කෙරෙනුයේ විශාල පරිමාණයේ යටිතල පහසුකම් සැපයීම සම්බන්ධයෙන් විශේෂ අවධානයක් ද සහිතවය.

රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ කොමිසමේ (PERC) හි කාර්යයන් :

(අ) රජයේ දේපල/වත්කම් කොටස් වශයෙන් හෝ සම්පූර්ණ වශයෙන් විකිණීම හෝ බදු දීම.
(ආ) සමාගම්වල රජයේ කොටස්, කොටස් වශයෙන් හෝ සම්පූර්ණයෙන් විකිණීම.
(ඇ) තෝරාගත් අංශයන්ට පුද්ගලික සහභාගිත්වය හා තරඟය විවෘත කිරීම.
(ඈ) කොටස් ප්‍රමාණයක් විකිණීම මගින් පුද්ගලික හා රජයේ අංශය අතර කොටස් හිමි සහභාගිත්වය.
(ඉ) කළමනාකරණය, කාර්මික විශේෂඥ උපදෙස්, හෝ අලෙවි ගිවිසුම්.
(ඊ) යටිතල වැනි අංශවල පුද්ගලික අංශයේ සෘජු ආයෝජන.

1995 දී කොමිසම ඉදිරියේ ඇති ඉක්මන්ම කාර්යයන් පුළුල් වශයෙන් අංශ පහක් යටතේ හඳුනාගෙන ඇත.

(අ) රජයේ ඒකාධිකාර සාධාරණ තරඟයකට විවෘත කිරීම.
(ආ) රජයේ ව්‍යවසායයන් ගණනාවක් සම්බන්ධ දැනට කල්ගතවී ඇති ප්‍රතිසංස්කරණයන් සම්පූර්ණ කිරීම.
(ඇ) සමාගම් ගණනාවක රජයේ කොටස් සියල්ල හෝ කොටස් ප්‍රමාණයන් විකිණීම.
(ඈ) රජයේ ඉඩම් සහ දේපල විකිණීම.
(ඉ) මහජන උපයෝගිතා අංශය/යටිතල අංශය/සේවා අංශය සඳහා උපායශීලී සන්ධාන බිහි කිරීම.

## 5. ආයෝජන මණ්ඩලය

ආයෝජන මණ්ඩලයේ ප්‍රධාන කාර්යයන් නම්, "සියළු සේවා එකම සාප්පුවකින් " ගැනීමේ සංකල්පය සැළකිල්ලට ගෙන, අනුමැතිය ලබා ගැනීමේ පිළිවෙලවල් හැකි තරම් සරළ බවට පත් කරවා විදේශ ආයෝජන ප්‍රවාහය රට තුළට ගලා ඒම වඩාත් පහසු කිරීමත්, අවශ්‍ය යටිතල පහසුකම් හා පාලන රාමුවක් සහතික කිරීමත් වේ. වර්තමාන රජයේ කාලය තුළ මෙම ආයතනය ශක්තිමත් කිරීමට පියවර ගත් අතර, 1995 සැප්තැම්බරයේ දී යටිතල සංවර්ධන හා ආයෝජනය මහලේකම් කාර්යාලය ද ආයෝජන මණ්ඩලයට ඈඳන ලද්දේ, ප්‍රතිපත්ති ප්‍රකාශනයේ පොරොන්දු වූ පරිදි, වඩාත් හොඳ කාර්යානුකූල සම්බන්ධීකරණයක් ඇති කිරීම පිණිසය. රජයේ හා පුද්ගලික අංශය එක් වී පිළියෙල කරන විවිධ ස්වරූපී වූ වැඩ පිළිවෙළවල් පිළියෙල කිරීම් හා සාකච්ඡා කිරීම් සම්බන්ධයෙන් අදාළ වගකිවයුතු අමාත්‍යාංශවලට සහාය වීමේ විශේෂ උපදේශක සංවිධානයක් සේ යටිතල සංවර්ධන සහ ආයෝජන මහලේකම් කාර්යාලය වර්ධනය කරනු ලැබේ. ඉදිකොට මෙහෙයවා හිමිකර ගන්නා (BOO) සහ ඉදිකොට මෙහෙයවා පවරා දෙන යෝජනා ක්‍රම සම්බන්ධයෙන් මෙය විශේෂ වේ.

## 6. පසුගිය වර්ෂය තුළ ප්‍රගතිය

(i) *රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණය*

(අ) කොළඹ සීමාසහිත ගෑස් සමාගමේ නිකුත් කළ කොටස් ප්‍රාග්ධනයෙන් 51% ක් රෝයල් ඩච්/ෂෙල් සමාගමට විකිණීම, සම්පූර්ණ කර ඇත. මේ සඳහා ඇ. ඩො. මිලියන 37 ක මිල නියමකර තිබෙන අතර, නව පර්යන්තයක්, නල මාර්ගයක් සහ ඇල්. පී. ගෑස් ගබඩා පහසුකම් සඳහා තවත් ඇ. ඩො. මිලියන 40ක ආයෝජනයක් සඳහා එකඟත්වය ඇති කරගෙන ඇත.

(ii) ප්‍රසිද්ධ ජාත්‍යන්තර ගුවන් සේවාකරුවෙක් සමඟ උපායශීලී සංවිධානයක් පිහිටුවීමේ අදහසින් 40% ක කොටස් එම සමාගමට ප්‍රදානය කරන අන්දමින් සීමාසහිත එයාර් ලංකා සමාගම ප්‍රතිව්‍යුහගත කිරීම. මේ කාර්ය සඳහා උපදේශක සේවා කැඳවුම් කර ඇත. මේ සඳහා උපදේශක සේවා කාර්ය භාරය, වේස් මැන් හැටන් බැංකුව, සීමත් හෙලයිසන් සහ අයිව්නර් (ඇ. ඒ. ජ.) සහ මහජන මර්චන්ට් බැංකුව යන සමාගම්වලින් සැදි උපදේශක කණ්ඩායමකට පවරා දී ඇත.

(iii) සීමාසහිත බගවන්තලාව වතු සමාගම සහ සීමාසහිත කොටගල වතු සමාගම සම්බන්ධ අවුරුදු 50 කල්බදු අයිතිය විකිණීම සඳහා වෙළඳ පලට ඉදිරිපත් කිරීමත් සමඟ ප්‍රාදේශීය වතු සමාගම් වල බහුතර අයිතිය, පෞද්ගලික අංශයට පැවරීමේ ක්‍රියාවලිය ආරම්භ විය. මෙම වර්ෂය තුළ, තවත් ප්‍රාදේශීය වතු සමාගම් 8ක් කොළඹ කොටස් වෙළඳ පල මගින් විකිණීම සඳහා සකස් වෙමින් පවතී.

(iv) බහු පාර්ශ්වීය ආධාර ආයතනයක් මගින් සපයා දෙන ලද මූල්‍ය උපදේශකයෙකුගේ උදව් ඇතිව විදුලි සංදේශ අංශය ප්‍රතිව්‍යුහගත කිරීම කරගෙන යනු ලැබේ. මෙම උපදේශ සේවාව මගින් ශ්‍රී ලංකාවේ ජාතික විදුලි සංදේශ කර්මාන්තයෙහි අනාගත අවශ්‍යතා, අවශ්‍ය ආයෝජන සහ පෞද්ගලික අංශය සමග උපායශීලී සංධාන ඇති කර ගැනීම සඳහා ඇති විකල්ප ගැන තොරතුරු රජයට සපයා දෙනු ඇත.

(v) ඔරියන්ට් ලංකා සමාගම පුද්ගලීකකරණය කිරීම : කොළඹ ජාත්‍යන්තර ගුවන් තොටුපලේ තීරුබදු රහිත වෙළඳ සමාගමක් වන මෙහි ජාත්‍යන්තර තීර බදු රහිත ක්‍රියාකරුවෙකුට කොටස්වලින් සියයට 60 ක් අලෙවි කරන අතර, පසුව ඉතිරි කොටස් දේශීය කොටස් වෙළඳ පොලෙහි විකිණීමට සැළසුම් කර තිබේ. ප්‍රථම වාරයේ ඉදිරිපත් කිරීමේ දී රජය මගින් නියම කළ අවම මිළ නොලැබුන නිසා, නැවත වරක් අලෙවිය සඳහා ඉල්ලුම් කැඳවා තිබේ.

(vi) ස්ටැව්කොන් රබර් සමාගමේ නිකුත් කරන ලද කොටස් ප්‍රාග්ධනයෙන් සියයට 55 විකිණීම කොළඹ කොටස් වෙළඳපල මගින් නිමාවට පත් කර තිබේ. එහි අයිතිය නව අයිතිකරුවන් වෙත රුපියල් මිලියන 18 කට පවරා දී ඇත.

(vii) කැපිටල් ඩිවලොප්මන්ට් සහ ඉන්වෙස්මන්ට් කොම්පැනි (CDIC) සමාගමේ නිකුත් කරන ලද කොටස් ප්‍රාග්ධනයෙන් සියයට 40.8 ක් නියෝජනය වන කොටස් මිලියන 10ක් කොළඹ කොටස් වෙළඳපල හරහා අලෙවියට ඉදිරිපත් කරන ලදී. මෙම අලෙවිය රුපියල් මිලියන 400ක් ඉපයෙන පරිදි සම්පූර්ණ කරන ලදී. (PERC) රා.ව්‍ය.ප්‍ර.කො. සැළසුම් කළ ප්‍රධාන කටයුතු වලින් බිලියන 13 ට වැඩි ප්‍රමාණයක් මේ කාලය තුළ උපයා ගැනීමට සැළසුම් කර ඇත. කෙසේ වෙතත් 1995 දී රජයේ අයවැය අවශ්‍යතා සඳහා පාවිච්චි කිරීමට අදහස් කරන්නේ රුපියල් බිලියන 4ක් පමණි.

### 6.2 *විදේශ ආයෝජන*

1994 අගෝස්තු මස සිට මීට පෙර වසරවලට වඩා රට තුළ විශාල ආයෝජනයන් කිරීමට, නම් දැරූ ජාත්‍යන්තර සමාගම් අද්දවා ගැනීමට ශ්‍රී ලංකාව සමත් වී ඇත. මේ කාලය තුළ ආයෝජන මණ්ඩලයට ඉල්ලුම් පත් 12 ක් ලැබු අතර, එම සෑම ආයෝජනයක්ම රුපියල් දශලක්ෂ 500 ඉක්මවයි. යම්කිසි මාස දොළහක් ඇතුළත

ආයෝජන මණ්ඩලයට මෙතෙක් ලැබුන විශාල පරිමාණ ආයෝජන ඉල්ලුම්පත් වැඩිම ප්‍රමාණය මෙයයි. රජය විසින් ආයෝජකයින්ට පොදු දිරි දීමනා මාලාවක් ප්‍රදනය කර ඇත.

(i) නව ආයෝජන වැඩි දියුණු කිරීමේ පරමාර්ථයත් සමාගම් (Corporate) බදු අනුපාතය 35% දක්වා අඩු කර ඇත.

(ii) ආයෝජන පරිමාව සහ රැකියා බිහි කිරීම මත අවුරුදු 20 දක්වා බදු නිවාඩු දිනයන් ප්‍රදනය කර ඇත.

(iii) යන්ත්‍රෝපකරණ සහ ව්‍යාපෘති ආශ්‍රිත සියළුම ද්‍රව්‍ය තීරුබදු රහිතව ආනයනය කිරීමට ඉඩදී ඇත.

(iv) ප්‍රාග්ධන ප්‍රතිලාභ සහ ප්‍රතිදාන, සීමා කිරීම්වලින් තොරව පිටරට ගෙනයෑමට ඉඩ දී ඇත.

ඉලක්ක කරන ලද යම් ආයෝජනයන්ට දැනට පවතින දිරි දීමනා මාලාවට අතිරේකව ආයෝජන මණ්ඩලය විසින් තවත් නිදහස් දීමනාවන් දෙවර්ගයක් ප්‍රදනය කර ඇත. තෝරා ගත් උසස් තාක්ෂණයෙන් හා විශාල පරිමාණයේ ආයෝජනයන් ඇද ගැනීම මේ අමතර දීමනාවල පරමාර්ථයයි.

1. රුපියල් මිලියන 50 කට අඩු නොවන ආයෝජනයන් සහිත, සේවා නියුක්තයන් 50 කට වැඩියෙන් යොද ගන්නා, උසස් තාක්ෂණයෙන් යුතු, සමාගම්වලට පස් අවුරුදු බදු විරාමයක් ප්‍රදනය කෙරේ. මේ කාල පරිච්ඡේදය තුළ සහ ඊට පසු තවත් වර්ෂයක් යන තුරු "ප්‍රතිදනයන්" බද්දෙන් නිදහස් කෙරේ. ව්‍යාපෘතියේ සම්පූර්ණ ආයුෂ කාලය තුළ අමුද්‍රව්‍ය සහ පරිභෝජන ද්‍රව්‍ය ආනයන බද්දෙන් සහ පිරිවැටුම් බද්දෙන් නිදහස් කෙරේ.

2. ආයෝජනයේ ප්‍රමාණය අනුව වෙනස් වන අයුරින් විශාල සංවර්ධන ව්‍යාපෘතිවලට පහත සඳහන් පරිදි බදු නිවාඩු දිනයන් ප්‍රදනය කෙරේ.

| | | |
|---|---|---|
| රු. මිලියන 500 | රු. මිලියන 1,499 | අවුරුදු 10 |
| රු. මිලියන 1,500 | රු. මිලියන 2,499 | අවුරුදු 12 |
| රු. මිලියන 2,500 | රු. මිලියන 4,999 | අවුරුදු 15 |
| රු. මිලියන 5,000 සහ ඊට වැඩි | | අවුරුදු 20 |

දේශීය ආදයම් බදු දෙපාර්තමේන්තුවේ හා ආයෝජන මණ්ඩලයේ විවිධ බදු ක්‍රම නිසා ඇතිවන ගැටළු සමතාවයක් ඇති කිරීම පිණිස තවදුරටත් මේ සමාගම්වල සහන දෙනු ලැබේ.

මහා භාණ්ඩාගාරයෙන් දෙන ලද පහත සඳහන් ප්‍රාග්ධන ප්‍රදනයන් යොදවා යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම පිණිස ආයෝජන මණ්ඩලය සැළසුම් කර ඇත.

| | |
|---|---|
| 1. කටුනායක ආයෝජන ප්‍රවර්ධන කලාපය | රු. මිලියන 40 |
| 2. බියගම ආයෝජන ප්‍රවර්ධන කලාපය | රු. මිලියන 40 |
| 3. කොග්ගල ආයෝජන ප්‍රවර්ධන කලාපය | රු. මිලියන 60 |
| 4. මහනුවර කර්මාන්ත ජනපදය (උයන) | රු. මිලියන 115 |
| 5. හම්බන්තොට කර්මාන්ත ජනපදය | රු. මිලියන 50 |
| 6. මල්වත්ත කර්මාන්ත ජනපදය | රු. මිලියන 10 |

මෙම යෝජනා ක්‍රම යටතේ රැකියා පහසුකම් සැපයෙන ප්‍රමාණය 20,000 ඉක්මවන බවට ඇස්තමේන්තු කර ඇත.

ආයෝජන මණ්ඩලයේ ව්‍යාපෘතිවල ආයෝජනය - (1994 අගෝ. - 1995 සැප්.)

| | ඒකක ගණන | විදේශ ආයෝජනය රු. මි. | රැකියා නියුක්තියේ මුළු ආයෝජනය රු. මි. | |
|---|---|---|---|---|
| අ. අනුමත කළ | 315 | 11,823 | 32,367 | 48,760 |
| ආ. ගිවිසුම් අත්සන් කළ | 169 | ල. නො. | 14,098 | 21,647 |
| ඇ. වාණිජ නිෂ්පාදනය | 87 | ල. නො. | 7,634 | 15,206 |

සටහන - 2

ආයෝජන මණ්ඩල ආයෝජනය (95.07.31)

(අ) ගිවිසුම් ලිපි නිකුත් කළ — 1,062

(ආ) ක්‍රියාත්මක

ඒකක ගණන

කටුනායක -

බියගම - 94

කොග්ගල - 39

පිටත - 11

එකතුව - 358

502

(ඇ) රැකියා නියුක්තිය — 2,24,875

සටහන - 3

ඇඟලුම් කර්මාන්තශාලා 200 වැඩ සටහන 95.07.31 දක්වා ප්‍රගතිය

(අ) වාණිජ ක්‍රියාකාරිත්වයේ ඇති ආයතන ප්‍රමාණය - 1,62

(ආ) වෙනත් - 9

එකතුව - 171

මූලය : ආයෝජන මණ්ඩලය.

# 2 වන කොටස

## 5 පරිච්ඡේදය

## තිරසාර මානව සංවර්ධනය — සමාජීය අංශය

ශ්‍රී ලංකාවේ මානව සම්පත් සංවර්ධනයේ හා ජනගහන ව්‍යාප්තියේ සිත් ඇද ගන්නා සුළු ජයග්‍රහණ, එම අංශ කෙරෙහි මූලිකත්වය දෙමින් කරන ලද රාජ්‍ය වියදම්වල ප්‍රතිඵලයකි. උදහරණ වශයෙන් ශ්‍රී ලංකාවේ සමාජ දර්ශකය තීරණාත්මක අංශ 6 කදී පෙරදිග ආසියාවේ රටවල් බොහොමයකට වඩා ඉහළින් සිටින අතර ඒවා දෙවෙනි වන්නේ කොරියාව හා සිංගප්පූරුව වැනි ඉහළ සමාජ දර්ශන ඇති රටවලට පමණි. අනෙක් අතින්, මෑතකදී කරන ලද අධ්‍යයනයන් හා විග්‍රහයන්ගෙන් හෙලිවන්නේ ප්‍රාථමික හා ද්විතීක අධ්‍යාපනයේ ගුණාත්මක භාවය අඩුවී ඇති බවත්, පාසැල් අතර හා ප්‍රාදේශීය වශයෙන් පවතින හිඩැස නිවැරදි කළ යුතු බවත්ය. මැලේරියා රෝගීන්ගේ සංඛ්‍යාව ඉහළ මට්ටමක පවතී. එසේම ළමයින් අතර ඌණ පෝෂණය ද බරපතල ප්‍රශ්නයකි. පෙරදිග ආසියානු රටවල ආර්ථිකයන් පෙන්වා ඇති පරිදි මානව සංවර්ධනය සඳහා රජයේ ආයෝජනය ශුභ සාධක වියදමකට වඩා උසස් ඵල ගෙනදෙන ආයෝජකයක් බව අවධාරණය කළ යුතුය.

ශ්‍රී ලංකාවේ, මානව සංවර්ධනයේ ජයග්‍රහණ හා සමාජ අංශයට කළ වියදම් අතර සහසම්බන්ධය, දත්තයන් මගින් මනාව පෙන්නුම් කරයි. ඒ පිළිබඳ විස්තර පහත සඳහන් "අ" සංඛ්‍යා සටහනෙහි සඳහන් වේ.

පසුගිය 50, 60 හා 70 ය දශක තුනේදී ශ්‍රී ලංකාව තම ද. දේ. නි. යෙන් 8–10%ක් හා අයවැයෙන් 30%-35%ක ප්‍රමාණයක් පෝෂණය හා ආහාර සහනාධාර ඇතුලු සමාජීය අංශයන්ට වියදම් කළේය. ශ්‍රී ලංකාවේ මානව සංවර්ධනයේ ජයග්‍රහනයන් සඳහා හේතු සාධක වූයේද මේ වියදම් ය. 80 දශකයේදී පෙන්නුම් කරන ලද අධ්‍යාපනයේ ගුණාත්මක භාවයේත්, රෝග වළක්වා ගත හැකි වීමේත් පසු බැස්මට හේතුවූයේ සමාජ අංශයේ වියදම් දළ දේ. නි. 6% ට හා අයවැය වියදමෙන් 17% දක්වා පහත බැසීමය.

අතීතයෙන් උරුම වූ මෙම තත්ත්වය හොඳ අතට පත් කිරීමට රජයට අවශ්‍ය වන අතර, එය 1995 අයවැයෙන් ආරම්භ විය. ප්‍රතිපත්තිමය අරමුණු වූයේ ආහාර සහානාධාර සහ සමෘද්ධි වියදම් අවශ්‍යම පවුල්වලට, එනම් දශලක්ෂ 1.2 වන දුප්පත්ම ජනතාවට අවශ්‍ය ප්‍රමාණයන් ලබාදීමට ඉලක්ක කරමින් අයවැය වියදම් වඩාත් යෝග්‍ය ලෙස සළසා ඉතිරි සම්පත් සෞඛ්‍ය හා අධ්‍යාපන අංශයන්ට වැය කිරීමය. මෙම අංශ දෙක සඳහා දත්ත "ආ" සංඛ්‍යා සටහනෙහි පෙන්වා ඇත.

ඒ අනුව 50 හා 60 දශක වලදී ද. දේ. නි. 5%–6% හා අයවැයෙන් 20%ක් ලෙස පැවති සෞඛ්‍ය හා අධ්‍යාපන වියදම් 80 දශකයේදී ද. දේ. නි. 4% තෙක් සහ ජාතික අයවැයෙන් 12% වන තෙක් පහත වැටී ඇත. 1990 මුල් භාගයේ දී යම් යම් හිතකර දේ සිදුවුවත් අභියෝගය වී ඇත්තේ මැලේසියාව හා තායිලන්තය වැනි පෙරදිග ආසියානු රටවල් ස්වකීය සෞඛ්‍ය හා අධ්‍යාපනය සඳහා වියදම් කරන, ද. දේ. නි. යෙන් 9%–10%වන වියදම් ඉලක්කය වෙත ළඟාවීමය. සෞඛ්‍යයට හා අධ්‍යාපනයට වඩ වඩාත් සම්පත් වෙන් කිරීම 1995 අයවැයෙන් ආරම්භ විය. 1990-94 වකවානුව හා සැසඳීමේ දී 1995දී වෙන් කළ මුදල් ද. දේ. නි. සියයට කොටස් භාගයක වැඩිවීමක් ද, අයවැය වියදම් හා සැසඳීමේ දී සියයට එකක වැඩිවීමක් ද පෙන්නුම් කරයි.

ශ්‍රී ලංකාව මුහුණ පා ඇති අභියෝගය නම් මානව සම්පත් සංවර්ධනය රැක ගැනීම හා තවදුරටත් දියුණු කිරීමත්, ගුනාත්මක වර්ධනය පවත්වා ගනිමින් සංඛ්‍යාත්මක ඉලක්ක සාක්ෂාත් කර ගැනීමත් ය. විශේෂයෙන් ම ළමයින්ගේ පෝෂණ තත්ත්වය හා රෝග වළක්වා ගැනීමේ තත්ත්වයන් නැංවීම සඳහා විශේෂ ක්‍රියා මාර්ග ගත යුතුව තිබේ.

## අ – සංඛ්‍යා සටහන

### සෞඛ්‍ය, අධ්‍යාපන සහ වෙනත් සමාජ සේවාවන් සඳහා සාමාන්‍ය වියදම 1951 – 1995

| | ද. දේ. නි. | ර. මු. වි. | සෞඛ්‍ය | | | අධ්‍යාපනය | | | වෙනත් සමාජ සේවා (3) | | | ආහාර සහනාධාර (1) | | | එකතුව | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | රු. දශ. ල. | රු. දශ. ල. | වියදම් රු. දශ. ල. | ද. දේ. නි. හි ප්‍රති ශතයක් ලෙස | ර. මු. වි. හි ප්‍රති ශතයක් ලෙස | වියදම රු. දශ. ල. | ද. දේ. නි. හි ප්‍රති ශතයක් ලෙස | ර. මු. වි. හි ප්‍රති ශතයක් ලෙස | වියදම රු. දශ. ල. | ද. දේ. නි. හි ප්‍රති ශතයක් ලෙස | ර. මු. වි. හි ප්‍රති ශතයක් ලෙස | වියදම රු. දශ. ල. | ද. දේ. නි. හි ප්‍රති ශතයක් ලෙස | ර. මු. වි. හි ප්‍රති ශතයක් ලෙස | වියදම රු. දශ. ල. | ද. දේ. නි. හි ප්‍රති ශතයක් ලෙස | ර. මු. වි. හි ප්‍රති ශතයක් ලෙස |
| 1951-59 | 5,024 | 1,260 | 100 | 1.98 | 7.99 | 162 | 3.19 | 12.80 | 23 | 0.46 | 1.84 | 111 | 2.25 | 8.77 | 396 | 7.87 | 31.39 |
| 1960-69 | 8,582 | 2,345 | 166 | 1.96 | 7.13 | 348 | 4.08 | 14.87 | 44 | 0.53 | 1.91 | 265 | 3.15 | 11.46 | 823 | 9.59 | 35.37 |
| 1970-79 | 27,337 | 8,650 | 395 | 1.49 | 5.03 | 807 | 3.20 | 10.91 | 126 | 0.43 | 1.43 | 1,155 | 3.93 | 13.19 | 2,482 | 9.08 | 30.56 |
| 1980-89 | 1,53,856 | 54,771 | 2,246 | 1.41 | 3.95 | 3,999 | 2.58 | 7.21 | 905 | 0.53 | 1.48 | 2,256 | 1.57 | 4.30 | 9,406 | 6.11 | 17.17 |
| 1990-94 | 4,38,939 | 1,55,218 | 6,352 | 1.45 | 4.06 | 13,030 | 2.96 | 8.31 | 1,589 | 0.37 | 1.02 | 9,426 | 2.24 | 6.26 | 30,396 | 6.92 | 19.58 |
| 1995 | 6,68,000 | 2,37,404 | 11,158 | 1.67 | 4.70 | 20,873 | 3.12 | 8.80 | 2,701 | 0.40 | 1.14 | 9,336 | 1.40 | 3.93 | 44,068 | 6.60 | 18.56 |

## ආ – සංඛ්‍යා සටහන

| | ද. දේ. නි. | ර. මු. වි. | සෞඛ්‍ය සහ අධ්‍යාපනය | | |
|---|---|---|---|---|---|
| | රු. දශ. ල. | රු. දශ. ල. | වියදම රු. දශ. ල. | ද. දේ. නි. හි ප්‍රති ශතයක් ලෙස | ර. මු. වි. හි ප්‍රති ශතයක් ලෙස |
| 1951–59 | 5,024 | 1,260 | 262 | 5.22 | 20.80 |
| 1960–69 | 8,582 | 2,345 | 514 | 5.99 | 21.91 |
| 1970–79 | 27,337 | 8,650 | 1,201 | 4.39 | 13.89 |
| 1980–98 | 1,53,856 | 54,771 | 6,245 | 4.06 | 11.40 |
| 1990–94 | 4,38,939 | 1,55,218 | 19,382 | 4.41 | 12.37 |
| 1995 | 6,68,000 | 2,37,404 | 32,031 | 4.79 | 13.50 |

මූලය : අයවැය ඇස්තමේන්තු, ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව, මහ බැංකුවේ වාර්ෂික වාර්තා සහ ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව.

සටහන : (1) පාසැල් දිවා ආහාර, ජනසවිය වැඩ සටහන සහ 1995 දී සමෘද්ධි වැඩ සටහන ඇතුලත්ය.
(2) ඇස්තමේන්තු කල සංඛ්‍යාවන්, උතුර – නැගෙනහිර පළාත්වල වියදම් හැර.
(3) වෙනත් සේවා – තරුණ කටයුතු, කම්කරු,සමාජ සේවා සහ සංස්කෘතික කටයුතු ඇතුලත්ය.
(4) ර. මු. වි. – රජයේ මුළු වියදම.
(5) 1995 වියදම් සංඛ්‍යාවල පළාත් සභා ආදායමෙන් කරන ලද වියදම් හාර රජයේ ප්‍රතිපාදන ඇතුලත්ය.

## (අ) අධ්‍යාපනය

### 1. හැඳින්වීම

ශ්‍රී ලංකාව 1948 දී නිදහස ලබා ගැනීමෙන් පසුව එහි සම්පත් වලින් විශාල ප්‍රමාණයක් අධ්‍යාපනික පහසුකම් සංවර්ධනය කිරීමේ කාර්ය සඳහා ආයෝජනය කර ඇත. අධ්‍යාපනයෙහි යොදවන ලද මෙම ආයෝජනවල සමුච්චිත ප්‍රතිඵලය වී ඇත්තේ ජනගහනයේ වැඩිහිටි සාක්ෂරතා අනුපාතය (1991 දී සියයට 86.6) සහ ජනගහනයේ අධ්‍යාපනික තත්ත්වයන් ඉහළ මට්ටමක තිබීමයි. වර්තමානයේ ප්‍රාථමික, ද්විතියික හා තෘතියික අධ්‍යාපන මට්ටම්වලදී රජයට ආසන්න වශයෙන් ඒකාධිකාරයක් ඇති අතර සමස්ත රාජ්‍ය අධ්‍යාපන පහසුකම් නොමිලේ සපයනු ලැබේ. රජයේ පාසැල් සහ ගාස්තු අය නොකරන පෞද්ගලික පාසැල් සඳහා අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් ඉතා අඩු පහසුකම් ගාස්තුවක් අය කිරීමට ඉඩදී ඇත. බස් හා දුම්රිය ගාස්තු පහසුකම් දුප්පත් ළමුන් සඳහා ශිෂ්‍යත්ව, නොමිලේ පාසැල් පොත් සහ සෑම පාසැල් ශිෂ්‍ය ශිෂ්‍යයාවකටම නොමිලේ නිල ඇඳුම් ආදී සහනාධාර ක්‍රම මගින් තවදුරටත් මුදල් දුෂ්කරතා අඩුකර ඇත. පාසැල් යාමට අවශ්‍ය වයස සපුරා ඇති ඕනෑම ළමයකුට රජයේ පාසැලකට ඇතුළු වී ඉගෙන ගැනීමට අවස්ථාවක් සලසා ඇත. හොඳ මාර්ග පද්ධතියක් ඇති බැවින් දිවයින පුරා ඇති පාසැල් වලට පහසුවෙන් පිවිසීමට හැකියාවක් ඇත.

දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් වශයෙන් සහ රජයේ වියදම්වල ප්‍රතිශතයක් වශයෙන් යන ආකාර දෙකෙන්ම බැලීමේ දී 1994 වසරට වඩා 1995 වසරේ දී අධ්‍යාපන අංශයට මුදල් වෙන් කිරීම්වල වර්ධනයක් පෙන්නුම් කරයි. කෙසේ වෙතත් 1996 වසරේ දී දළ දේශීය නිෂ්පාදිතයේ සහ රාජ්‍ය වියදම්වල ප්‍රතිශතයක් වශයෙන් යම් අඩුවීමක් දක්නට ඇත.

වගු අංක 1 : අධ්‍යාපනය සඳහා මුදල් ප්‍රතිපාදන

| | 1994<br>රු. මිලියන | 1995<br>රු. මිලියන | 1996<br>රු. මිලියන |
|---|---|---|---|
| මුදල් ප්‍රතිපාදන* | 16,658 | 20,873 | 22,119 |
| දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස | 2.89 | 3.16 | 2.94 |
| රාජ්‍ය වියදම් ප්‍රතිශතයක් ලෙස | 8.60 | 8.80 | 8.12 |

* අධ්‍යාපනය සඳහා පළාත් සභා අරමුදල් වලින් කරනු ලබන වියදම් ඇතුලත් වී නැත.

### 2. අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනය

#### 2.1 ජාතික පාසැල් සහ ශිෂ්‍යත්ව

1994 අගෝස්තු වන විට 37ක් පමණ වූ ජාතික පාසැල් ගණන 1995 අගෝස්තු වන විට 195 දක්වා වැඩි විය. දිවයිනේ සියලුම ප්‍රදේශවල ළමයින්ට ගුණාත්මක අධ්‍යාපනයක් ලබාදීම සඳහා ජාතික පාසැල් පිහිටුවීම තුළින් අවස්ථාවක් සලසා දීමට උත්සාහ කෙරේ.

1994 දී 7,500 වූ 5 වසර ශිෂ්‍යත්ව ප්‍රමාණය 1995 වන විට 10,000 දක්වා වැඩි වී ඇත. 1996 වන විට මෙම සංඛ්‍යාව 15,000 දක්වා වැඩි කිරීමට බලාපොරොත්තු වේ. 5 වසර ශිෂ්‍යත්ව පරීක්ෂණයට අදාළ විෂය නිර්දේශයන් සංශෝධනය කර ඇත. මෙම විභාගයේ දී මේ දක්වා සිදුකර ඇත්තේ සිසුන්ගේ ගණිතමය හා භාෂාමය කෞශල්‍ය පරීක්ෂණයට භාජනය කිරීම පමණක් වන අතර මෙය ප්‍රාථමික අධ්‍යාපන මට්ටමේ සිසුන්ගේ අධ්‍යාපන සංවර්ධනයට අහිතකර බව පෙනී ගොස් ඇත. 1995 දෙසැම්බර් මස සංශෝධිත 5 වසර විභාගය පැවැත්වෙන අතර එමගින් සිසුන්ගේ ප්‍රාථමික අධ්‍යාපන මට්ටමේ සමස්ත විෂය මාලා ක්ෂේත්‍රයම ආවරණය කෙරෙන සේ සාමාන්‍ය දැනීම පරීක්ෂා කරනු ලැබේ.

### 2.2 විෂයමාලා ප්‍රතිසංස්කරණය

ආසියානු සංවර්ධන බැංකුවේ ආධාර සහිතව ජාතික අධ්‍යාපන ආයතනය විසින් පාසැල් විෂයමාලා සංශෝධනය කිරීමේ ක්‍රියාවලියක නියැලී සිටී. උසස් පෙළ විභාගය සඳහා කලා සහ වාණිජ විෂය මාලා හදාරන සිසුන්ගේ අවශ්‍යතාවලට ගැලපෙන පරිදි නව ගණිත විෂය මාලාවක් හඳුන්වා දී ඇත. උසස් පෙළ වාණිජ විෂය ධාරාවට "ව්‍යාපාර සංඛ්‍යානය" නමින් නව විෂයයක් ද හඳුන්වා දී ඇත. මෙම විෂයයන් සඳහා අදාළ පොත්පත්, ගුරු අත්පොත්, ඉගැන්වීමේ මාර්ගෝපදේශ සහ අතිකුත් ශ්‍රව්‍ය දෘශ්‍ය ආධාරක ද සැකසෙමින් පවතී.

පාසැල් සිසුනට නව තාක්ෂණය ඉගෙන ගැනීම සඳහා අවස්ථාව සැලසීමේ අරමුණින් මෙම කාල පරිච්ඡේදය තුළ ගම්බද ප්‍රදේශවල ඇති පාසැල්වල පරිගණක මධ්‍යස්ථාන 12ක් විවෘත කර ඇත. මෙම මධ්‍යස්ථාන මගින් පවත්වාගෙන යනු ලබන පරිගණක පාඨමාලාවට අ. පො. ස (සා. පෙළ) සහ අ.පො.ස. (උසස් පෙළ) විභාග වල ප්‍රතිඵල බලාපොරොත්තුවෙන් සිටින සිසුහු සහභාගි වෙති. 1996 වසරේ දී තවත් මෙවැනි පරිගණක මධ්‍යස්ථාන 30ක් පිහිටුවීමට සැලසුම් කර ඇත.

### 2.3 ගුරු පුහුණුව

අධ්‍යාපන පීඨවලට ඇතුළත් කරගනු ලබන පූර්ව සේවා ගුරුවරු සංඛ්‍යාව 436 කින් වැඩි වී ඇත. 1995 වසරේ ගුරු විද්‍යාල සඳහා සේවාස්ථ ගුරු පුහුණුවට ඇතුළත් කරගනු ලැබූ සංඛ්‍යාව 1994ට වඩා 869 කින් වැඩි විය . ගුරු පුහුණු ආයතන සඳහා ඇතුළත් කරගනු ලැබූ ඉංග්‍රීසි ගුරු සංඛ්‍යාව 414කින් වැඩි වී ඇත. (වගු අංක 2)

වගු අංක 2 : ඇතුළත් කරගනු ලැබූ ඉංග්‍රීසි ගුරු සංඛ්‍යාව
වර්ග වශයෙන්

| පුහුණු වර්ගය සහ ආයතනය | ඇතුළත් කරගත් සංඛ්‍යාව 1994 | ඇතුළත් කරගත් සංඛ්‍යාව 1995 | වැඩිවීම |
|---|---|---|---|
| 1. ගුරු විද්‍යාලවල සේවාස්ථ පුහුණුව | 452 | 573 | 121 |
| 2. අතිකුත් ආයතනවල සේවාස්ථ පුහුණුව (ජාතික අධ්‍යාපන ආයතනය, විවෘත විශ්ව විද්‍යාලය) | 541 | 624 | 83 |
| 3. අධ්‍යාපන පීඨවල පූර්ව සේවා පුහුණුව | 207 | 230 | 23 |
| 4. දිස්ත්‍රික් ඉංග්‍රීසි භාෂා සංවර්ධන මධ්‍යස්ථානවල පූර්ව සේවා පුහුණුව | 1,813 | 2,000 | 187 |
| එකතුව | 3,013 | 3,427 | 414 |

## 3. අධ්‍යාපන අවස්ථා පළල් කිරීම

### 3.1 පාසැල් නොයන ළමයින්

සැම පළාත් සභා ප්‍රදේශයකම එක බැගින් සම්පත් මධ්‍යස්ථාන ඉදිවෙමින් පවතී. මෙම මධ්‍යස්ථාන මගින් අවුරුදු 5 –14 වයසේ පාසැල් නොයන ළමයින් සඳහා සාක්ෂරතා පංති පැවැත්වීමත් කියවීමේ මධ්‍යස්ථාන පවත්වාගෙනයාමත්, නොවිධිමත් අධ්‍යාපනය සඳහා විවෘත අධ්‍යාපන මධ්‍යස්ථාන පවත්වාගෙන යාමත්, පෙර පාසැල් ගුරුවරු පුහුණු කිරීම මගින් පෙර පාසැල් අධ්‍යාපනයට උපකාර කිරීමත් සිදුවේ.

### 3.2 තෘතීයික අධ්‍යාපනය — නව විශ්ව විද්‍යාල සහ නේවාසික පහසුකම් :

නව විශ්ව විද්‍යාල තුනක් පිහිටුවා ඇත. ඒවා නම් ඔලුවිල් හි පිහිටුවා ඇති අග්නිදිග විශ්ව විද්‍යාලයත්, අනුරාධපුර පිහිටුවා ඇති රජරට විශ්ව විද්‍යාලයත්, රත්නපුර පිහිටුවා ඇති සබරගමු විශ්ව විද්‍යාලයත් ය. දැනට පවත්නා විශ්ව විද්‍යාලවලට 1994/95 අධ්‍යයන වර්ෂයට වඩා 1995/96 අධ්‍යයන වර්ෂය සඳහා සිසුන් 534 වැඩිපුර බඳවා ගෙන ඇත. 1994 වර්ෂය මුල දී විශ්ව විද්‍යාල සිසුන්ගෙන් නේවාසික පහසුකම් ලැබ තිබුනේ, සියයට 37ට පමණි. (සිසුන් 11,888)

කෙසේ හෝ රජය විසින් 1996 වසර අවසාන වන විට අතිරේක සිසුන් 5,000 කට නේවාසික පහසුකම් සැපයීම සඳහා මහාපරිමාණ නේවාසික පහසුකම් සැලසීමේ ව්‍යාපෘතියක් අරඹා තිබේ. 1995 අගෝස්තු මාසය අග දී සිසුන් 400 කට ඉඩ පහසුකම් ලැබෙන නේවාසිකාගාරයක් කොළඹ විශ්ව විද්‍යාලයේ දී ද, සිසුන් 225 බැගින් ඉඩ පහසුකම් ඇති නේවාසිකාගාර 2ක් රුහුණු විශ්ව විද්‍යාලයේ දී ද, සිසුන් 150 කට ඉඩ පහසුකම් ලැබෙන නේවාසිකාගාරයක් කැළණිය විශ්ව විද්‍යාලයේ දී ද සාදා නිමකොට තිබුණි. දැනට වැඩ නොනිමි නේවාසිකාගාර ව්‍යාපෘති 1996 වසර අවසානයේ දී නිම කිරීමට අපේක්ෂිත ය. එවිට විශ්ව විද්‍යාල සිසුන් සියයට 53 කට පමණ, නේවාසිකාගාර පහසුකම් ලබාදීමට හැකිවේ යැයි අපේක්ෂා කෙරේ.

### 4. පාසැල් යටිතල පහසුකම් දියුණු කිරීම

නව සහ අලුත් වැඩියා කරනලද පාසැල් ගොඩනැගිලි සහ නව ලීබඩු උපකරණ සැපයීම මගින් පාසැල් යටි තලයෙහි සැලකිය යුතු දියුණුවක් ඇතිකර තිබේ. (වගු අංක 3) විශාල වශයෙන් සාදනිමකර ඇති ඉදිකිරීම් කටයුතුවලට පංති කාමර 2,148, විද්‍යාගාර 145, වැසිකිළි/කැසිකිළි 1,086, ජල සේවා 248ක් ඇතුළත් වේ. එසේම පාසැල් ලීබඩු උපකරණ යටතේ ළමා පුටු 1,44,240 ක්ද, ළමා මේස 1,44,149 ද, ගුරු පුටු 10,505 ද, ගුරු මේස 11,460 ද, කළු ලෑලි 7,599 ද පාසැල්වලට සපයා ඇත.

වගු අංක 3

පළාත් අනුව ගොඩනැගිලි සහ ලීබඩු

(1994 අගෝස්තු – 1995 අගෝස්තු)

| අයිතමය | බස්නාහිර | සබර. | මධ්‍යම | උතුරු මැද | වයඹ | ඌව | දකුණ | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|
| *ඉදිකිරීම් (සංඛ්‍යාව)* | | | | | | | | |
| 1. පංති කාමර | 454 | 472 | 91 | 353 | 369 | 312 | 97 | 2,148 |
| 2. බහුකාර්ය කාමර | 35 | 39 | 50 | 03 | 11 | 59 | – | 197 |
| 3. විද්‍යාගාර | 4 | 44 | 8 | 26 | 04 | 16 | 38 | 145 |
| 4. ගුරු නිවාස | 9 | – | 44 | 16 | 12 | – | 4 | 46 |
| 5. වැසිකිළි/කැසිකිළි | 258 | 257 | 75 | 148 | 93 | 223 | 32 | 1,086 |
| 6. වටතාප්ප හා වෙනත් | – | 36 | 07 | 10 | 11 | 03 | 02 | 67 |
| 7. අධ්‍යාපන කාර්යාල | – | 3 | – | 02 | 03 | 07 | 05 | 20 |
| 8. ජල සේවාවන් | 68 | 78 | 45 | 11 | 10 | 25 | 11 | 248 |

| අයිතමය | බස්නාහිර | සබර. | මධ්‍යම | උතුරු මැද | වයඹ | ඌව | දකුණ | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|
| ලිබඩු (සංඛ්‍යාව) | | | | | | | | |
| 1. ළදරු කට්ටල | 9,509 | 12,888 | 28,650 | 6,254 | 29,248 | 11,653 | 13,844 | 1,12,046 |
| 2. ළමා පුටු | 22,978 | 18,920 | 28,856 | 16,129 | 33,255 | 9,816 | 14,286 | 1,44,240 |
| 3. ළමා මේස | 23,102 | 19,426 | 28,450 | 16,571 | 35,818 | 7,356 | 13,426 | 1,44,149 |
| 4. ගුරු පුටු | 5,495 | 855 | 1,490 | 802 | 1,286 | 577 | – | 10,505 |
| 5. ගුරු මේස | 5,215 | 243 | 2,450 | 1,370 | 1,294 | 868 | – | 11,460 |
| 6. කළුලෑලි | 4,821 | 278 | 1,815 | 213 | 405 | 67 | – | 7,599 |
| 7. වාගේ කබඩ් හා කැබිනට් | 539 | 72 | 580 | 36 | 30 | – | – | 1,257 |
| 8. වෙනත් ලීබඩු | 167 | – | – | 600 | – | – | 360 | 1,127 |

5. අධ්‍යාපන පරිපාලනය දියුණු කිරීම

පළාත් අධ්‍යාපන පරිපාලන පද්ධතියෙහි වැඩි කාර්යක්ෂමතාවයක් ඇති කිරීම සඳහා ප්‍රතිව්‍යුහගත කිරීම ආරම්භ කොට ඇත. පරිපාලන හා මූල්‍යමය වගකීම් කලින් කොට්ඨාශ අධ්‍යාපන කාර්යාල සතුව තිබුන ද දැන් එම වගකීම් අධ්‍යාපන කලාප කාර්යාලවලට පවරා ඇත. කොට්ඨාශ කාර්යාල කීපයකටම එක් කලාප කාර්යාලය බැගින් සේවය සපයනු ලැබේ. දැනට සියයට 40 පමන මෙම ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩ පිළිවෙල නිමකොට ඇත.

අනිකුත් දීප ව්‍යාප්ත සේවා හා සමානව ශ්‍රී ලංකා ගුරු සේවය 1994 ඔක්තෝබර් මස පිහිටුවිය. ගුරු සේවය පිහිටුවීමේ දී ප්‍රධාන පරමාර්ථය වූයේ තෘප්තිමත් ගුරු පිරිසක් බිහිකිරීම මගින් රටේ අධ්‍යාපනයෙහි ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීමය. ගුරු සේවය පිහිටුවීමත් සමග ගුරුවරුන්ට උසස්වීමේ අවස්ථා වැඩි වී ඇති අතර විශාල වශයෙන් වැටුප් වර්ධනය ද ඔවුන්හට ලබා දී ඇත. නව ගුරු සේවය යටතේ වැඩි වූ වැටුප් ගෙවීම සඳහා රු. දසලක්ෂ 2,800 අතිරේක මුදලක් 1995 වසරේ අයවැය මගින් ප්‍රතිපාදනය කොට ඇත.

අධ්‍යාපන පොදු සහතික පත්‍ර උසස් පෙළ පංති සහිත විද්‍යාලවල විදුහල්පතිවරුන්ට සහ නියෝජ්‍ය විදුහල්පතිවරුන්ටත් ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයෙහි ඇතැයි නිලධාරීන්ටත් පාසැල් කළමනාකරණය පිළිබඳ පුහුණුවක් ලබා දී ඇත. මෙම පුහුණු වැඩ සටහන යටතේ විෂයධාරා තුනට (අ. පො. ස. උසස් පෙළ විද්‍යා, කලා, වාණිජ) ඇති පාසැල්වල විදුහල්පති වරු 560 ද, නියෝජ්‍ය විදුහල්පතිවරු 560 ද, අ. පො. ස. උසස් පෙළ කලා, සහ වාණිජ ධාරා පමණක් තිබෙන පාසැල්වල විදුහල්පතිවරු 1,280 ද, අධ්‍යාපන පරිපාලන සේවයෙහි නිලධාරීන් 529 ද මෙම වැඩ සටහන යටතේ පුහුණුව ලබා දී ඇත.

අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ නොවිධිමත් අධ්‍යාපන වැඩසටහන යටතේ ක්‍රියාත්මක වන 1,400 ක් පමණ පාසැල් කාර්මික ඒකකවල සහ 400ක් පමණ සාක්ෂරතා සහ කුශලතා මධ්‍යස්ථානවල උපදේශකයින් සඳහා මූල්‍යමය දිරි දීමනා සපයා ඇත. 1994 වසරේ දී පාසැල් කාර්මික ඒකකවල උපදේශකයින් සඳහා ගෙවනු ලැබුවේ මාසිකව රුපියල් 600 කි. එය රුපියල් 1,400 දක්වා 1995 වර්ෂයේ දී වැඩිකරනු ලැබීය. (සියයට සියයකටත් වඩා වැඩිය.) සාක්ෂරතා සහ කුසලතා පුහුණු කිරීමේ මධ්‍යස්ථානවල උපදේශකයින් සඳහා 1994 මාසිකව ගෙවනු ලැබූ දීමනාව රුපියල් 900 ක් වූ අතර එය 1995 වසරේ දී රුපියල් 1,400 දක්වා වැඩි කරනු ලැබීය. මෙය සියයට 56 ක තරම් වැඩිකිරීමකි.

නොවිධිමත් අධ්‍යාපන වැඩසටහන යටතේ මෙම උපදේශකයින්ගේ මාසික දීමනා වැඩි කිරීමත් සමග මනා සුදුසුකම් ඇති දක්ෂ උපදේශකයන් බඳවා ගැනීමටත් ඔවුන් සේවයෙහි දිගටම තබා ගැනීමටත් හැකිවේ යැයි අපේක්ෂා කෙරෙන අතර දෙනු ලබන පුහුණුවෙහි ගුණාත්මක බව ද වර්ධනය වේයැයි අපේක්ෂා කෙරේ.

## (ආ) සෞඛ්‍යය

ජනාධිපති කාර්යාලය
පුස්තකාලය

### 1. උපශමන සෞඛ්‍ය සේවා :

*1.1 මැලේරියාව, ලිංගාශ්‍රිත රෝග සහ ජලජනිත රෝග*

අතීතයේ දී උපශමන හෝ ප්‍රවර්ධන සෞඛ්‍ය සේවාවට වඩා නිවාරණ සෞඛ්‍ය සේවාව සඳහා අවධානය යොමු කළත්, පොදු පෙරමුණු රජය උපශමන සෞඛ්‍ය සේවා දෙසට සෞඛ්‍ය අයෝජන රටාව වෙනස් කරන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස බෝවන රෝග කීපයකම වර්ධනය පාලනය කරන ලදී. උදාහරණයක් ලෙස මැලේරියාව, ලිංගාශ්‍රිත රෝග සහ ජලජනිත රෝග දක්විය හැකිය. විශාල වශයෙන් මැලේරියා අවදානමට ලක්වූ ප්‍රදේශවල මැලේරියාව මර්ධනය සඳහා දියත්කළ ජංගම සායනයන් නිසා මැලේරියාව සියයට 15 ක් ද, ප්ලැස්මෝඩියම් ෆැල්සිපාරුම් වර්ගයේ මැලේරියාව (මාරාන්තික මැලේරියාව) සියයට 54ක් ද අඩුවිය.

ලිංගාශ්‍රිත රෝග, එච්.අයි.වී./ඒඩ්ස් රෝග පිළිබඳ දැනීම වර්ධනය කිරීමේ වැඩ සටහන් කීපයක් දියත් කළ අතර මෙම රෝග පැතිරීම වැළැක්වීම සඳහා මධ්‍යකාලීන සංවර්ධන සැලැස්මක් සකස් කරන ලදී.

*1.2 ජලභීතිකාව*

මානව ජලභීතිකාව තවමත් ප්‍රධාන සෞඛ්‍ය ගැටළුවක් වුවත් මෙම කාලය තුළ දී ගෘහස්ථ සුනඛයින් 3,81,000 එන්නත් කළ අතර සුනඛයින් 1,08,260ක් විනාශ කර දමන ලදී. මානව ජලභීතිකාව පාලනය කිරීමේ නව උපක්‍රමයක් ලෙස ප්‍රාදේශීය මට්ටමේ සම්මන්ත්‍රණයන් මගින් ප්‍රජාවගේ මනා සහයෝගය ලබා ගැනීම, සැලසුම් කරමින් පවතී.

*1.3 ළමා උපකාරක සේවාවන්*

එන්නත් මගින් ළදරුවන් සහ ළමයින් ආරක්ෂා කිරීම සියයට 85ක තරම් සාර්ථක මට්ටමකින් පවතින අතර ශ්‍රී ලංකාව "පෝලියෝ මයිලයිටිස්" මුලිනුපුටා දැමීමේ ආසන්නයට පැමිණ සිටී. ශ්‍රී ලංකාව පෝලියෝ රෝගයෙන් පූර්ණයෙන් මුදවා ගැනීමේ පරමාර්ථයෙන් නොවැම්බර් සහ දෙසැම්බර් මාසවල දී ජාතික එන්නත් දිනයක් සැලසුම් කළ අතර එය වර්ෂ 3ක කාලයක් තුළ ක්‍රියාත්මක වනු ඇත. මීට අමතරව, ගැබිණි මව්රුන්, කිරිදෙන මව්වරුන් සහ වයස අවුරුදු 5ට අඩු ළමුන් ඇතුළත්ව දශලක්ෂ 4ක ප්‍රතිලාභකයින් සඳහා වන ත්‍රිපෝෂ වැඩ සටහන වෙනුවෙන් රුපියල් දශලක්ෂ 180ක් වියදම් කරන ලදී. මාතෘ සහ ළමා සෞඛ්‍ය සායනයන් සහ වෙනත් සමාජ සේවා සංවිධානයන් මගින් ත්‍රිපෝෂ බෙදා හැරීම කරගෙන යන ලදී. මව්කිරි දීම වර්ධනය සඳහා 'ළදරු මිතුරු ප්‍රාරම්භක වැඩ සටහන' ක්‍රියාත්මක කළ අතර මෙම වර්ෂය තුළ දී තවත් ආරෝග්‍යශාලා 5ක් ළදරු මිතුරු රෝහල් ලෙස ප්‍රකාශයට පත් කරන ලදී.

ජාතික මට්ටමින් සම්බන්ධීකරණය කරන්නා වූ බහු ආංශික වැඩ සටහන් සංඛ්‍යාවක් මෙම වර්ෂය තුළ දී ආරම්භ කරන ලදී. එනම් ළමුන් සඳහා වන ක්‍රියාකාරී සැලැස්ම, ලිංගාශ්‍රිත රෝග එච්.අයි.වී./ඒඩ්ස් පාලන වැඩ සටහන සහ ජාතික පෝෂණ වැඩ සටහන් ක්‍රියාත්මක කිරීමයි. ළමුන් සඳහා වන ක්‍රියාකාරී සැලැස්ම යටතේ ඇති අරමුදල් ප්‍රසවයේ දී අත්‍යවශ්‍ය වන්නා වූ උපකරණ සැපයීමටත්, ඉතා ඈත ප්‍රදේශවල ග්‍රාමෝදය සෞඛ්‍ය මධ්‍යස්ථාන පුනරුත්ථාපනය හෝ අලුතින් ඇති කිරීමටත් යොදා ගන්නා ලදී.

### 2. සෞඛ්‍ය මිනිස් බලය -බඳවා ගැනීම සහ පුහුණුව

සෞඛ්‍ය මිනිස් බල ක්ෂේත්‍රය යටතේ, අලුතින් වෛද්‍ය නිලධාරීන් 886ක් සහ වෙනත් නිලධාරී 2,449ක් බඳවා ගත් අතර වෛද්‍ය නිලධාරීන් හෙදියන් සහ අතුරු වෛද්‍ය සේවා පිරිස් සඳහා පුහුණුවීමේ වැඩ සටහන් සංඛ්‍යාවක් පවත්වන ලදී. වතු සෞඛ්‍ය අංශය රාජ්‍ය සෞඛ්‍ය සේවාවන්ට ඒකාබද්ධ කිරීමේ වැඩ සටහනේ කොටසක් ලෙස වතු අංශයෙහි සෞඛ්‍ය නිලධාරීන් පුහුණු කිරීම ද 1995 වර්ෂය තුළ දී ආරම්භ කරන ලදී.

රාජ්‍ය ඖෂධ සංස්ථාව විසින් රාජ්‍ය සෞඛ්‍ය අංශය සඳහා වෛද්‍ය සැපයුම් කරන අතර ඖෂධවල ගුණාත්මක තත්ත්වය පවත්වාගෙන යාම සහ ඖෂධ ව්‍යාප්තිය කාර්යක්ෂම කිරීම සඳහා සම්මන්ත්‍රණ සහ වැඩමුළු සංඛ්‍යාවක් සංවිධානය කරන ලදී. දේශය තුළ නිෂ්පාදනය කල සහ ආයාත කළ ඖෂධ, ඒවායේ මිල සහ ඵලදායීතාවය පිළිබඳ වෛද්‍ය වෘත්තිකයින් දැනුවත් කිරීම සඳහා නියෝජිතයින් සංඛ්‍යාවක් පුහුණු කරනු ලැබේ. ඇතැම් රෝග සහ ඖෂධ පාවිච්චිය පිළිබඳ ජනතාව දැනුවත් කිරීම සඳහා 'සුවහමුව' සහ 'සුවපියස' නමින් වෛද්‍යවරුන් සමග සාකච්ඡා මාලාවක් විද්‍යුත් මාධ්‍ය මගින් පවත්වනු ලැබීය. මෙම පරමාර්ථය සඳහා පාසැල් වැඩ සටහන් ද පවත්වනු ලැබීය. 1995 දී රාජ්‍ය ඖෂධ සංස්ථාවේ අලෙවිය සියයට 39ක් ඉහල ගිය බව පෙනේ. තවද, සෑම දිස්ත්‍රික්කයක් පාසා වෙළඳ සැල් පිහිටුවූ අතර, 'ඔසුසල' ට අනුබද්ධව ඖෂධවේදීන් පුහුණුව ද සංවිධානය කරන ලදී.

3. සෞඛ්‍ය සැලසුම්

1994, 1995 වර්ෂවල දී සෞඛ්‍ය සේවාවල කළමණාකරණය, සංවර්ධනය සහ සැලසුම්වල සැලකිය යුතු වර්ධනයක් පෙන්නුම් කරයි. සමස්ත සැලසුම නමින් හඳුන්වන දස අවුරුදු සැලැස්ම (1995–2004) සකස් කරන ලදී. වර්තමානයේ විශේෂයෙන්ම අතුරු වෛද්‍ය සේවා පිරිස් වල පවතින හිඟය මඟහැරවීම සඳහා සෞඛ්‍ය මිනිස් බල සැලැස්මක් ද (1996–2005) පිළියෙල කරන ලදී. ජාතික සෞඛ්‍ය තොරතුරු පද්ධතිය තවදුරටත් දියුණු කිරීමේ අදහසින් ජාත්‍යන්තර සෞඛ්‍ය සංවිධානයේ සහාය මත, රේඛීය සහ පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශවල සෞඛ්‍ය සේවාවන්, පරිගණක ගත කිරීමේ සැලසුම් සකස් කරන ලදී. ආසියානු සංවර්ධන බැංකුවේ ආධාර මත ප්‍රාදේශීය සෞඛ්‍ය තොරතුරු පද්ධතියක් වර්ධනය කරන ලදී.

4. සෞඛ්‍ය යටිතල පහසුකම් සංවර්ධනය

සැලකිය යුතු සෞඛ්‍ය සම්පත් ප්‍රමාණයක් මධ්‍යකාලීන ආයෝජන සැලැස්ම මගින් හෝ විදේශාධාර ව්‍යාපෘති මගින් කුඩා පරිමාණයේ සෞඛ්‍ය ආයතන සංවර්ධනය සඳහා යොදවන ලදී. එසේම දැනට පවතින ගොඩනැගිලි පුනරුත්ථාපනය කිරීම සහ ජල සහ සනීපාරක්ෂක පහසුකම් සඳහා වැඩිපුර අවධානය යොමු කරන ලදී.

විමර්ෂණ කාලය තුළ දී, ආරෝග්‍යශාලා ගණනාවක තත්ත්වය ඉහල දමන ලදී. නිදසුනක් ලෙසත් දිස්ත්‍රික් ආරෝග්‍යශාලා 4ක් මූලික ආරෝග්‍යශාලා ලෙස ද, ප්‍රාදේශීය ඒකක 12ක් දිස්ත්‍රික් ආරෝග්‍යශාලා ලෙස ද, එක් මධ්‍යම බෙහෙත් ශාලාවක් සහ මාතෘ නිවාසයක් ග්‍රාමීය රෝහලක් ලෙස ද ඉහළ දැමීම දැක්විය හැකිය. මෙම කාලය තුළ දී ශ්‍රී ජයවර්ධනපුර ආරෝග්‍යශාලාවේ කැඩුම්, බිඳුම්, උගුර, කණ, නාස සහ ළමා ශල්‍ය වාට්ටු ද හෘත විද්‍යා ඒකකය ද සහ ක්ෂුද්‍ර ජීවී විද්‍යා ඒකකය ද නැවත විවෘත කරන ලදී.

1994 දී සෞඛ්‍ය සැපයුම් සඳහා රු. දශ ලක්ෂ 1,400ක් වැය කරන ලද අතර එය 1995 දී දශලක්ෂ 2,000 දක්වා වැඩි කරන ලදී. මීට අමතරව මෙම කාලය තුළ දී රු. දශ ලක්ෂ 210ක් වටිනා විවිධ.වෛද්‍ය උපකරණ සහ ගිලන් රථ 84ක් පළාත් සභා රෝහල් අතරේ බෙදා හරින ලදී. ශ්‍රී ජයවර්ධනපුර රෝහලට ඔටරී නිරීක්ෂණ යන්ත්‍රයක් ද සවිකරන ලදී. ජනතාවට සතුටුදායක සේවාවන් සැපයීම සඳහා ස්කෑනින් යන්ත්‍ර 3ක්, අධි ධ්වනි ස්කෑනින් යන්ත්‍ර 16ක්, වික්ටර්ක්‍රොම් යන්ත්‍ර 3ක්, කොබෝල්ට් යන්ත්‍ර 3ක් සහ ශල්‍ය ලේසර් කිරණ යන්ත්‍ර 4ක් සඳහා ඇණවුම් කරන ලදී.

(ඇ) දිළිඳු බව තුරන් කිරීම, කම්කරු, වෘත්තීය පුහුණු, සමාජ සේවා

1. සමෘද්ධි වැඩ සටහන

*1.1 හැඳින්වීම*

ප්‍රධාන සමාජ, ආර්ථික ප්‍රශ්න අතුරෙන් එකක් වන දිළිඳු භාවය විසඳීමට අවශ්‍ය සියලු දෑ එකම සෙවනක් යටතේ අන්තර්ගත කොට සැළසුම් කළ වැඩ සටහනකි "සමෘද්ධි" රට තුළ මෙන්ම ජාත්‍යන්තර වශයෙන් ද ලද අත්දැකීම් සැලකිල්ලට ගෙන මෙම සංකල්පය සකස් කර ඇත.

සමෘද්ධි ලාභීන්ගේ සහජ නිෂ්පාදන ව්‍යවසායකත්වයන් වැඩිදුර ශක්තිමත් කිරීමටත්, තරුණයන් මෙයට සම්බන්ධ කර ගැනීමත් සමෘද්ධි වැඩ සටහන යටතේ ඉතා වැදගත් සේ සැලකේ. කලින් ක්‍රියාත්මක කරන ලද වෙනත් වැඩසටහන් මෙන් නොව, සමෘද්ධි වැඩ සටහන මුළු රට පුරාම ක්‍රියාත්මක වන අතර, එය වෙනත් සංවර්ධන වැඩ සටහන් සමග විශේෂයෙන්ම ග්‍රාමීය ප්‍රදේශවල පවතින වැඩ සටහන් සමග නිෂ්පාදනමය සම්බන්ධකම් ඇති කිරීමට කටයුතු යොදයි.

### *1.2 අරමුණු සහ ප්‍රතිපත්ති*

1995 ජනවාරි මස 6 වැනි දින දී ගරු ජනාධිපතිනිය විසින් එතුමියගේ ප්‍රතිපත්ති, ප්‍රකාශනයේ දී දිළිඳුභාවය තුරන් කිරීම සහ සමෘද්ධි වැඩ සටහන සම්බන්ධයෙන් මූලික ප්‍රතිපත්තිය මෙසේ කෙටියෙන් සඳහන් කළා ය. "සෞඛ්‍යය, පෝෂණය, අධ්‍යාපනය හා වෘත්තීය පුහුණුව යන ක්ෂේත්‍රවල සිදු කෙරෙන ආයෝජනයන් මගින් රැකියා ජනිත කිරීමටත්, දිළිඳු ජනතාව අතර මානව සංවර්ධනය වැඩි දියුණු කිරීමටත් දරන ප්‍රයත්නයන්, සමෘද්ධි වැඩ සටහන මාර්ගයෙන් පරිපූරණය කෙරෙනු ඇත. අපට ලබා ගැනීමට ඇති අත්දැකීම් හොඳින් තෝරා බේරාගෙන, එම අවබෝධය මත පදනම් වී සහ ශ්‍රී ලංකාවේ මෙන්ම අනෙක් රටවල ද ඇති ඉතා හොඳ භාවිතයන් උපයෝගී කොට ගෙන මෙම වැඩ සටහන සකසා තිබේ. දිළිඳුකම තුරන් කිරීමේ සාර්ථක වැඩ සටහන්වල දී සිදු වන්නේ දිළිඳු ජනයා සහායක කණ්ඩායම් වශයෙන් ස්වාධීනවම සංවිධානය වීමයි.

ඉතිරි කිරීම් වැඩි කිරීමත්, ව්‍යාපෘතීන් සාර්ථකව දියුණු කිරීමටත්, වඩාත් ඉහළ ස්වශක්තීන් නිර්මාණය වීමටත් එය තුඩු දෙයි. මෙම ක්‍රියා දාමයට රාජ්‍ය නොවන සංවිධාන සහභාගී වීමත් වැදගත් වෙයි. සමෘද්ධි ව්‍යාපාරයට පහත සඳහන් අංග අයත් වෙයි.

* මෙම වැඩ සටහන ග්‍රාමීය මට්ටමෙන් අධ්‍යාපන ලබා ඇති තරුණ තරුණියන් අතුරෙන් තෝරා ගත් සමාජ සංවිධායකයින්ගේ බැඳීම හා කැපවීම ප්‍රයෝජනයට ගනු ඇත. 'සමෘද්ධි නියාමයකයන්' වශයෙන් හැඳින්වෙන මෙම සංවිධායකයින් සමෘද්ධි ව්‍යාපාරයේ ප්‍රතිලාභීන් තෝරා ගැනීම සඳහා තම තමන්ගේ ප්‍රදේශවල සමීක්ෂණයක යෙදීමෙන් තම කටයුතු අරඹනු ඇත.
* සමෘද්ධි ව්‍යාපාරයේ ඉලක්කය වන්නේ ආදායම් බෙදියැම අනුව බලන විට පහත මටටමේ සිටින ජනගහනයෙන් සියයට 30 සිට 35 දක්වා වන ජන සංඛ්‍යාවය. මීට 1,00,000 සිට 12,00,000 දක්වා වන පවුල් සංඛ්‍යාවක් අයත් වන අතර ඔවුන් අතුරින් 7,00,000 සිට 8,,50,000 ක් දෙනා අතිශය දිළිඳු මට්ටමේ ජීවත් වෙති. ඔවුන්ගේ ආදායම දීප ව්‍යාප්ත වශයෙන් අවම මට්ටමෙන් රු.1,600 සිට රු. 2,000 දක්වා වැඩි කිරීමට අදහස් කෙරේ.
* ඉතාම දිළිඳු පවුල් සිය කැමැත්තෙන්ම ඉතිරි කරන්නන් හා මතු ණය ලබා ගන්නන්/ ව්‍යවසායකයන් වශයෙන් බෙදීම අපේක්ෂා කෙරේ. ඉතිරි කරන්නන්ගේ ඉතිරි කිරීම්, පොළිය ද ලැබෙන පෞද්ගලික ඉතිරි කිරීම් බැංකු ගිණුමක තැන්පත් කෙරෙනු ඇත. පස් (5) වර්ෂයක් අවසානයේ දී හෝ අදාළ දිළිඳු පවුලට මාස හයක අඛණ්ඩ කාලයක් තුල මසකට රුපියල් 2,000 ක ආදායමක් (වෙනත් ආදායම් දීමනා ද ඇතුළුව ) ඉපයීමට හැකි වූ අවස්ථාවේ ප්‍රධාන තැන්පත් මුදල ලබාගත හැකි වනු ඇත.
* ව්‍යවසායකයන් ලෙසින් මතු ක්‍රියා කිරීමට බලාපොරොත්තුවෙන් සිටින්නන් ස්වේච්ඡා කණ්ඩායම් ලෙසින් සංවිධානය කරනු ලබන අතර, ඔවුන්ගේ ඉතිරි කිරීම් එක් එක් කණ්ඩායමේ සාමූහික බැංකු ගිණුමේ එකතු වෙනු ඇත. මෙම කණ්ඩායම් විසින් තමන් විසින්ම නිශ්චය කරන අතිරේක මුදල් ප්‍රමාණයක් ද ඉතිරි කරනු ඇත.

සමෘද්ධි වැඩ සටහනේ ප්‍රධාන අරමුණු පහත දැක්වේ.

(i) ප්‍රජාතාන්ත්‍රවාදය, සහභාගීත්වය, සාධාරණත්වය සහ ග්‍රාමීය සමාජ සංවර්ධනය පිළිබඳ පිළිගත් ප්‍රතිපත්ති අනුව වර්තමාන ආන්තික දිළිඳු කණ්ඩායම්වල තත්ත්වය වැඩි දියුණුකර එමගින් දිළිඳු භාවය තුරන් කිරීම.

(ii) ග්‍රාමීය කෘෂිකර්මය, ධීවර කර්මාන්තය, කුඩා කර්මාන්ත හා සේවා කාර්යයන් සම්බන්ධයෙන් නිසි පරිදි මැදහත් වී ග්‍රාමීය නිෂ්පාදනය සම්බන්ධ පදනම ශක්තිමත් කිරීම.

(iii) මානව සම්පත් සංවර්ධනය (විශේෂයෙන්ම තරුණ අය ඉලක්ක කරගත්) වැඩිදියුණු කිරීම.

(iv) දැනට පවතින සේවා වලින් කිසිම ලාභයක් ලැබ් නොමැති ග්‍රාමීය ජනතාවට උදව් කිරීම පිණිස සකසුරුවම් කම්, ඉතිරියන් ඒකරාශී කිරීම් හා ණය සැපයීම් මගින් විකල්ප බැංකු ක්‍රියාවලියක් සංවර්ධනය කිරීම

### 1.3 රජයේ උපකාරක ක්‍රියා හා ඉෂ්ට කිරීම්

1995 ජූනි මාසයේ දී මෙම වැඩ සටහන ආරම්භ විය. මෙතෙක් ඉටු කරන ලද කාර්යයන් පහත දැක්වේ.

#### 1.3.1 සමෘද්ධි බලකාය (නිලධාරි පිරිස)

කොට්ඨාශයේ සංවර්ධනය සඳහා ඒ ඒ ප්‍රදේශයෙන් ලබාගතහැකි සම්පත් හා එහි සමාජ ව්‍යුහය මත පදනම් වූ සුදුසු ව්‍යාපෘති තෝරා ගෙන ක්‍රියාත්මක කිරීම සඳහා සෑම ග්‍රාම නිලධාරි කොට්ඨාශයකම සමෘද්ධි බලකායක් පිහිටුවන ලදී. දැනට මුළු දිවයින පුරාම 23,000 ක සමෘද්ධි නිලධාරි පිරිසක් සංවර්ධන වැඩ කටයුතු වලට නියැලෙමින් සිටිති. ගමෙහි වැදගත් අයවන ගුරුවරු හා පූජ්‍ය පක්ෂය වැනි ප්‍රභූන්ගෙන් සමන්විත කමිටුවක් මගින් ඔවුන්ට උපදෙස් සපයනු ලැබේ.

#### 1.3.2 ඉතිරි කිරීම්

වැඩ සටහනෙන් මසකට රු. 1,000 ක් ලබන දුප්පත්ම පුද්ගලයින් විසින් මසකට රු. 200 බැගින් ද, මසකට රුපියල් 500ක් ලබන ඉතිරි උදවිය විසින් මසකට රු. 100 බැගින් ද, වශයෙන් සියලුම සමෘද්ධිලාභීන් විසින් ඔවුන්ගේ පරිපූරක ආදායමෙන් කොටසක් ඉතිරි කිරීමට උනන්දු කරනු ලැබේ. මෙම කාර්යය සාධනය කර ගැනීම පිණිස රුපියල් දශලක්ෂ 1.5 වටිනා ඉතිරි කිරීමේ පාස් පොත් දැනටමත් බෙදා හැර ඇත.

#### 1.3.3 පුහුණුව

වැඩ සටහනට අදාළ වූ පවුල් වලට ගැලපෙන ස්වයංරැකියා ව්‍යාපෘති පසුව සකස් කිරීම් වස්, ඊට සුදුසුකම් ඇති සමෘද්ධිලාභීන් තෝරා ගැනීම පිණිස "පවුල් තොරතුරු සමීක්ෂණයේ" යෙදවීමට සමෘද්ධි නියාමකවරුන් 23,000 ක් සහ සමෘද්ධි කළමනාකරුවන් 1,300 ක් පුහුණු කරන ලදී.

එම "පවුල් තොරතුරු සමීක්ෂණයේ" ප්‍රතිඵල අනුව, 1995 ඔක්තෝබර් වන විට පවුල් 12,01,108 කට සමෘද්ධි ප්‍රතිලාභ ලබා දී ඇත. මේ කාර්යය වෙනුවෙන් රජය මසකට රුපියල් දශලක්ෂ 487 බැගින් වැය කරයි.

#### 1.3.4 සංවර්ධන ව්‍යාපෘති

සමෘද්ධි නිලධාරි පිරිස විසින් කුඩා පරිමාණයේ වාරිමාර්ග, ජල සම්පාදන, මාර්ග හා ගොඩනැගිලි නිර්මාණ කටයුතු කිරීමට භාර ගනු ලැබ ඇත. 1995 ඔක්තෝබර් මැද භාගය වනවිට එවැනි ව්‍යාපෘති 10,143 ක් බිහි වී තිබේ. ඒ සෑම ව්‍යාපෘතියක්ම රුපියල් 10,000 බැගින් රජයෙන් ලබා ගනී. ඉදිරි අනාගතයේ දී රුපියල් 10,00,000 සිට 30,00,000 දක්වා පිරිවැය ඇති මහා පරිමාණයේ ව්‍යාපෘති ඇරඹීමට කටයුතු කෙරේ. මුදල් ආධාර සැපයීම පිණිස, සාර්ථකව ස්වයං රැකියා, ව්‍යාපෘති දිගටම කරගෙන යාහැකි පවුල්, අඩු ගණනේ පහක්වත්, සෑම ග්‍රාම නිලධාරි කොට්ඨාශයකින්ම හඳුනා ගන්නා ලෙස සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන් හට උපදෙස් දී තිබේ. සමෘද්ධි බලකාය හා සමෘද්ධි නියාමකවරුන්ගේ උදව් ඇතිව සුදුසු පවුල් හඳුනා ගැනීම කෙරේ.

#### 1.3.5 ශුභ සාධක ප්‍රතිලාභ

මෙම ශුභ සාධක ප්‍රතිලාභ ලබාගන්නා පවුල් තෝරා මට්ටම් දෙකකට කොටස් කර ආදායම් පරිපූරකය බෙදා දෙනු ලැබේ. එනම් රුපියල් 1,000 බැගින් හා රුපියල් 500 බැගිනි. ඒ අනුව පිහිටවීම අත්‍යාවශ්‍ය දිළිඳු පවුල්වල මාසික ආදායම රු. 1,500 ක් වේ.

එමෙන් ම මෙම වැඩ සටහන මගින් තනි සාමාජිකයෙකු සිටින පවුලකට මාසිකව රුපියල් 100 බැගින් ද, සාමාජිකයින් දෙදෙනෙකු සිටින පවුලකට මාසිකව රුපියල් 200 බැගින් ද ප්‍රතිපාදනය කර ඇත. දැනට දුප්පත් හා අසරණ පවුල් දශ ලක්ෂ 1.1 ක් මෙම සමෘද්ධි වැඩ පිළිවෙළින් ඵල ලබයි.

2. කම්කරු හා වෘත්තීය පුහුණු

ජනාධිපති කාර්යාලය
පුස්තකාලය

*2.1 සංවර්ධන අරමුණු හා අභිප්‍රායයන්*

"කම්කරු ප්‍රතිපත්තියේ" ප්‍රධාන අභිප්‍රායය නම්, ඉල්ලුම මත මෙහෙයවන වෘත්තීය අධ්‍යාපනයක් හා පුහුණුවක් ඔස්සේ පුහුණු වූ විනය ගරුක ශ්‍රම බලකායක් බිහි කිරීම මගින් සේව්‍යයා හා සේවකයා අතර මනා සබඳතාවයක් ඇතිකර එමගින් උදවන සාමකාමී කාර්මික වාතාවරණයක් මගින් ජාතික සංවර්ධනයට දායක වීමයි.

රැස්වීමේ හා සංවිධානය වීමේ නිදහස සහ සාමූහිකව කේවල් කිරීමේ අයිතිය තවදුරටත් වැඩි දියුණු කිරීමත්, ශ්‍රමය පුරා කැම වැලැක්වීමේ කොන්දේසි ශක්තිමත් කිරීමත් "ජාතික කම්කරු ප්‍රඥප්තිය" මගින් සහතික කරන්නේය. සේව්‍යයන් විසින් වෘත්තීය සමිති අනිවාර්යයෙන්ම පිළිගනු ලැබීමත්, එමගින්, සේව්‍යයා එහි සාමාජිකයින්ට අදාළ වූ කරුණු පිලිබඳව සාකච්ඡා කිරීමත් මෙම ප්‍රඥප්තිය මගින් ප්‍රතිපාදනය කර ඇත. සේව්‍යයා විසින් වෘත්තීය සමිති විරෝධීව, සේවකයාට පහත්සේ සැළකීම අසාධාරණ කම්කරු ක්‍රියාවකි. තමාගේ ආයතනය වසා දමන සේව්‍යයන් විසින් එහි සේවකයන් උපයා ගත් වැටුප් සහ ව්‍යවස්ථාපිත වගකීම් සම්බන්ධයෙන් ඉටු කළ යුතු යුතුකම් සම්පූර්ණ කරනු ලැබීම පිණිස, ඔවුන් කැඳවා ඔවුනට දන්වා සිටිනු ලැබේ. නිත්‍ය රැකියාවලට පුහුණු වන්නන් සහ අභ්‍යාසලාභීන් පත් කිරීම තහනම්ය. සේවකයින්ට ඔවුන්ගේ වේතනය හා සේවා කොන්දේසි සඳහන් කර ලිපි නිකුත් කිරීම අනිවාර්ය කර ඇත.

*2.2. අංශ ගත වැඩ සටහන*

*2.2.1. සමාජ රක්‍ෂණය සේවක අර්ථ සාධක (EPF) හා සේවක භාරකාර අරමුදල (ETF) :*

මේ පනත් පිලිබඳ නීති තදබල ලෙස ක්‍රියාත්මක කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් ඉහත සඳහන් අරමුදල්වලට ගලා එන දායක මුදල් සැළකිය යුතු සේ වැඩි වී ඇත. 1994 අගෝස්තු සිට 1995 සැප්තැම්බර් දක්වා සේවක අර්ථ සාධක අරමුදලට එවූ දායක මුදල් හා වැඩිපුර මුදල් ආපසු ගෙවීම් ප්‍රමාණය රුපියල් දශ ලක්‍ෂ 8,564 ක් විය. (මෙය 19% ක වැඩිවීමකි.) සේවක භාරකාර අරමුදලේ දායකත්වය 1994 දී රුපියල් දශ ලක්‍ෂ 100 ක් වූ අතර, 1995 දී එය රුපියල් දශ ලක්‍ෂ 130 දක්වා වැඩිවිය. මාසිකව මුදල් ලබාගන්නා ඉල්ලුම්කරුවන් ගණන, 1994 අගෝස්තුවේ දී 5,895 ක් වූ අතර, එය 1995 සැප්තැම්බර් වන විට 7,423 දක්වා වැඩි විය. මාතර හා මහනුවර ප්‍රදේශවල දායක මුදල් ගෙවන්නන්ගේ අවශ්‍යතා සපුරාලීම පිණිස එම ප්‍රදේශවල ශාඛා කාර්යාල දෙකක් විවෘත කරන ලදී.

*2.2.2 සංක්‍රමණික කම්කරුවන් සඳහා පුහුණු හා ශුභ සාධක පහසුකම්*

මේ වර්ෂය තුළ දී විදේශ රැකියා ක්ෂේත්‍රය සම්බන්ධයෙන් ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය (SLBFE) විසින් ක්‍රියාකාරී කොටසක් ඉටු කරන ලදී. රැකියා සඳහා කොරියාව සමග ද, පුහුණු කිරීම් සඳහා ජපානය සමග ද ගිවිසුම් අත්සන් කෙරිණි.

පිටත රැකියාවලට යන අයගෙන් එම විදේශ රැකියාවෙන් ඔවුන්ගේ ඉපයීම් ප්‍රමාණය මත පිහිටා රු. 2,000-10,000 දක්වා වූ "බඳවා ගැනීමේ ගාස්තුවක්" අය කරනු ලැබේ. එම මුදල් යොදවනු ලබන්නේ ශුභසාධක කටයුතු, පුහුණු කිරීම් සහ රක්‍ෂණ යෝජනා ක්‍රම ආදිය වෙනුවෙනි. රක්‍ෂණ ක්‍රමයේ උපරිම ප්‍රතිලාභය, රුපියල් 1,25,000 කි. මෙම යෝජනා ක්‍රමය මගින් විදේශ ගතවන කම්කරුවන්ගේ පවුල්වල සාමාජිකයින්ගේ වෛද්‍ය පහසුකම් හා අධ්‍යාපන කටයුතු ද ආවරණය වනු ඇත.

1994 සැප්තැම්බර් මස සිට 1995 මාර්තු මස දක්වා කාලය තුළ දී කරදරවලට මුහුණදුන් පුද්ගලයන් 543 දෙනෙක් රුපියල් දශ ලක්‍ෂ 9.2 ක රජයේ වියදමින් ආපසු ගෙන්වා ඇත. විදේශ සේවා නියුක්ති කාර්යාංශය විසින් විදේශ ගත කම්කරුවන්ගේ පැමිණිලි ගණනාවක් පරීක්‍ෂා කරගෙන යනු ලබන අතර, විදේශීය සේව්‍යයන්ගෙන් හා කණ්ඩායම්වලින් රුපියල් දශ ලක්‍ෂ 13 ක් වන්දි ලබාගෙන ඇත.

වි. සේ. නි. කායඹාංශය අප රටෙහි කම්කරුවන් විදේශ රැකියා සඳහා පුහුණු කිරීමේ වැඩ සටහනක් අරඹා ඇත. එම පුහුණු කිරීම් ක්ෂේත්‍රයන් නම් ප්‍රුකී මහත යන්ත්‍ර ක්‍රියාකරවීම, ඉංග්‍රීසි භාෂාව හා ගෘහ පාලනයයි. මෙම පුහුණු කිරීම් වැඩ සටහන් සඳහා පහසුකම් සැලසීම හා විදේශ රැකියා ඉල්ලුම් පත් ක්‍රියාවලිය කඩිනම් කිරීම සඳහා විදේශ සේවා නියුක්ති කායඹාංශය මගින් දිස්ත්‍රික් කාර්යාල 12 ක් පිහිටුවා තිබේ. මෙම පුහුණුව සඳහා ගාස්තුවක් අය නොකරන අතර, මේ වර්ෂය අග සිට එය අනිවාර්ය කරනු ලැබේ.

| පුහුණු පාඨමාලාව | 1994 | 1994 අගෝ. 1995 සැප්. |
|---|---|---|
| ගෘහ සේවකයන් | | |
| (i) මැද පෙරදිග | 1,093 | 2,204 |
| (ii) සිංගප්පූරු | – | 680 |
| ප්‍රුකී මැෂින් ක්‍රියාකරු | 175 | 125 |
| ඉංග්‍රීසි භාෂාව | 459 | 168 |

### 2.2.3 කාර්මික හා වෘත්තීය පුහුණුව

කම්කරු දෙපාර්තමේන්තුවේ වෘත්තීය පුහුණු වැඩ සටහන් යටතේ, මේ වර්ෂය තුළ දී පාසැල් හැර යන්නන් 6,150 ක් පමණ පුහුණු කරන ලදී. වෘත්තීය පුහුණු වැඩ සටහන සංවර්ධනය කර ශක්තිමත් කිරීම සඳහා 1995 අගෝස්තුවේ දී වෘත්තීය පුහුණු අධිකාරිය පිහිටුවන ලදී. කම්කරු දෙපාර්තමේන්තුවේ මිනිස්බල අංශයේ පොර්මන්වරු (Foremen) පුහුණු කිරීමේ ආයතනයේ කායඹයන් මෙම අධිකාරියට පවරා ඇත.

කාර්මික පුහුණු ක්ෂේත්‍රය තුළ ඒකක 33කින් යුක්ත අනුබද්ධ කාර්මික ඒකක දෙකක් දෙහිඅත්තකණ්ඩියේ දී සහ මාතලේ දී විවෘත කරන ලදී.

1995 දී හඳුන්වා දෙන ලද පාඨමාලා නම්, පරිගණක පුහුණුව, ෆයිබර් විදුරු සම්බන්ධ පුහුණුව සහ ඒ ඒ ප්‍රාදේශීය කලාපවලට සුදුසු පුහුණු පාඨමාලාවන්ය. "ජාතික කාර්මික ගුරු පුහුණු විද්‍යාල" "ජාතික කාර්මික අධ්‍යාපන ආයතනය" නමින් නැවත නම් කර, එම ආයතනයේ විෂයමාලා සංවර්ධනය හා මානව සම්පත් සංවර්ධන වැඩි දියුණු කිරීම උදෙසා උපදේශක කමිටුවක් පත් කරන ලදී.

කාර්මික ගුරුවරුන් පුහුණු කළ ප්‍රමාණය 1994 දී 122 ක් වූ අතර, 1995 දී එය 264 දක්වා වැඩි විය. යාපනය හා මඩකලපුව විද්‍යාලවල හැර පුහුණුවීම් සඳහා ඇතුළත් වූ මුළු ශිෂ්‍ය සංඛ්‍යාව 1994 දී 18,141 ක් වූ අතර, 1995 දී 18,695 දක්වා වැඩි විය.

ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු අධිකාරියේ ශිෂ්‍යයින්ට මාසික දීමනාවක්ද, ජංගම පුහුණු මධ්‍යස්ථානවල ශිෂ්‍යයන්ට දෛනික දීමනාවක් ද ගෙවන අතර, මෙතෙක් කාර්මික විද්‍යාලවල ශිෂ්‍යයින්ට කිසිම දීමනාවක් ගෙවා නොමැත. මෙම අක්‍රමිකතාවය ඉවත්කිරීම සඳහා 1996 සිට කාර්මික විද්‍යාලවල පූර්ණ කාලීන ශිෂ්‍යයන් සඳහා රුපියල් 20 ක දෛනික දීමනාවක් ගෙවීමට අමාත්‍ය මණ්ඩලය තීරණය කර ඇත.

## 3. සමාජ සේවා

### 3.1 හැඳින්වීම

සමාජ සේවා අංශයේ ප්‍රධාන අරමුණ නම්, සමාජයේ සිටින දුප්පත් සහ අසරණභාවයට පත් කණ්ඩායම්වල ජීවන තත්ත්වයන් නගා සිටුවීමයි. සමාජ සේවා අමාත්‍යාංශය හා ඒ යටතේ පවතින ආයතන මහජනතාවගේ ශුභ සාධනයට අදාළ අනේකවිධ වැඩ සටහන්වල නිරත විය.

### *3.2 ආබාධිත අය සම්බන්ධ වැඩසටහන්*

ආබාධිත අය සඳහා වූ ප්‍රජා මූලික පුනරුත්ථාපන වැඩසටහන් යටතේ ආබාධිත පුද්ගලයින් හඳුනා ගැනීම, ස්වේච්ඡා සේවකයින් පුහුණු කිරීම සහ සමාජමය සජීවීකරණය පිණිස කොට්ඨාශ 55කට රුපියල් දශලක්ෂ 7.9ක මුදලක් වෙන් කරන ලදී. ආබාධිත පුද්ගලයින් 1,76,337ක් හඳුනා ගන්නා ලදී. දෙපාර්තමේන්තු ප්‍රධානීන් පුහුණු කිරීම, කළමනාකාරිත්වය ක්‍රියාකාරී කමිටු සාමාජිකයින් පුහුණුව, සහ ප්‍රජා මූලික කණ්ඩායම් පුහුණුව වෙනුවෙන් රුපියල් දශලක්ෂ 4.4ක් වැය කරන ලදී.

සහන සේවා යටතේ අංග විකල අය වෙනුවෙන් රුපියල් දශලක්ෂ 7.6ක් වැය විය. කිහිලිකරු 27ක්, රෝද පුටු 57ක්, ශ්‍රවණ ආධාරක 131ක් හා ඇස් කණ්ණාඩි 2,167ක් බෙදා දෙන ලදී. වෘත්තීය පුහුණුව ලද ආබාධිත අය 573 දෙනා අතුරෙන් 209 දෙනෙකුට ස්වයං රැකියා සඳහා අවශ්‍ය උපකරණ සපයා දෙන ලදී.

9,00,000 පමණ වූ ආබාධිත පුද්ගලයින්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම් වස් (එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තිය අනුව සකස් කළ) නීති කෙටුම්පත් අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇත. ආබාධිත පුද්ගලයින් සම්බන්ධ කටයුතු සම්බන්ධීකරණය කරනු පිණිස "ජාතික මණ්ඩලයක්" සහ "මහලේකම් කාර්යාලයක්" පිහිටුවීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගෙන තිබේ. 1995 දෙසැම්බර් 03 දින "ආබාධිතයන්ගේ දිනය" සැමරීමට පිළියෙල කරගෙන යනු ලැබේ.

### *3.3 අපහසුතාවයන්ට භාජනය වූ කාන්තාවන් පුනරුත්ථාපනය කිරීම*

ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව විසින් සංවිධානය කරන ලද වැඩ සටහනක් යටතේ, ගංගොඩවිල නිවර්තන නිවාසයේ කාන්තාවන් 200ක් පුනරුත්ථාපනය කරගෙන යනු ලැබේ. මහජන ආධාර ලබන්නන් 325 දෙනෙකුට ස්වයං රැකියා අවස්ථාවන් සැලසීමට කටයුතු කරමින් සිටී.

### *3.4 ව්‍යසන (ආපදා) සම්බන්ධ කළමනාකරණය*

ස්වභාවික හා වෙනත් වර්ගවල ව්‍යාසනයන් නිසා පැනනගින හදිසි අවස්ථාවන්ට මුහුණ දීම සඳහා ජාතික සම්බන්ධීකරණ කමිටුවක් ලෙස, 'ආපද කළමනාකරණ මහලේකම් කාර්යාලයක්', පිහිටුවීමට අමාත්‍ය මණ්ඩලය විසින් අනුමැතිය දී තිබේ. ජල ගැලීම්, නාය යාම්, සුළි සුළං සහ වල් අලි උවදුරු වෙනුවෙන් ආධාර කිරීමට රුපියල් දස ලක්ෂ 150ක් ප්‍රතිපාදනය කරන ලදී. නැවත නිර්මාණය කරන ලද නිවාස සංඛ්‍යාව 52,923කි.

"ලෝක ආධාර වැඩ සටහන්" (WFP) සමග සහයෝගිතාවයෙන් රජය විසින් මුදල් අය කිරීමක් නොකර සහල් මෙට්‍රික් ටොන් 7,528ක් ද, සීනි මෙට්‍රික් ටොන් 376ක් ද, පරිප්පු මෙට්‍රික් ටොන් 214ක් ද, පොල්තෙල් බෝතල් 6,27,366ක් ද, පුත්තලම, අනුරාධපුර, මාතලේ, කුරුණෑගල, කොළඹ සහ පොළොන්නරුව දිස්ත්‍රික්ක වල අවතැන් ගතවූ 52,278 දෙනෙකුට සපයන ලදී.

### *3.5 වෘද්ධ ජනගහනය සම්බන්ධ වැඩසටහන*

වෘද්ධ ජනගහනය වෙනුවෙන් ජාතික ප්‍රතිපත්තියක් සකස් කර ඇමති මණ්ඩලය විසින් අනුමත කර ඇත. ඔක්තෝබර් පළමුවෙනි දිනට යෙදුන "වැඩිහිටි දිනය" සමරනු වස් ආගමික, සංස්කෘතික සහ අධ්‍යාපනික වැඩ සටහන් කිහිපයක්ම ක්‍රියාත්මක කරන ලදී. එදින අලුත් මුද්දරයක් ද නිකුත් කෙරිණ. "වැඩිහිටියෝ" නම් සඟරාවේ මුද්‍රණ දෙකක් පිටකරන ලදී. රුපියල් දශ ලක්ෂ 4ක් වැයකර, කතරගම සහ කටුවන යන ස්ථානයන්හි වැඩිහිටි නිවාස දෙකක් ගොඩ නගන ලදී.

### *3.6 සමාජ රක්ෂණ යෝජනා ක්‍රමය*

ස්වයං රැකියාවල නිරත අය වෙනුවෙන් සමාජ රක්ෂණ හා විශ්‍රාම වැටුප් ක්‍රමය සම්බන්ධ කළමනාකරණ කටයුතු සඳහා "සමාජ ආරක්ෂණ මණ්ඩලයක්" පිහිටුවීම් පනත අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කර ඇත.

*3.7 නඩත්තු දීමනා*

ගත වූ වර්ෂ අටක කාලය තුළ එක් අයෙකුට රුපියල් 100 බැගින් හා රු. 120 බැගින් වැටෙන සේ ආබාධිතයින්, වෘද්ධයින් හා ළමුන් නඩත්තුව පිණිස, රාජ්‍ය නොවන සංවිධානවලට ගෙවීම් කර තිබුණි. දැන් මෙම දීමනාව රු. 300 දක්වා වැඩිකර ඇත.

*3.8 ළමාරක්ෂක සේවා*

ළමා දූෂණය සහ ගණිකා වෘත්තියෙන් දරුවන් රැකගැනීම පිණිස දැනුවත් කිරීමේ වැඩ සටහන් හයක් දියත් කරන ලදී. ළමා නිවාස, රැඳවුම් නිවාස, හා සහතික පාසැල් ප්‍රතිසංස්කරණය හා පුනරුත්ථාපනය කිරීම පිණිස රුපියල් දශලක්ෂ 7.32ක් වැය කරන ලදී. කොළඹ තුළ ක්‍රියාත්මක වන දිවා සුරැකුම් වැඩසටහනක් යටතේ රුපියල් 34,750ක් වැය කරමින් වීදිවල හැසිරෙන ළමුන් සමහරක් පුනරුත්ථාපනය කෙරුණි. තවත් සියයක් දෙනෙකුට "රාත්‍රිය ගතකිරීමට නිවහන්" සහ අධ්‍යාපනය ද සපයනු ලැබේ.

මහජනයා දැනුවත් කිරීමේ වැඩසටහන්වල ප්‍රතිඵලයක් වශයෙන් ළමුන් 153 දෙනෙකු ළමා මෙහෙකාර තත්ත්වයෙන් ඉවත්කරගත හැකි විය. මුදලින් ආධාර සපයන වැඩසටහන යටතේ, ඉතාම දුගී පවුල්වලට ළමයකුගේ කටයුතු කිරීම සඳහා රු. 200ක මුදලක් මාස්පතා ගෙවනු ලැබේ. මෙම වැඩ සටහනෙන් ඵල නෙලන ලාභීන් 508ක් දැනට සිටිති. වයඹ සහ සබරගමුව පළාත්වල රජයේ කැඳවුම් නිවාසවලට KOICA විදේශ ආධාර යටතේ රුපියල් දශලක්ෂ 7.2ක් වටිනා උපකරණ ලබා ගත හැකි විය.

*3.9 සමාජ සේවා අධ්‍යාපනය*

සමාජ සංවර්ධනය හා සමාජ සේවය සම්බන්ධ පුහුණු කටයුතු සඳහා "ජාතික සමාජ සංවර්ධන ආයතනයට" රුපියල් දශලක්ෂ 8ක් වෙන්කරන ලදී. 1995 වර්ෂයේ දී ශිෂ්‍යයින් 43ක් "සමාජ සේවා ඩිප්ලෝමා" අධ්‍යාපන වැඩ සටහන සම්පූර්ණ කළ අතර, ශිෂ්‍යයන් 44 දෙනෙක් විසින් ක්ෂේත්‍ර පුහුණුව නිම කරන ලදී. තවත් ශිෂ්‍යයෝ 35 දෙනෙක් "ළමා සංවර්ධන පාඨමාලාව" හදාරමින් සිටිති.

ආයතනයේ පුහුණු වැඩසටහන්වලට පිටුබලදීම සඳහා සමාජ සේවය සම්බන්ධ ලියකියවිලි පරිවර්තනය කිරීමේ වැඩ සටහනක් ආරම්භ කර ඇත.

*3.10 රාජ්‍ය නොවන සංවිධාන*

රාජ්‍ය නොවන සංවිධාන මගින් ක්‍රියාත්මක කෙරෙන වැඩ සටහන් සම්බන්ධ තොරතුරු පැහැදිලි කිරීමේ හා මූලික වශයෙන් ක්‍රියා කිරීම පිණිස, "රාජ්‍ය නොවන සංවිධාන සඳහා මහ ලේකම් කාර්යාලයක්" පිහිටුවීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇත.

යම් ස්වෙච්ඡා සමාජ සේවා සංවිධානයකට එරෙහිව, එහි වංචා හා අයුතු සහගත ලබාගැනීම් සම්බන්ධ සාක්ෂි පවතින බව පරීක්ෂණ මණ්ඩලයක් විසින් වාර්තා කළ විට එම සංවිධානයේ පරිපාලනය භාර ගැනීම පිණිස අන්තර් කළමනාකරණ මණ්ඩලයක් ඇමතිවරයාට පත් කිරීමට හැකි වන සේ, "1980 අංක 31 දරන ස්වෙච්ඡා සමාජසේවා සංවිධාන පනත" සංශෝධනය කර ඇත.

## *(ඈ) මානව ජනාවාස, නිවාස, ජල සම්පාදනය, පරිසරය*

1. නිවාස සංවර්ධනය

*1.1 අරමුණු සහ ප්‍රතිපත්තිය*

නිවාස සංවර්ධනය සම්බන්ධයෙන් රජයේ මැදිහත්වීම පැහැදිලි ප්‍රවේශයන් දෙකකට සීමාවේ. පළමුවැන්න අඩු ආදායම් ලබන පවුල්වලට නව නිවාස සාදා ගැනීමට හෝ ඔවුන්ගේ නිවාස වැඩි දියුණු කර ගැනීමට ඔවුන්ගේ හැකියාව පදනම් කරගෙන ආධාර සැපයීමයි. දෙවැන්න රාජ්‍ය සහ පෞද්ගලික දෙ අංශයෙහිම මූල්‍ය ආයතනවලට නිවාස සංවර්ධනයෙහි ලා සක්‍රීය ණය දෙන ආයතන ලෙස ක්‍රියා කළ හැකි වනසේ නිවාස මූල්‍ය පද්ධතිය ශක්තිමත් කිරීමයි.

මූලික පොදු පහසුකම්වලින් යුත් ඔබින නිවහනක් සෑම පවුලක් සඳහාම සැපයීමේ සිහිනය සැබෑ කරගැනීම, නිවාස සංවර්ධනයේ ප්‍රධාන අරමුණය. නිවාස සංවර්ධනය සම්බන්ධයෙන් මැදිහත් වීමේ උපාය මාර්ගයේ ප්‍රධාන පෙළඹවීම් වනුයේ තමන්ගේ නිවාස අවශ්‍යතා සපුරාගැනීමට විශේෂිත ඉලක්ක කණ්ඩායම් වලට ආධාර සැපයීම සහ විවිධ බාධකයන් ඉවත්කිරීමෙන් නිවාස සංවර්ධන ක්‍රියාවලිය පහසුකරවීම ආදියයි. නිවාස සංවර්ධනය වැඩ සටහන සකස්කර ඇත්තේ නාගරික, ග්‍රාමීය සහ වතු අංශයේ මෙන්ම යුද්ධය බලපෑ ප්‍රදේශවල ද වෙසෙන පවුල්වල උවමානාවන් සැලකිල්ලට ගැනීමෙනි, තවද ගොඩනැගිලි ද්‍රව්‍යවල අධික මිල, නිවාස ණය පිළිබඳව ඇති වැඩි පොලී අනුපාතයන් සහ නිවාස තැනිය හැකි ඉඩම්වල අධික මිල වැනි බාධකයන් ඉවත්කිරීම තුළින් නිවාස ඉදිකිරීමට පියවරයන් ගනු ඇත. මේ තුළින් පුද්ගලයන්ට මෙන්ම පෞද්ගලික අංශය යන දෙකොටසටම නිවාස ඉදිකිරීමට පහසුකම් සැලසෙනු ඇත.

*1.2 ප්‍රගතිය සහ අනාගත කටයුතු*

ජාතික නිවාස සංවර්ධන අධිකාරිය, නිවාස සංවර්ධන වැඩ සටහන ක්‍රියාත්මක කිරීමේ ප්‍රධාන ආයතනය ලෙසින් නිවාස සංවර්ධන වැඩ සටහන් කිහිපයක් 1995 තුළ දී ක්‍රියාත්මක කර තිබේ. නිවාස සියයේ මැතිවරණ කොට්ඨාශ වැඩසටහන, නාගරික නිවාස වැඩසටහන, ග්‍රාමීය නිවාස වැඩසටහන, වතු නිවාස වැඩසටහන, ආපදා නිවාස වැඩසටහන, ආදිය 1995 තුළ දී ක්‍රියාත්මක කෙරේ. මෙම වැඩසටහන් සඳහා ඇස්තමේන්තුගත වියදම රු. මිලියන 2015 ක් වන අතර මේ තුළින් පවුල් 55,313 කට වාසි සැළසෙනු ඇත. මීට අමතරව ජපන් ආධාර යටතේ ලැබෙන ගොඩනැගිලි ද්‍රව්‍ය සැපයීමෙන් දුප්පත් පවුල් 11,153 ක් 1995 තුළ දී ලාභ ප්‍රයෝජන ලබනු ඇත.

*1.3 ප්‍රධාන වැඩසටහන්*

ප්‍රධාන නිවාස වැඩසටහන් සවිස්තරාත්මකව පහත දැක්වේ.

*1.3.1 නිවාස 100 මැතිවරණ කොට්ඨාශ වැඩසටහන*

1995 ජනාවාරි සිට ආරම්භ කරන ලද මැතිවරණ කොට්ඨාශයක නිවාස 100 බැගින් ඉදිකිරීමේ වැඩසටහන යාපනය, කිලිනොච්චිය, මන්නාරම සහ මුලතිව් දිස්ත්‍රික්කය හැර දිවයිනේ අනෙක් සියළු ප්‍රදේශවල ක්‍රියාත්මක වේ. මේ යටතේ දැනට නිවාස 1,500 ක් ඉදිකිරීම් කටයුතු ආරම්භ කර ඇත. ඉතිරි නිවාස 13,500 ඉදිකිරීම් කටයුතු ජාතික නිවාස සංවර්ධන අධිකාරිය විසින් 1996 වසර තුලදී ක්‍රියාත්මක කරනු ඇත.

*1.3.2 නිවාස ඉදිකිරීම් සඳහා සෙවිලි තහඩු සැපයීමේ වැඩ සටහන*

ජපන් රජය මගින් ප්‍රදානය කරනු ලබන ද්‍රව්‍යමය ආධාර යටතේ නිවාස ඉදිකිරීම වෙනුවෙන් ඉතා දිළිඳු පවුල් සඳහා ඉහත කී ආධාර බෙදාදීම නොකඩවා ක්‍රියාත්මක කෙරේ. වහල දක්වා ඉදිකිරීම් කටයුතු සම්පූර්ණ කරන ලද නිවාස ලාභීන් 2,946 දෙනෙකුට අදාළ කාලය තුළ දී මෙම ආධාර සපයනු ලැබීය. මෙම වැඩ සටහනේ පළමුවන අදියර යටතේ පවුල් 6,345 කට ප්‍රතිලාභ සැපයුනු අතර, තවත් පවුල් 11,155 කට දෙවැනි අදියර යටතේ ප්‍රතිලාභ සැපයෙනු ඇත.

*1.3.3 මුහුදුබඩ පදිංචිකරුවන් නැවත පදිංචි කිරීමේ වැඩසටහන*

මුහුදුබඩ වෙසෙන පැල්පත් වාසී පවුල් අත්තිඩිය ප්‍රදේශයේ නැවත පදිංචි කරවීම සඳහා රු. මිලියන 25 ක් වියදමින් නිවාස 192 ක ඉදිකිරීම් කටයුතු ආරම්භ කරන ලදී. 1995 සැප්තැම්බර් මාසය වන විට මෙයින් නිවාස 95 ක තැනීම් කටයුතු නිමවී තිබීණ.

*1.3.4 වතු නිවාස වැඩසටහන*

ගොඩනැගිලි ද්‍රව්‍ය, ඉඩම් සහ ණය මුදල් වශයෙන් ආධාර ලැබීමට සුදුසු, වතුකරයේ පවුල් 730 ක් නුවරඑළිය, බදුල්ල සහ රත්නපුර දිස්ත්‍රික්කවලින් දැනටමත් හඳුනාගෙන ඇත. මෙම ජනාවාස සඳහා පානීය ජලය, සනීපාරක්ෂක කටයුතු සහ මතුපිට ජලාපවහනය වැනි පොදු පහසුකම් සැපයීමට සැලසුම් කර තිබේ. මීට අමතරව වැවිලි නිවාස සහ සමාජ සුභසාධනය භාරය මගින් ද තවත් පවුල් 374 කට නිවාස ණය ආධාර සපයා තිබේ.

1.3.5 අඩු ආදායම් නිවාස ණය වැඩසටහන

අඩු ආදායම් පවුල් සඳහා වූ නිවාස ණය වැඩසටහන ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ මගින් නොකඩවා කරගෙන යනු ඇත. අදාළ කාලය තුළ දී පවුල් 3,546 කට එවැනි ආධාර ලැබුන අතර, දෙන ලද ණය මුදලේ වටිනාකම රු. මිලියන 21 කි.

1.3.6 පහල මධ්‍යම පංතික නිවාස ණය වැඩසටහන

පහල මධ්‍යම සහ මධ්‍යම පංතික පවුල් සඳහා නිවාස ණය සැපයීම නොකඩවා කරගෙන යනු ඇත. ණය දීමේ කටයුතු කරනු ලබන ප්‍රධාන මූල්‍ය ආයතනය වනුයේ නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාව සහ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවයි. මේ යටතේ පවුල් 3,200ක් රු. මිලියන 320 ක පමණ මුදලක් නිවාස ණය වශයෙන් ලබාගෙන ඇත.

2. ජල සම්පාදනය

*2.1 ප්‍රධාන යෝජනා ක්‍රම*

ජාතික ජලසම්පාදන සහ ජලාපවහන මණ්ඩලය ජල සම්පාදනය පහසුකම් සැලසුම් කිරීම්, සකස් කිරීම්, ඉදිකිරීම් සහ ඒවායේ පුනරුත්ථාපනය, ක්‍රියාකාරීත්වය සහ නඩත්තුව සම්බන්ධ කටයුතු නොකඩවා කරගෙන යයි. 1995 සැප්තැම්බර් මාසය දක්වා මේ සඳහා වූ මුළු වියදම රු. මිලියන 3,330 කි. ඉදිකිරීම් සහ පුනරුත්ථාපනය සඳහා අවශ්‍ය ආයෝජනයෙන් 60% ක් පමණ විදේශ ණය වශයෙන් ලබාගෙන ඇත.

අදාල කාලය තුළ දී පහත සඳහන් ජල සම්පාදනය යෝජනා ක්‍රමයන්හි ඉදිකිරීම් කටයුතු අවසන් කර ඒවායේ ක්‍රියාකාරීත්වය ද පටන්ගෙන තිබේ.

| යෝජනා ක්‍රමයේ නම | මුළු වියදම රු. මිලියන | සේවය කරන පුද්ගලයින් සංඛ්‍යාව |
|---|---|---|
| 1. හික්කඩුව - දොඩන්දූව | 107 | 17,200 |
| 2. මාතර | 247 | 1,07,000 |
| 3. වැලිගම | 170 | 11,700 |
| 4. තංගල්ල | 144 | 9,300 |
| 5. හම්බන්තොට | 244 | 33,900 |
| 6. හුංගම | 39 | 15,300 |
| 7. පොළොන්නරුව - දෙවන අදියර | 23 | 3,300 |
| 8. තලාතුඔය - පළමු අදියර | 20 | 3,000 |
| 9. රත්න | 160 | 11,500 |
| 10. හෝමාගම | 40 | 5,000 |
| 11. දිවුලපිටිය | 80 | 6,000 |
| 12. හාරිස්පත්තුව | 45 | 10,000 |

### 2.2 ග්‍රාමීය ජල සම්පාදනය සහ සනීපාරක්ෂාව

ග්‍රාමීය ප්‍රදේශයන්ට පානීය ජලය සහ සනීපාරක්ෂාව සැපයීම සඳහා ප්‍රජා සහභාගීත්ව ප්‍රවේශයෙහි ඇති යෝග්‍යතාව අධ්‍යයනය කිරීමේ අරමුණින්, අත්හදාබැලීම් පදනමක් මත රත්නපුර, බදුල්ල සහ මාතර යන දිස්ත්‍රික්කයන්හි ප්‍රජා ජලසම්පාදන සහ සනීපාරක්ෂක ව්‍යාපෘතිය ක්‍රියාත්මක වෙමින් පවතී. පහත දැක්වෙන කටයුතු මෙම ව්‍යාපෘතිය යටතේ ක්‍රියාත්මක වේ.

* ග්‍රාමීය ජලසම්පාදනය සහ සනීපාරක්ෂණය

  ග්‍රාමීය ජලසම්පාදනය සහ සනීපාරක්ෂක ව්‍යාපෘතින් 219 ක් හඳුනාගෙන ඇති අතර ඉදිකිරීම් කටයුතු ද පටන් ගෙන ඇත.

* පාසැල් ජලසම්පාදන සහ සනීපාරක්ෂණය

  පාසැල් 407 ක් හඳුනාගෙන ඇති අතර මෙයින් පාසැල් 90 කට ජලය සහ සනීපාරක්ෂණ පහසුකම් සපයා ඇත.

* කුඩා නගර සඳහා ජල සම්පාදන සහ සනීපාරක්ෂණය

  කුඩා නගර 17 ක් හඳුනාගෙන ඇති අතර යෝජනාක්‍රම 6ක ඉදිකිරීම් කටයුතු ද අවසන් කර ඇත.

## 3. පාරිසරික ආරක්ෂණය

### 3.1 හැඳින්වීම

පාරිසරික කළමනාකරණය පිළිබඳ රජයේ උත්සාහයක් පසුගිය අවුරුදු කිහිපය මුළුල්ලේම ශක්තිමත් කෙරිණ. පරිපාලන ව්‍යුහයන් ඇති කිරීම, ව්‍යවස්ථාදායක පියවරයන් සහ පරිසරයට සම්බන්ධිත ආයතනයන්හි ධාරිතාව වැඩි දියුණු කිරීම මෙයට ඇතුළත්ය. ආයතන ගොඩනැගීම, මිනිස්බල පුහුණුව, පරිසර තොරතුරු, අධ්‍යාපනය සහ දැනුවත් කිරීම ආදී කටයුතු මීට ඇතුළත් වේ.

### 3.2 පරිසර ප්‍රතිපත්තිය

1995 ජනවාරි 6 වෙනි දින ජනාධිපතිනිය විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද ප්‍රතිපත්ති ප්‍රකාශයේ කියැවෙන ආකාරයට පරිසරයට හිතකර සහ චිරස්ථායී කාර්මික වර්ධනයක් ඇති කිරීමට ධෛර්යය දෙනු ඇත. මැනවින් තුලනාත්මක වූ ආර්ථික සංවර්ධනයක අවශ්‍යතාව මෙයින් විශේෂයෙන් කියැවෙන අතර ඉන් හැඟෙවෙනුයේ ආර්ථික වෘද්ධිය සහ පරිසර කළමනාකරණය අතර පවත්නා අන්තර් රඳා පැවැත්මයි.

### 3.3 පරිසර ආරක්ෂණයට අදාළ කටයුතු

පරිසරය ආරක්ෂා කිරීම පිළිබඳව අප ජනතාවගේ පාරම්පරිකව පැවත එන සම්ප්‍රදායයන් නැවත පණ ගැන්වෙන ආකාරයට වඩාත් සැළකිල්ලෙන් පරිසර ආරක්ෂණ පියවරයන් සකස් කර තිබේ. මේ සම්බන්ධයෙන් ක්‍රියාකාරී ප්‍රජා සහභාගීත්වයක් තුළින් පරිසර ආරක්ෂණය සඳහා සමස්ථ කැපවීමක් ජාතික වශයෙන් ඇති කරලීමට අවශ්‍ය ක්‍රියාමාර්ගයන් ගෙන තිබේ. මේ සම්බන්ධයෙන්, පාරිසරික කෘත්‍යයන් විවිධාංගීකරණය සහ පාරිසරික කටයුතු ප්‍රවර්ධනය කිරීම, අධ්‍යාපනයට සහ දැනුවත් කිරීමට ප්‍රමුඛතාවයදීම තුළින් සිදුවෙමින් පවතී.

### 3.3..1 පාරිසරික කෘත්‍යයන් විමධ්‍යගතකරණය

පරිසර ආරක්ෂණයේ වැදගත්කම පිළිබඳ පණිවුඩය ප්‍රාදේශීය මට්ටම කරා ගෙන යමින් පාරිසරික විමධ්‍යගත වැඩසටහන ක්‍රියාත්මක කරන ලදී. මේ යටතේ පහත සඳහන් කටයුතු සම්පූර්ණ කොට ඇත.

* පරිසර දූෂණ පාලනය සහ ආරක්ෂණය පිළිබඳ බලතල සහ කෘත්‍යයන් පළාත් පාලන ආයතන වලට පවරා දීම.
* ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් ප්‍රාදේශීය පාරිසරික මෙහෙයුම් කමිටු ස්ථාපනය කිරීම.
* විමධ්‍යගත කරන ලද පාරිසරික කෘත්‍යයන් ඉටුකරනු වස් පළාත්පාලන ආයතනවලට අනුයුක්ත තාක්ෂණික කාර්ය මණ්ඩලය පුහුණු කිරීම.
* විමධ්‍යගත වැඩ පිළිවෙල පැහැදිලි කිරීම සඳහා මහජන ඡන්දයෙන් පත්වූ පළාත්පාලන සභිකයින් දැනුවත් කිරීමේ වැඩ සටහන ක්‍රියාත්මක කිරීම
* විමධ්‍යගත කරන ලද පාරිසරික කාර්යයන් ඉටුකිරීමට අවශ්‍ය මාර්ගෝපදේශ ඇතුළත් අත්පොත් පිළියෙල කිරීම.
* පරිසර ආරක්ෂණය සඳහා නීතිය ක්‍රියාත්මක කිරීම, සම්බන්ධීකරණය සහ මෙහෙයවීම සඳහා දිස්ත්‍රික් ලේකම්වරයාගේ සහභාගිත්වයෙන් යුත් නීතිය ක්‍රියාත්මක කිරීමේ කමිටු පත් කිරීම.

### 3.3.2 පරිසර ආරක්ෂණ කටයුතු

පරිසර ආරක්ෂණය සඳහා පහත සඳහන් කටයුතු සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී.

* පාසල් ශිෂ්‍යයන්ගේ සහ තරුණ සහභාගිත්වයෙන් යුත් සම්මන්ත්‍රණ සහ වැඩමුළු ඇතුළත් පාසැල් පාරිසරික වැඩ සටහන් සංවිධානය කිරීම.
* කාන්තා කාර්යාංශයේ සහයෝගය ඇතිව කාන්තාවන් සඳහා පාරිසරික සම්මන්ත්‍රණ සහ වැඩමුළු සංවිධානය කිරීම.
* රාජ්‍ය නිලධාරීන්, රාජ්‍ය නොවන සංවිධානවල නියෝජිතයින් සහ ප්‍රජා නායකයන් සඳහා කාලීන පාරිසරික ප්‍රශ්න පිළිබඳව සම්මන්ත්‍රණ සංවිධානය කිරීම.
* අක්කර 750කින් යුත් මහමෙව්නා උයනේ පැල සිටුවීමේ විශේෂ ව්‍යාපෘතියක් ආරම්භකර පවත්වාගෙන යාම. පැල සිටුවීමේ කාර්යය සඳහා මහජන සහභාගිත්වය ක්‍රියාකාරි ලෙස ලබා ගැනීම සඳහා ප්‍රචාරක වැඩ සටහනක් ක්‍රියාත්මක කිරීම. මේ යටතේ පැලයක් සිටුවා නඩත්තු කිරීමේ කාර්යයට ඉතා සුළු මුදලක් ගෙවීමෙන් මහජනතාවට දායක විය හැකිය.
* මීරිගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ බෝතලේගම පාරිසරික ආදර්ශ ගම්මානයක් ලෙස සංවර්ධනය කිරීම.

### 3.3.3 මොන්ට්‍රියල් සංධානය ක්‍රියාත්මක කිරීම

මොන්ට්‍රියල් සංධානයේ අරමුණ වනුයේ ශීතකරණ සහ වායුසමනය කිරීමේ උපකරණ ආදිය නිෂ්පාදනයේ දී යොදා ගන්නා ඕසෝන් ස්ථරයට හානිදායක ද්‍රව්‍ය පෘථිවි තලයෙන් ක්‍රමක්‍රමයෙන් ඉවත් කරලීමයි. ඕසෝන් ස්ථරයට හානි සිදුවීම නිසා පාරජම්බුල කිරණ ප්‍රමාණය ඉක්මවා වායුගෝලයට ඇතුළුවන අතර, මේ තත්වය ජනතාවගේ සෞඛ්‍යයට මෙන්ම භෝග වගාවට ද අහිතකර ලෙස බලපානු ඇත. ඕසෝන් ස්ථරයට හානිදායක ද්‍රව්‍යයන් පාවිච්චි කිරීම වසර 2004 වන විට ක්‍රමයෙන් ඉවත් කරලීමට ක්‍රියා කෙරෙනු ඇත.

6 පරිච්ඡේදය

# ආර්ථික යටිතල ව්‍යුහය

## *(අ)* බල ශක්තිය, විදුලි සංදේශ, වරාය සහ නාවික ගමනාගමනය

### 1. සමස්ත ප්‍රතිපත්ති රාමුව

හැඳින්වීම් පරිච්ඡේදයේ දක්වා ඇති පරිදි පුද්ගලික අංශයේ වර්ධනය සඳහා අවශ්‍ය පසුතල පහසුකම් ගොඩනැංවීම රජයට පැවරී ඇති කාර්යයකි. මේ සඳහා සැලකිය යුතු අනුබලයක් ඉදිකොට මෙහෙයවා අයිතිවීම/ ඉදිකොට මෙහෙයවා පැවරීම (BOO/BOT) යන පදනම් යටතේ, පුද්ගලික අංශය මගින් යටිතල පහසුකම් සඳහා කරනු ලබන ආයෝජනයන් වෙතින් ලැබේ. ශ්‍රී ලංකාවේ ප්‍රධාන යටිතල පහසුකම් (ගමනාගමනය, විදුලි සංදේශ, ජලය සහ විදුලිබලය) සඳහා කරනු ලබන ආයෝජනය, 1980 දශකයේ සහ 1990 දශකයේ මුල් භාගවල දී, අඩු ආදායම් ලබන රටවල මෙම අංශයන්හි නියම ආයෝජන මට්ටම වන දළ දේශීය නිෂ්පාදිතයෙන් 3.5%, 4.0% ට ද වඩා පහළ මට්ටමක පැවතින. එය ඉන්දුනීසියාව (5%-6%), තායිලන්තය (6%-6.5%), පිලිපීනය (7%) සහ මැලේසියාව (6%-8%) වැනි අග්නිදිග ආසියාතික රටවල්වලට වඩා බෙහෙවින් පහළ මට්ටමක පවතී. මේ අතර වර්තමානයේ පවත්නා ප්‍රමාණවත් නොවන යටිතල පහසුකම් මත දැඩි පීඩනයක් ඇති කරමින් එම පහසුකම් සඳහා ඇති ඉල්ලුම 1989 ට පසු කාලයේ දී බලාපොරොත්තු නොවූ පරිදි ඉහළ ගොස් ඇත. 1970 ට පසු කාලයේ පැවති විදුලිබල ඉල්ලුමේ වර්ධන වේගය 7%-8% හා සසඳන කළ 1993 දී එය 10% කින් පමණ වැඩි වී ඇත. මෙහි දී ප්‍රතිපත්තිමය ඉලක්කය වන්නේ ආර්ථිකය සීඝ්‍රයෙන් වර්ධනය වීමේ දී වඩා උග්‍ර තත්ත්වයට පත්වන යටිතල පහසුකම් සඳහා පවතින ඉල්ලුම හා සැපයුමේ අසමබරතාවය නැති කිරීම සඳහා අවශ්‍ය විසඳුම් ලබා දීමයි.

### 2. විදුලිබල හා බලශක්ති

#### *2.1 ප්‍රතිපත්ති රාමුව*

ආර්ථික වර්ධන වේගය දළ දේශීය නිෂ්පාදිතය අනුව ඉදිරි දස වසර තුළ දී වාර්ෂිකව 6% බැගින් ඉහළ ගියහොත් විදුලිබලය සඳහා වන වාර්ෂික ඉල්ලුම 10% කින් ඉදිරි දස වසර තුළ වර්ධනය වේ යැයි අපේක්ෂා කෙරේ. වාර්ෂික 8% ක ආර්ථික වර්ධනයක් සඳහා වාර්ෂිකව 12% ක විදුලිබල ඉල්ලුමේ වර්ධනයක් මේ අනුව අවශ්‍ය වේ. වත්මන් විදුලි ධාරිතාව වන මෙගවොට් 1,400 එම පරිමාණයට අනුකූලව වැඩ කිරීමට සිදුවනු ඇත. එබැවින් අපේක්ෂිත ඉලක්කය ළඟාකර ගැනීම සඳහා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම් කල් ඇතිව වඩා යෝග්‍ය ලෙස සැලසුම් කළ යුතු ය. මේ සඳහා රාජ්‍ය හා පුද්ගලික යන අංශ දෙකෙහි ම ආයෝජනය අදාළ වේ.

#### *2.2 1995 ප්‍රගතිය*

##### *2.2.1 රාජ්‍ය අංශය*

මෙගවොට් 40 ඩීසල් විදුලිබල යන්ත්‍රය, සපුගස්කන්දේ දනට පවත්නා ඩීසල් විදුලි බලාගාරයේ එක් ව්‍යාප්ත කිරීමක් වන අතර, එහි ඉදිකිරීම් කටයුතු 1995 වසරේ ආරම්භ කරන ලදී. එහි වැඩ 1996 වසරේ අවසන් කිරීමට අපේක්ෂිත ය. සමනල වැව සඳහා අවශ්‍ය ප්‍රතිකර්ම කටයුතු ක්‍රියාත්මක කිරීම සඳහා 1995 දී අනුමැතිය ලැබී තිබේ.

ඒ සමගම සම්ප්‍රේෂණ හා බෙදා හැරීමේ පද්ධතිය වැඩි දියුණු කිරීම අරමුණු කරගෙන විදුලිබල මණ්ඩලය විසින් ව්‍යාපෘති කිහිපයක් ක්‍රියාත්මක කරනු ලබයි. ඒවා නම් දෙවන විදුලි බෙදා හැරීම් හා සම්ප්‍රේෂණ ව්‍යාපෘතිය (ජා. ස. ආ. ආධාර යටතේ), සම්ප්‍රේෂණ පද්ධතිය පුළුල් කිරීමේ හා සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය (ජාත්‍යන්තර ආර්ථික සහයෝගිතා අරමුදල - ජපන් ආධාර යටතේ) සහ සම්ප්‍රේෂණ හා ජාල උප පොල සංවර්ධන ව්‍යාපෘතිය. (ජාත්‍යන්තර ආර්ථික සහයෝගිතා අරමුදල- ජපන් ආධාර යටතේ)

එසේම ජාත්‍යන්තර ආර්ථික සහයෝගිතා අරමුදල (ජපානය), ජාත්‍යන්තර සංවර්ධන ආයතනය (ලෝක බැංකුව) වැනි ආයතනවලින් මුල්‍ය ආධාර ලබාගෙන අධික හා මධ්‍යම විදුලි රැහැන් සහ නව ජාලක උපපොලවල් ඉදිකිරීම මගින් විදුලිබල මණ්ඩලයට අයත් සම්ප්‍රේෂණ සහ බෙදා හැරීම් පද්ධතිය වැඩි දියුණු කිරීමට සැලසුම් කර ඇත. සැම ගමකටම විදුලි බලය ලබාදීමේ අරමුණෙන්, ආසියානු සංවර්ධන බැංකුවේ ආධාර ඇතිව, ග්‍රාමීය සංවර්ධන යෝජනා ක්‍රමයේ 3 වන අදියර ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වේ.

### 2.2.2 පුද්ගලික අංශය

ඉදිකොට මෙහෙයවීමේ හා ඉදිකොට මෙහෙයවා පැවරීමේ පදනම යටතේ (BOO/BOT) ව්‍යාපෘතීන් කිපයක් පිළිබඳව සාකච්ඡා පැවැත්වේ. නමුත් ඒ ක්‍රියාවලිය සඳහා සැහෙන කාලයක් ගතවේ. මෙහි දී ගෝර්ඩොන් නම් ආසියාවේ ප්‍රධාන පෙළේ ඉදිකොට මෙහෙයවා පැවරීමේ පදනම යටතේ ව්‍යාපෘති ක්‍රියාත්මක කරන්නාගේ කියමනක් උපුටා දක්වමි. "ඔබ ව්‍යාපෘතියක් ගොඩනැංවීමට ගත කරන කාලයට වඩා වැඩි කාලයක් ඒ සඳහා සාකච්ඡාවක් කිරීමට ගත කරයි."

ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක කරන ඉදිකොට මෙහෙයවීමේ හා ඉදිකොට මෙහෙයවා පැවරීමේ පළමු විදුලිබල ව්‍යාපෘතිය වන මෙගවොට් 51 සපුගස්කන්ද ව්‍යාපෘතියේ සාකච්ඡා නිමවෙමින් පවතී.

පුද්ගලික සංවර්ධකයන් විසින් ඉදිරිපත් කර ඇති කුඩා පරිමාණ ජල විදුලිබලාගාර 09 ක්, මෙගවොට් 20 සුළං විදුලි බලාගාරයක් සහ මෙගවොට් 40 බ්‍රෝඩ්ලන්ඩ් ජලවිදුලි බලාගාරය සඳහා කැමැත්ත ප්‍රකාශ කරන ලද ලිපි නිකුත් කිරීම කැබිනට් මණ්ඩලය විසින් අනුමත කර ඇත. මෙගවොට් 2 x 150 ගල් අඟුරු තාප බලාගාරය හා කැළණිතිස්සේ මෙගවොට් 120/150 අනුබද්ධ චක්‍රීය විදුලි බලාගාරය සඳහා යෝජනා කැඳවා ඇත.

රුපියල් බිලියන 100 වැය කොට ඉදිකිරීමට යෝජිත හම්බන්තොට තෙල් පිරිපහදුව සහ විදුලිබලාගාරය සඳහා යෝජනා සකස් කරමින් පවතී. එල්. පී. ගෑස් ගබඩා කිරීම සඳහා ඒකකයක් පිහිටුවීමට අනුමැතිය දී ඇත. එල්. පී. ගෑස් බෙදාහැරීම සඳහා ෂෙල් බී. වී. සමාගම අනුමැතිය දී ඇති අතර, ඒ සම්බන්ධව රජයේ සහභාගීත්වය ගැන සාකච්ඡා පැවැත්වේ.

## 3. විදුලි සංදේශ සේවාවන්

### 3.1 ප්‍රතිපත්ති රාමුව

ජපන් ජාත්‍යන්තර සහයෝගිතා ආයතනය (JICA) මගින් කරනු ලබන විදුලි සංදේශ පිළිබඳ ප්‍රධාන සැලසුම් අධ්‍යයනය අනුව වසර 2000 වනවිට දුරකථන සඳහා ඇති ඉල්ලුම 8,00,000 දක්වා වැඩි වේ යැයි ඇස්තමේන්තු කර ඇත. එම වැඩිවීමත් සමග දනට 2,00,000 ක් පමණ වන පොරොත්තු ලේඛනය වර්ෂ 2000 දී ඉවත් කෙරේ. මෙම ඉලක්කය සපුරා ගැනීම සඳහා රාජ්‍ය සහ පුද්ගලික යන අංශ දෙකේ ම සාමූහික උපකාරය අවශ්‍ය වේ. මේ සඳහා විශාල ආයෝජනයක් අවශ්‍ය හෙයින්, පුද්ගලික අංශයෙන් ද විශාල කාර්ය භාරයක් මේ සම්බන්ධව ඉටු විය යුතු ය.

1995 ප්‍රගතිය

### 3.2.1 රාජ්‍ය අංශය

පවත්නා විදුලි සංදේශ ජාලයෙහි පුළුල් කිරීම, තත්ත්වය උසස් කිරීම් හා අළුත්වැඩියා කිරීම් මගින් ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය විසින් සපයනු ලබන විදුලි සංදේශ සේවාවන්හි කැපී පෙනෙන ප්‍රගතියක් 1995 වසර තුළ ලබා ඇත. ප්‍රධාන ව්‍යාපෘතීන් වනුයේ මහ කොළඹ විදුලි සංදේශ ජාලය දියුණු කිරීම II අදියර (නාගරික), මාතර දිස්ත්‍රික්කයේ විදුලි සංදේශ ජාලය සංවර්ධනය, ගම්පහ විදුලි සංදේශ සංවර්ධන ව්‍යාපෘතිය, ලෝක බැංකුවේ සහ ආසියානු සංවර්ධන බැංකුවේ ආධාර ලබන දෙවන විදුලි සංදේශ සංවර්ධන ව්‍යාපෘතීන් හා ජාත්‍යන්තර ආර්ථික සහයෝගිතා අරමුදලේ ආධාර ලබන ප්‍රාදේශීය විදුලි සංදේශ සංවර්ධන ව්‍යාපෘතිය යි.

1995 වසරේ රුපියල් කෝටි 400 ක් පමණ රාජ්‍ය ආයෝජනයන් සමග ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය යල් පැනගිය ස්විච් පද්ධතීන්, කේබල් ජාලයන් වෙනුවට නවීන සහ ඉතා බලවත් අංකික ස්විච් පද්ධතියක් සහ උසස් තත්ත්වයේ ඔප්ටිකල් ෆයිබර් සහ සූක්ෂම තරංග කේබල් පද්ධති මගින් එහි සේවාවන් පුළුල් හා නවීකරණය කර ඇත. එහි ප්‍රතිඵලයක් වශයෙන් 1995 වසරේ පළමු මාස 02 ඇතුළත හුවමාරු පොලවල ධාරිතාව පසුගිය වසරට වඩා 14% කින් පමණ වැඩි වී 2,68,550 ක් විය. මේ අතර මහජනතාවට සපයනු ලබන දුරකථන සංඛ්‍යාව 1994 වසරේ 1,81,000 සිට 1995 සැප්තැම්බර් මස වනවිට 1,98,060 දක්වා වැඩි වී ඇත. කෙසේ වෙතත් මේ වසර තුළ බලාපොරොත්තු ලේඛනයේ සීමිත දුරකථන ඉල්ලුම් කරුවන්ගේ සංඛ්‍යාව 2,19,000 දක්වා 18% කින් වැඩි වී තිබේ. 1995 සැප්තැම්බර් මාසය වනවිට සපයන ලද දුරකථන සංඛ්‍යාව 24,000 ක් පමණ වේ. එයට අමතරව 1995 අගෝස්තු මාසයේ ක්‍රියාත්මක කරන ලද තුන්වන පෘථිවි චන්ද්‍රිකා මධ්‍යස්ථානය මගින් එහි ධාරිතාව 1,400 සිට 3,400 දක්වා වැඩි කළේ ය.

*3.2.2 පුද්ගලික අංශය*

1995 වසර වනවිට විදුලි සංදේශ ක්ෂේත්‍රයේ පුද්ගලික අංශය විසින් සපයනු ලබන එකතු කළ වටිනාකම් සේවාවන් ඉතා වැදගත් ස්ථානයක් ගනී. ප්‍රධාන වශයෙන් පුද්ගලික අංශය විසින් දනට සපයනු ලබන එකතු කළ වටිනාකම් සේවාවන් 6කි. එනම් (අ) රේඩියෝ පේජින් සේවා (ආ) සෙලියුලර් ජංගම දුරකථන (ඇ) දත්ත හුවමාරු සේවා (ඈ) ගෙවීම් දුරකථන (ඉ) ජංගම බාහිර ඇමතුම් රේඩියෝ පද්ධති සේවා (ඊ) බාහිර ඇමතුම් විදුලි සංදේශ පද්ධතිය.

වර්තමානයේ සමාගම් 05 ක් විසින් රේඩියෝ පේජින් සේවාව සපයනු ලබයි. 1995 සැප්තැම්බර් මස වනවිට පේජින් යන්ත්‍ර 7,750ක් පමණ විය. පසුගිය වසර හා සසඳන විට මෙය 23% ක වැඩිවීමකි. මේවායින් වැඩි ප්‍රමාණයක් පිහිටා ඇත්තේ කොළඹ ය. එසේම දනට සමාගම් 4ක් මගින් සෙලියුලර් ජංගම දුරකථන සේවා සැපයේ. සෙලියුලර් දුරකථන සංඛ්‍යාව පෙර වසර හා සසඳන කළ 1995 වසර තුළ 49%කින් ඉහළ ගොස් ඇත. 1994 වසරේ 29,182 ක් වූ මෙය 1995 සැප්තැම්බර් වන විට 43,400 දක්වා වැඩිවිය. දත්ත හුවමාරු සේවා ක්‍රියාත්මක කිරීම ද සමාගම් 04 ක් මගින් දනට සිදුකෙරේ.

1995 සැප්තැම්බර් වනවිට ග්‍රාහකයින් 1,776 ක් පමණ මෙම සේවාවට අනුයුක්ත වී ඇත. වර්තමානයේ සමාගම් 03 ක් මගින් ගෙවීම් දුරකථන පහසුකම් සපයති. තව ද 1995 සැප්තැම්බර් වනවිට ගෙවීම් දුරකථන 1,200 ක් සවිකොට තිබිණ. 1994 වර්ෂය හා සසඳන විට ගෙවීම් දුරකථන සංඛ්‍යාව 1995 සැප්තැම්බර් වනවිට 33% කින් ඉහළ ගොස් තිබේ.

වැඩිවන ඉල්ලුම සැපයීමේ අරමුණින් සැපයුම්කරු ණය ක්‍රමය යටතේ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කරනු ලබයි. එමගින් සපයන දුරකථන සංඛ්‍යාව ආරම්භයේ දී 1,50,000 ක් වූ අතර එය මේ වනවිට 2,00,000 දක්වා වැඩි වී ඇත. මේ ව්‍යාපෘතිය සඳහා සමාගම් 07 ක් කැමැත්ත පළකර ඇති අතර සමාගම් 03 ක් විසින් දැනටමත් ඒ සඳහා ආයෝජනය කර ඇත.

4 නාවුක හා වරාය

*4.1 ප්‍රතිපත්ති රාමුව*

මෙම උප අංශයේ සමස්ත අරමුණු වන්නේ ජාත්‍යන්තර නාවුක ක්ෂේත්‍රයේ නූතන තාක්ෂණය සම්බන්ධව සිදුවන වෙනස්කම් අනුව නාවුක කටයුතු හා වරායන්හි තරඟකාරිත්වය තහවුරු කිරීමේ අදහසින් ඒවා සංවර්ධනය කිරීම ය.

මෙම ප්‍රතිපත්තියේ ප්‍රධාන අවශ්‍යතාවය වනුයේ කොළඹ සහ ගාලු වරායන් කේන්ද්‍රීය වරායන් ලෙස හා තරඟකාරී ප්‍රති නැව්ගත කිරීමේ මධ්‍යස්ථාන ලෙස දියුණු කරමින් ලංකාවේ ස්වාභාවික වැදගත් ස්ථාන දියුණු කිරීම යි. නාවුක කර්මාන්ත සංචාරක සහ පාරිසරික කටයුතු සම්බන්ධව ත්‍රිකුණාමල වරාය සංවර්ධනය කරනු ලැබේ. කන්කසන්තුරේ වරාය නැවත ක්‍රියාකාරී තත්ත්වයට පත්කරන අතර ඔළුවිල නව වරායක් ලෙස ඉදි කෙරේ.

මෙම අරමුණු ලඟාකර ගත යුත්තේ පවතින නිදහස් ආර්ථික වාතාවරණය තුළ සහ ජාත්‍යන්තර තරඟකාරී පසුබිම මත ය.

*4.2 1995 ප්‍රගතිය*

*4.2.1 රාජ්‍ය අංශය*

1995 වර්ෂයේ නැව්ගත භාණ්ඩ ප්‍රමාණයේ පසුගිය වසරට වඩා 7.6% ක සමස්ත වැඩිවීමක් පෙන්නුම් කරයි. පසුගිය වසර හා සසඳන කළ මුළු බහාලූ භාණ්ඩ ප්‍රමාණය 1995 සැප්තැම්බර් මස අග භාගය වන විට 48% කින් පමණ වැඩි වී ඇත. එය 1995 දෙසැම්බර් අවසානය වනවිට දශලක්ෂ 1 ක් පමණ වේ යැයි අපේක්ෂා කෙරේ. 1995 සැප්තැම්බර් දක්වා මුළු ආදායමේ 19.6% ක වැඩිවීමක් වාර්තාගත වී ඇත.

විශාල නැව් හැසිරවීම සඳහා අවශ්‍ය උපකරණවලින් සමන්විත සහ වාර්ෂිකව බහාලූ භාණ්ඩ ප්‍රමාණය අමතර 3,50,000කින් වැඩිකළ හැකි ජයා බහාලූ පර්යන්ත III අදියර 1995 පෙබරවාරි මාසයේ ආරම්භ කරන ලදි. ජයා බහාලූ පර්යන්තයේ IV වන අදියර 1995 දෙසැම්බර් මස නිම කෙරේ. මේ සඳහා අවශ්‍ය අංගනය දැනටමත් ලැබී ඇති අතර ඊට හුවමාරු දොඹකර 7 ක් සහ බහාලූ දොඹකර 3 ක් අවශ්‍යව ඇත.

දැනට පවත්නා පරිගණක ජාලය හා යෝජිත විද්‍යුත් දත්ත හුවමාරුව පුළුල් කිරීමට අමතරව පවතින ක්‍රමයේ මෘදුකාංග අංශය නව නැව් තටාංග සැලසුම් කිරීම, යාත්‍රා සැලසුම් කිරීම සහ තටාංග මෙහෙයුම් කිරීමේ දී පරිගණක භාවිතය වැනිදෑ ඇතුළත් වන පරිදි පුළුල් කෙරේ.

විශාල නැව් වරායට ඇතුළු වීමට හැකි වන පරිදි ජල මාර්ගය මීටර් 15 ක් දක්වාත් අභ්‍යන්තර වරාය මීටර් 14 ක් වන පරිදිත් වරායට ඇතුළුවීමේ ප්‍රධාන මාර්ගය හෑරීම හා වැඩිදියුණු කිරීම දැනට ක්‍රියාත්මක වේ.

උතුරු ජැටියේ සිට තෙල් සහ ඒවායේ පිරිසිදු කරන ලද නිෂ්පාදන පහසුවෙන් එහා මෙහා ගෙන යා හැකි පරිදි දියකඩනයේ සිට ඩොල්ෆින් ජැටිය දක්වා නළ පද්ධතියක් පිහිටුවීම සඳහා පියවර ගනු ලැබ ඇත.

බහාලූ භාණ්ඩ ගොඩ බෑම හා නැවට පැටවීම සඳහා බහු කාර්ය නැව් තටාකාංගනය ලෙස උතුරු ජැටිය සංවර්ධනය කෙරේ.

මෑතක දී ගත් පරිපාලන තීරණවල ප්‍රතිඵලයක් වශයෙන් එක්තරා ප්‍රමාණයකට මූල්‍ය අපහසුතා මගහැර ගැනීමට ලංකා නැව් සංස්ථාවට හැකි වී ඇත. අළුත් බද්ධ ව්‍යාපාර සඳහා යෝජනා එහි කටයුතු නැවත ප්‍රාණවත් කිරීමට හා නැවත ක්‍රියාත්මක කිරීමට උපකාරී වේ.

*4.2.2 පුද්ගලික අංශය*

ඉදිකොට මෙහෙයවා අයිතිකර ගැනීම හෝ ඉදිකොට මෙහෙයවා පවරාදීම (BOO/BOT).

නැව්වලින් බහාලූ භාණ්ඩ ගොඩබෑම සහ පැටවීම සඳහා වූ ගාලු වරාය සංවර්ධනය සැලකිය යුතු කාලසීමාවකට නතර වී තිබිණ. නමුත් මේ වසර තුළ දී ගත් තීරණයක් අනුව නුදුරු අනාගතයේ දී එහි ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීමට අපේක්ෂා කෙරේ. ප්‍රධාන නැව් සමාගමක් මගින් යාබද සිට එළියබෙත් රැජිණ පර්යන්තය දක්වා සංවර්ධනය කිරීමේ යෝජනා ඇගැයීම දැනට සිදු කෙරේ.

(ආ) ප්‍රවාහන හා මහා මාර්ග

1. හැඳින්වීම

අරමුදල් හිඟකම, අඩු ධාරිතාවය, නවෝත්පාදන නොමැතිවීම සහ අදාළ ආයතනයන්හි ඌනතාවය යනාදිය ප්‍රවාහන අංශයේ ගැටළු සමග බැඳී පවතී. මීටත් වඩා ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලයට අයත් බස් ඩිපෝ ජනතාකරණය කිරීම වැනි අතීතයේ සිදුකරන ලද ප්‍රවාහන ප්‍රතිපත්තිමය ප්‍රතිසංවිධාන, නවත් ගැටළු මතු කිරීමට තුඩු දී තිබේ. ඒ අනුව මගී හා භාණ්ඩ ප්‍රවාහනය පහසු කරනවා වෙනුවට එම සේවාවන් නව දුරවත් බිඳ වැටීමත් විද්‍යාමාන වේ.

2. අරමුණු සහ ප්‍රතිපත්ති

(අ) කඩිනම් ආර්ථික වර්ධනය තුළින් මතුවන ඉල්ලුම සපුරාලීමේ කාර්යක්ෂම ප්‍රවාහන ක්‍රමයක් සැපයීම.

(ආ) නවීන තාක්ෂණය භාවිතය සහ සම්පත් තාර්කිකව උපයෝජනය කිරීම තුළින් සියලුම ගමනාගමන ක්‍රමයන්හි ක්‍රියාකාරී කාර්යක්ෂමතාවය වැඩි දියුණු කිරීම.

(ඇ) අනෙකුත් ගමනා ගමන ක්‍රමවලට සාපේක්ෂව එක් එක් ගමනා ගමන මාධ්‍යයන්හි අනුපූරක භාවය වර්ධනය කිරීම.

(ඈ) පාරිසරික හානි අවම කරනු ලබන භාණ්ඩ සහ මඟී ප්‍රවාහන වැඩ පිළිවෙලක් දියුණු කිරීම.

(ඉ) ප්‍රවාහන පහසුකම් ඇති කිරීම තුළින් ග්‍රාමීය ප්‍රදේශවල මාර්ග ප්‍රවේශය වැඩිදියුණු කිරීම සහ ඒ මගින් නාගරික සහ ග්‍රාමීය ප්‍රදේශ අතර අන්තර් සම්බන්ධතාවයක් ඇති කිරීම.

ඉහත කී අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා, පවත්නා බාධක හමුවේ නිවැරදිව තෝරා ගත් නව ව්‍යාපෘතීන් දියත් කරන අතරම පවත්නා සම්පත් පුනරුත්ථාපනය සහ නඩත්තු කිරීම සඳහා යොමු වීම ද ඵලදායී උපාය මාර්ගයන්ගෙන් වඩාත් යෝග්‍ය සේ පෙන්වා දිය හැකි ය. මෙහිලා, ප්‍රතිලාභීන්, ක්‍රියාකාරීන් සහ ශ්‍රමිකයින් යන සියලුම පාර්ශවයන්ගේ අයිතීන් සුරක්ෂිත කරනු ලබන නීතිමය රාමුවක් සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම ඉතා වැදගත් ප්‍රමුඛතාවයක් බවට පත්වී තිබේ.

අවශ්‍යතා පුරුකෙන අයුරින් (ප්‍රයෝජනය ලබන්නන්, මෙහෙයුම් සහ සේවකයින්) සංඛ්‍යා සටහන 1 හි දැක්වෙන පරිදි රජය මගින් ලබාදෙන අයවැය ප්‍රතිපාදන සැලකිය යුතු තරම් ඉහල මට්ටමක පැවතිය ද, මූල්‍යමය සම්පත් සඳහා වූ ඉල්ලුම රජයට සැපයිය හැකි ප්‍රමාණය ඉක්මවා ගොස් ඇති බව පෙනේ. එමනිසා ප්‍රවාහන පහසුකම් සහ සේවා සැපයීමේ දී පුද්ගලික අංශයේ සහභාගීත්වය ඉතාමත් අවශ්‍යව පවතී. විදේශ ආධාර ලබන ව්‍යාපෘති යටතේ ක්‍රියාත්මක වන සමහර මාර්ග අලුත්වැඩියා කිරීමේ වැඩ කටයුතු සඳහා දැනටමත් දේශීය කොන්ත්‍රාත්කරුවන් නිරතව සිටීම මෙහි දී වැදගත් කොට සැලකිය යුතුව ඇත.

සංඛ්‍යා සටහන 1

*දුම්රිය හා මහා මාර්ග සඳහා ප්‍රාග්ධන ප්‍රතිපාදන 1990 – 1996*

| වර්ෂය | 1990 | 1991 | 1992 | 1993 | 1994 | 1995 | 1996 |
|---|---|---|---|---|---|---|---|
| දුම්රිය | 1,506 | 2,079 | 2,007 | 3,642 | 4,163 | 4,598 | 4,976 |
| මහා මාර්ග | 2,379 | 3,311 | 2,869 | 2,933 | 4,471 | 5,699 | 6,732 |
| ප්‍රවාහන ආයතන | 45 | 6 | 27 | 52 | 29 | 86 | 51 |
| මිල ගණන | 3,930 | 5,396 | 4,903 | 6,627 | 8,663 | 10,383 | 11,759 |

මූලය : රාජ්‍ය ආයෝජන සැලැස්ම, අදාළ වර්ෂ, අයවැය ඇස්තමේන්තු අදාළ වර්ෂ.

3. සාධනයන් සහ අපේක්ෂා

විවිධ ප්‍රවාහන ව්‍යවසායන්හි කාර්ය සාධනයෙහි සුළු පසු බැසීමක් පෙන්නුම් කළ ද, සැලකිල්ලට ගනු ලබන කාලය පසුගිය වසරවලින් පැහැදිලිව වෙනස් වනු දක්නට ලැබේ. දුම්රිය, බස් ප්‍රවාහනය, මහාමාර්ග හා ගුවන් සේවා යන නොයෙකුත් උප අංශයන්හි ප්‍රගතිය සංක්ෂිප්තව පහත දැක්වේ.

### 3.1 ශ්‍රී ලංකා දුම්රිය සේවය

#### 3.1.1 ආවේනික ලක්ෂණ

1995 වර්ෂයේ දී, ශ්‍රී ලංකා දුම්රිය සේවයේ ක්‍රියාකාරි පරිමාව, ධාවනය කළ කිලෝ මීටර ගණන සහ ආදායමට අනුව බලන කල ආත්තික වශයෙන් ඉහළ යාමක් අපේක්ෂා කෙරේ. එය මගී කිලෝ මීටර ප්‍රමාණ 7% කින් හා ආදායම 5% කින් වැඩිවීමක් ලෙස සංඛ්‍යා සටහන අංක 2 න් පෙන්නුම් කෙරේ. දුම්රිය මාර්ගයන්හි දුර්වල තත්වය සහ දුම්රිය එන්ජින් හිඟය යන කරුණු දුම්රිය සේවයේ සීමිත ප්‍රසාරණය කෙරෙහි වගකිව යුතු ය. මේ අතර, අවිනිශ්චිත ආරක්ෂක තත්වය නිසා උතුරු දුම්රිය මාර්ගයේ සීමා කිරීම් පසුගිය වර්ෂවල මෙන් තවදුරටත් පවතිනු ඇත. ත්‍රිකුණාමලය-මඩකලපුව දුම්රිය සේවයෙහි ද දිගු ප්‍රමාදයන් ඇතිකරවමින් අඩ පණ වී ඇත.

සංඛ්‍යා සටහන අංක 2

**ශ්‍රී ලංකා දුම්රිය සේවයේ ප්‍රගතිය 1990 - 1995**

| වර්ෂය | ඒකක | 1990 | 1991 | 1992 | 1993 | 1994 | 1995 |
|---|---|---|---|---|---|---|---|
| මගී කිලෝ මීටර් | මිලියන | 2,781 | 2,654 | 2,613 | 2,822 | 3,202 | 3,430 |
| මගී ආදායම (රු.) | මිලියන | 404 | 482 | 480 | 505 | 576 | 590 |
| ටොන් කිලෝ මීටර් | මිලියන | 164 | 169 | 277 | 159 | 154 | 148 |
| භාණ්ඩ ආදායම (රු.) | මිලියන | 270 | 302 | 413 | 326 | 342 | 300 |

සටහන : 1995 වර්ෂය සඳහා වූ සංඛ්‍යා කාල්පනික ය.
මූලය : ශ්‍රී ලංකා දුම්රිය සේවය.

#### 3.1.2 නවීකරණය

දුම්රිය මාර්ග, එන්ජින් සහ ප්‍රධාන වැඩපල ආවරණය කෙරෙන ජාත්‍යන්තර ආර්ථික සහයෝගිතා අරමුදල මගින් මුදල් සපයනු ලබන ප්‍රතිසංස්කරණ වැඩ සටහන පසුගිය වසරවල අත්දුටු අසාර්ථක ආරම්භයන් කිහිපයකින් පසු, අවසානයේ දී යළි ක්‍රියාත්මක වේ. මෙය සැබවින්ම ශ්‍රී ලංකා දුම්රිය සේවය නවීකරණයට භාජනය වීමකි. මීට අමතරව, 1995 වර්ෂයේ දී ඉන්දියානු ණය ක්‍රමය යටතේ දුම්රිය එන්ජින් මිල දී ගැනීම ඇරඹීමත් සමඟ දුම්රිය මැදිරි සහ අනෙකුත් අයිතමයන් ක්‍රමානුකූලව මිල දී ගැනීමට, අවශ්‍ය අයවැය ප්‍රතිපාදනය සැපයීම ද සිදුවේ. තවදුරටත්, කැළණි වැලි දුම්රිය මාර්ගයේ සේවාවන් දියුණු කිරීම් වස් දුම්රිය මාර්ගය, පුළුල් කිරීමේ වැඩ සටහන හෝමාගම සිට පාදුක්ක දැනට ව්‍යාප්ත කර ඇත. අවිස්සාවේල්ල දක්වා දුම්රිය මාර්ගය පුළුල් කිරීම 1995 වර්ෂය අවසානයට පෙර සම්පූර්ණ වීමට නියමිත ය.

#### 3.1.3 වාණිජකරණය

දුම්රිය දෙපාර්තමේන්තුව වඩාත් ආර්ථිකමය ලාභදායි මඟකට යොමු කිරීම සඳහා ව්‍යාපාර සැලසුමක් පිළියෙල වෙමින් පවතී. අතිරේක දුම්රිය එන්ජින් සහ නවීන සංඥා පද්ධති වැනි කෙටි කාලීන අවශ්‍යතාවයන් සපුරාලන අතර දුම්රිය විදුලිකරණය වැනි දිගුකාලීන අවශ්‍යතාවයන් ද සැලසුම් කෙරෙමින් පවතී. ශ්‍රී ලංකා දුම්රිය සේවය ප්‍රතිව්‍යුහකරණ වැඩ පිළිවෙල දැනටමත් ලෝක බැංකු ආධාර යටතේ ආරම්භ කර ඇත. ඒ අනුව, පාරිභෝගිකයා මූලික කොටගත් සේවාවන්, ලාභදායී සේවා සහ කළමනාකරණ තොරතුරු පද්ධති වැනි දේ කෙරෙහි කේන්ද්‍රගත වෙමින් ශ්‍රී ලංකා දුම්රිය සේවය වාණිජ ව්‍යාපාරයක් බවට පරිවර්තනය කිරීම කෙරෙහි වර්තමාන උපාය මාර්ගය යොමු වී තිබේ.

3.2 බස් ප්‍රවාහනය

3.2.1 යළි පණගැන්වීමේ ක්‍රියා මාර්ග

පසුගිය කාලපරිච්ඡේදය තුළ සමාගම් 93 කින් සමන්විත වූ ජනතාකරණ ප්‍රවාහන සමාගම්වල, ක්‍රියාකාරී පරිමාව වර්ධනය විය. වගු අංක 03 න් දැක්වෙන පරිදි මෙම සමාගම් 1994 වර්ෂයේ දී මගී කිලෝ මීටර 15.6 ක් ධාවනය කර ඇත. වඩාත් වැදගත් වන්නේ රජය විසින් හඳුන්වා දුන් ක්‍රියාමාර්ගවල ප්‍රතිඵලයක් ලෙස 1994 අවසාන කාර්තුවේ දී 36% වැඩිවීමක් වාර්තා වීමයි. මේ හා සමාන වැඩිවීමක් ප්‍රවාහනය කරන ලද මගී සංඛ්‍යාව සහ දෛනික ධාවන බස් සංඛ්‍යාව වැනි ක්ෂේත්‍රයන් තුළද මේ හා සමාන වැඩිවීමක් නිරීක්ෂණය කළ හැකි ය. අනුග්‍රාහක ණය ක්‍රමය යටතේ අමතර කොටස් සහ අනෙකුත් දේ ලබාදීම තුළින් මගී බස් රථ ප්‍රමාණය වැඩිවීම මෙම වර්ධනයට විශාල වශයෙන් බලපෑවේ ය. ධාවනයෙන් ඉවත්කර ඇති විශාල අළුත්වැඩියා කිරීම් අවශ්‍ය කරනු ලබන බස් රථ විශාල සංඛ්‍යාවක් අළුත්වැඩියා කිරීම සඳහා ප්‍රධාන ප්‍රතිසංස්කරණ වැඩසටහනක් ද සැලසුම් කොට තිබේ. ග්‍රාමීය සහ ආර්ථික වශයෙන් ලාභදායී නොවන මාර්ග සහ හොඳ පාසල් සේවයක් සැපයීම සඳහා සහනාධාර සලසනු වස් වාර්ෂික අයවැයයෙන් වැඩිපුර ප්‍රතිපාදන ලබාගෙන තිබේ. " කාන්තාවන් සඳහා පමණක් " වූ සහ රාත්‍රී දුර ගමන් සේවා වැනි අළුත් සේවාවන් ද හඳුන්වා දෙනු ලැබී ය. ජනතා සන්තක සමාගම්වල සහ පුද්ගලික ධාවකයන්ගේ සමස්ත කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම් වස්, බස් රියදුරන් පරීක්ෂා කිරීම සහ පුහුණු කිරීම නිරන්තර වාහන පරීක්ෂාව සහ කළමණාකරන පුහුණුව ආදිය සඳහා විශේෂ වැඩසටහන් දැනටමත් ක්‍රියාවට නංවා ඇත.

3.2.2 ප්‍රතිඵල

1994 අවසාන කාර්තුවේ සිට මෙම වැඩපිළිවෙල ක්‍රියාත්මක වීමේ ප්‍රතිඵල වශයෙන් පහත දැක්වෙන වැඩි දියුණු වීම් සිදුවිය :

(අ) පවතින මගී බස් රථ ප්‍රමාණයට අළුත්වැඩියා කරන ලද බස් 400 ක් සහ අළුත් බස් රථ 1,000 කට වැඩි ප්‍රමාණයක් එකතු වීම.
(ආ) ග්‍රාමීය ප්‍රදේශවල නව සේවා 40 ක් හඳුන්වා දෙනු ලැබීම.
(ඇ) නවතා තිබූ සේවා නැවත ආරම්භ කිරීම.
(ඈ) ජනතා සන්තක සමාගම් මගින් දිනකට ධාවනය කළ බස් රථ සංඛ්‍යාව 1994 අවසානයට 4,207 ක් වූ අතර එය 1995 ජුනි අවසානයේ දී 4,620 දක්වා වැඩිවීම.

ජනතා සන්තක ප්‍රවාහන සමාගම් සහ ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලයේ ප්‍රගතිය 1990 –1995

| අයිතම | ඒකක | 1990 | 1991 | 1992 | 1993 | 1994 | 1995 |
|---|---|---|---|---|---|---|---|
| මෙහෙය වූ බස් රථ දෛනික සාමාන්‍ය | | 3,151 | 3,359 | 3,550 | 3,709 | 4,207 | 4,851 |
| මෙහෙය වූ කිලෝ මීටර් | මිලියන | 243 | 247 | 268 | 272 | 307 | 355 |
| වාහන පාවිච්චි දෛනික සාමාන්‍ය | | 211 | 201 | 206 | 202 | 200 | 205 |
| ප්‍රවාහනය කළ මගී සංඛ්‍යාව | මිලියන | 888 | 769 | 867 | 909 | 976 | 1,175 |
| මගී කිලෝ මීටර් | මිලියන | 13,674 | 11,454 | 12,840 | 13,608 | 15,613 | 19,731 |
| මුළු වියදම | මිලියන | 2,900 | | – | 3,876 | 4,511 | 5,321 |
| ආදායම | මිලියන | 2,617 | | 2,645 | 2,751 | 3,346 | 4,118 |

සටහන : (අ) 1990 – 1993 කාලසීමාව සඳහා වූ තොරතුරු ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලයට අදාළ වන අතර, ඉදිරි වර්ෂ සඳහා වූ තොරතුරු ජනතා සන්තක ප්‍රවාහන සමාගම් සඳහාය.
(ආ) 1995 වර්ෂය සඳහා වූ සංඛ්‍යා කාල්පනික ය.

මූලය : ජාතික ප්‍රවාහන කොමිෂම.

(ඉ) අදාළ කාල සීමාව තුළ පසුගිය වර්ෂයට වඩා 12% වැඩිවීමක් පෙන්නුම් කරමින් 1995 වර්ෂයේ දී ජනතා සන්තක බස් සමාගම්වල මගී කිලෝ මීටර ප්‍රමාණය බිලියන 9.5 දක්වා ඉහළ නැංවීම.

### 3.2.3 ප්‍රතිව්‍යුහකරණය

මෙම කාල සීමාව තුළ පුද්ගලික බස් සේවාවේ ක්‍රියා කාරිත්වය දැවෙන ප්‍රශ්නයක්ව පැවැතීම පුද්ගලික අංශය විසින් සපයන ලද අසතුටුදායක සේවය හේතුකොට ගෙන මතු වුවකි. ආර්ථික හා ක්‍රියාකාරී කාර්යක්ෂමතාවය තහවුරු කෙරෙන වඩාත් කාර්යක්ෂම සංවිධානාත්මක ව්‍යුහයක් තුළ ම ජනතා සන්තක සමාගම් සහ පුද්ගලික බස් හිමියන් නැවත සංවිධානය කිරීමේ කාර්ය දැනටමත් ක්‍රියාත්මක වෙමින් පවතී. සමස්ත බස් ධාවන කටයුතු සම්බන්ධීකරණය කරනු ලබන මධ්‍යම සංවිධානයක් සහිතව බස් සමාගම් සංඛ්‍යාව 93 සිට 11 දක්වා අඩු කිරීම යෝජිත ප්‍රතිව්‍යුහකරණ වැඩ සටහනෙන් සිදුවේ. ග්‍රාමීය ප්‍රදේශවල බස් සේවය වැඩි දියුණු කිරීමට සහ ව්‍යාප්ත කිරීමට පියවර ගනු ලැබේ. මෙවැනි සේවාවලට සහනාධාර සැපයීම තෝරා ගත් පදනමක් මත සිදු කරනු ඇත.

## 3.3 මහා මාර්ග

### 3.3.1 මාර්ග ජාලය

දළ වශයෙන් කි. මී. 1,00,000 ක මාර්ග ජාලයක් ශ්‍රී ලංකාවේ පවතී. වර්ග කි. මී. 1,000 ක් වූ භූමි භාගයට කි. මී. 1,484 මාර්ග ජාලයක් මින් ගම්‍ය වේ. මාර්ග ඝනත්වය අනුව බලන විට කලාපයේ බොහෝ රටවලට වඩා මෙය ඉහළ මට්ටමක පවතී. සමස්ත මාර්ග ජාලයෙන් 1/10 පමණ වන ජාතික මහාමාර්ග විදේශීය අරමුදල් යොදවා ප්‍රතිසංස්කරණය කෙරේ. එනමුදු, දශකයක් මුළුල්ලේ ම ප්‍රතිසංස්කරණය කොට තිබෙනුයේ කි. මී. 1,000 ක් පමණි. පළාත් මාර්ග සහ ප්‍රාදේශීය මාර්ග සලකන කල ඒවා අලුත්වැඩියා කිරීමට අපහසු තරම් වූ අසතුටුදායක තත්වයක පවතී.

1995 වර්ෂයේ සිට රජයෙන් ලබාදෙන අරමුදල් ප්‍රමාණය වැඩිකර ඇත. හදිසි අවශ්‍යතාවයක් වශයෙන් සලකා ප්‍රථම වතාවට 1996 අයවැය ප්‍රතිපාදන මගින් ප්‍රාදේශීය මාර්ග අළුත්වැඩියා කිරීම සඳහා ප්‍රතිපාදන වෙන්කර ඇත. පළාත් මඟ සඳහා ද ප්‍රතිපාදන හය ගුණයකින් වැඩිකර ඇත. මෙම ප්‍රතිපාදන රාජ්‍ය අංශයේ ආයෝජනයන්ගේ ප්‍රමුඛතා වෙනස්වීම් පිළිබිඹු කරනවා මෙන් ම ප්‍රාදේශීය විෂමතා අහෝසි කිරීමට සහ ප්‍රදේශය තුළ ප්‍රවේශයන් ඉහළ මට්ටමකට ගෙන ඒමට රජයේ ඇති කැපවීම පෙන්නුම් කරයි.

### 3.3.2 විදේශීය ආධාර

විදේශාධාර ඵලදායීව යොදා ගැනීම නිසාවෙන් අනාගත අළුත්වැඩියාවනට සහ නව මාර්ග පහසුකම් ලබාදීම වෙනුවෙන් විදේශ ආයෝජන විවෘතව ඇත. ඒවා අධිවේගී මාර්ග සහ විකල්ප මහා මාර්ගීය වශයෙන් සඳහන් කළ හැකි ය. විදේශ ආධාර ඇතිව දැනට ක්‍රියාත්මක වන ව්‍යාපෘතිවලට අමතරව, 1995 වර්ෂයේ සහ ඊට පසුව ක්‍රියාත්මක කෙරෙනු ලබන විදේශ ආධාර ලබන නව ව්‍යාපෘතීන් ද පිළිබඳ විස්තර පහත දැක්වේ :

(අ) බස්නාහිර, වයඹ සහ මධ්‍යම පළාත්වල 'ඒ' සහ 'බී' පංතියේ මාර්ග කි. මී. 167 අළුත්වැඩියා කිරීම සඳහා වූ 1995 වර්ෂයේ ආරම්භ කළ ආසියා සංවර්ධන බැංකුව මගින් අරමුදල් සපයන මාර්ග දියුණු කිරීමේ තුන්වෙනි ව්‍යාපෘතිය.

(ආ) අරාබි ආර්ථික සංවර්ධනය සඳහා වූ කුවේට් අරමුදලින් රු. දශලක්ෂ 721 ක් ආධාර ලබන බටහිර, වයඹ සහ මධ්‍යම පළාත්වල පිහිටි පාලම් 28 ක් පුනරුත්ථාපනය කිරීමේ ව්‍යාපෘතිය.

(ඇ) ජාත්‍යන්තර ආර්ථික සහයෝගිතා අරමුදල මගින් රු. දශලක්ෂ 1,050 ක ආධාර ඇතිව තවත් ධාවන පථ දෙකක් සහිතව වික්ටෝරියා පාලම පුළුල් කිරීම.

(ඉ) ජාත්‍යන්තර සහයෝගිතා අරමුදල මගින් රු. දශලක්ෂ 3,855 ක් වටිනා මඟ ඉදිකිරීම් යන්ත්‍රෝපකරණ සැපයීම.

(ඊ) රු. දශලක්ෂ 1,251 ක ලෝක බැංකු ආධාර සහිතව 1995 වර්ෂයේ දී අරඹන ලද කොටුව, පිටකොටුව සහ මරදාන ප්‍රදේශයන්හි ප්‍රධාන මාර්ග පුනරුත්ථාපනය කිරීම. ගණන් බලා ඇති අන්දමට මෙම ව්‍යාපෘතිය යටතේ දැනටමත් පුනරුත්ථාපනය කර ඇති මාර්ගවලින්, වාහන මෙහෙයුම් වියදම අඩු වීමෙන් සහ ගමන් කාලය ඉතිරි කරවීමෙන් වාර්ෂිකව රු. දශලක්ෂ 610 ක ඉතිරියක් ආර්ථිකයට ලබා දී ඇත.

(උ) ආසියානු සංවර්ධන බැංකු ආධාර යටතේ 1996 මුල් භාගයේ දී හතරවෙනි මාර්ග පුනරුත්ථාපන ව්‍යාපෘතියේ ශක්‍යතා අධ්‍යයනය ආරම්භ කරනු ලැබේ.

(ඌ) ප්‍රදේශයේ ජනතාව අවතැන්වීම අවම කිරීම පිණිස කොළඹ - කටුනායක අධිවේගී මාර්ගය සඳහා නව මාර්ගයක් හඳුනාගැනීම කරගෙන යනු ලැබේ. එමෙන් ම විකල්ප දකුණු මහා මාර්ගය, බාහිර වටරවුම් මහා මාර්ගය සහ පළාත් අගනුවරවල් සම්බන්ධ වටරවුම් මාර්ගය ඉක්මණින් ක්‍රියාත්මක කිරීමට කටයුතු සම්පාදනය වෙමින් පවතී.

ඉදිකොට - අයිතිය තබාගෙන - මෙහෙයවීම හෝ ඉදිකොට - මෙහෙයවා - පැවරීමේ පදනම යටතේ පුද්ගලික අංශයේ ආයෝජකයිනට සමහර නව ව්‍යාපෘති ඉදි කිරීම සහ ක්‍රියාත්මක කිරීම පිරිනමා ඇත.

### 3.4 ගුවන් තොටුපල සහ ගුවන් සේවා

#### 3.4.1 ගුවන් තොටුපල

සක්‍යතා වාර්තාව පදනම් කරගෙන කොළඹ ජාත්‍යන්තර ගුවන් තොටුවල දෙවන අදියර සංවර්ධන වැඩ ආරම්භ කරනු ඇත. ඒ සමඟම අභ්‍යන්තර ගුවන් ගමන් සහ සංචාරක සේවා වැඩි දියුණු කිරීම පිණිස පෞද්ගලික අංශයේ සහභාගීත්වයෙන් රට අභ්‍යන්තර ගුවන් තොටුපල තවදුරටත් සංවර්ධනය කිරීම සිදු කෙරේ.

#### 3.4.2 ගුවන් සේවා ප්‍රතිපත්තිය

ලිහිල් ප්‍රවේශයක් වෙත අවධානය යොමු කරමින් ගුවන් සේවා ප්‍රතිපත්තිය දිගටම ක්‍රියාත්මක වන අතර, එයාර් ලංකා සමාගමට මේ අනුව තරඟකාරී පරිසරයක් තුළින් ප්‍රතිලාභ අත්කර ගතහැක.

#### 3.4.3 එයාර් ලංකා ප්‍රතිව්‍යුහකරණය

ප්‍රාග්ධනය යෙදවීමට හා ලාභදායීතාවය වැඩි කිරීමට සමත් උපායශීලී හවුල්කරුවෙක් සහභාගී කර ගැනීම තුළින් අනෙකුත් ජාත්‍යන්තර ගුවන් සේවා වෙතින් එල්ලවන තරඟකාරී අභියෝගයනට මුහුණ දෙනු වස් ජාතික ගුවන් සේවය ප්‍රතිව්‍යුහකරණය වෙමින් තිබේ. මෙය රාජ්‍ය ව්‍යවසායයන් ප්‍රතිසංස්කරණ කොමිෂමේ අනුග්‍රහය යටතේ ක්‍රියාත්මක වන අතර, ප්‍රතිව්‍යුහකරණ උපාය මාර්ගය සැලසුම්කරණයට සහ උපායශීලී හවුල්කරුවෙකු සොයාගනු පිණිස ජාත්‍යන්තර හවුලක සේවාව දැනටමත් ලබාගෙන ඇත.

#### 3.4.4 නිගමනය

හිඟ ආර්ථික සම්පත්වලින් උපරිම ඵලදායීතාවයක් ලබාගනු පිණිස එක් එක් ප්‍රවාහන මාධ්‍යයන් ප්‍රශස්ත අයුරින් භාවිතා කිරීම සහ ඒවායේ ප්‍රමුඛතාවයන් නිර්ණය කිරීම හදිසි අවශ්‍යතාවයක් වේ. මෙහි පහත දැක්වෙන ක්‍රියාමාර්ග ඇතුළත් වේ.

##### 3.4.4.1 නව ගාස්තු ව්‍යුහය

කෙටි කාලයේ දී දැනට පවතින ප්‍රවාහන ධාරිතාවය ප්‍රශස්ත අයුරින් භාවිතා කෙරෙන සැලසුම් සහිතව උචිත ව්‍යුහයක් හැඳින්වීම අත්‍යාවශ්‍ය වේ. මේ සඳහා "පොදු ප්‍රවාහන ගාස්තු කමිටුව" 1995 මාර්තු මාසයේ දී පිහිටුවනු ලැබී ය. ධාවන පිරිවැය, දැරීමේ ශක්තිය, සේවායේ ගුණාත්මක අගය යනාදිය සැලකිල්ලට ගනිමින් තාර්කික ගාස්තු ක්‍රමයක් මෙම කමිටුව මගින් දැනටමත් සකස්කර තිබේ. ඉහත සඳහන් කාරණාවලට අමතරව, මගීන්ගේ අපහසුතා අවම කරන ගාස්තු ව්‍යුහයක් ක්‍රියාත්මක කිරීමේ අපේක්ෂාවෙන් ප්‍රවාහන මාධ්‍ය දෙවර්ගයේ ම සුරක්ෂිත භාවය, සුව පහසු මට්ටම සහ ගුණාත්මක භාවය දියුණු කිරීම සඳහා දැනටමත් කටයුතු කර ඇත.

##### 3.4.4.2 ප්‍රධාන සැලැස්ම

විවිධ ප්‍රවාහන ක්‍රමයන්ගේ සංවර්ධනය සහ ව්‍යාප්තිය හැසිරවීම සඳහා ප්‍රධාන සැලැස්මක අවශ්‍යතාවය දිගු කලක සිට පවතී. ලෝක බැංකු ආධාර යටතේ ක්‍රියාත්මක වන කොළඹ නාගරික ප්‍රවාහන අධ්‍යයනය 1996 වර්ෂයේ දී අවසන් වූ පසු පැහැදිලිව නිශ්චය කරනු ලබන ප්‍රතිපත්ති සහ ආයෝජන වැඩ සටහන් සකස් කරනු ඇත. එය අවුරුදු 20 ක් ඉදිරි සැලැස්මක ආවරණය වන පරිදි සකසා ඇති අතර, එය අවුරුදු 05 ක් බැගින් වූ ක්‍රියාකාරී සැලසුම්වලින් සමන්විත වේ. එමගින් නාගරික ප්‍රවාහනයේ කාර්යක්ෂමතාවය වැඩි දියුණු කර විවිධ ප්‍රවාහන ක්‍රම ඒකාබද්ධ කොට සේවා පහසුකම් දියුණු කිරීම අපේක්ෂිත ය.

# 7 පරිච්ඡේදය

## සාමාප්තිය

රජයක් බලයට පැමිණි පලමු අවුරුද්ද තුළ කරනු ලබන සේවය සමාලෝචනයේ දී අනිවාර්යයෙන්ම මිශ්‍ර ප්‍රතිඵල වාර්තා කිරීමට සිදුවීම සාමාන්‍ය තත්ත්වයකි. අතීතයෙන් උරුම වූ යම් යම් දූෂිත තත්ත්වයන් ඉවත්කර නව ආරම්භයක් ඇති කිරීම සඳහා වැඩි ශ්‍රමයක් යෙදවීමට සිදුවීම නොවැළැක්විය හැකි ය. විනිවිද පෙනෙන අන්දමේ සහ පැහැදිලිව වගකීම් භාර ගැනීමේ පදනමක් මත රජයේ ක්‍රියා පටිපාටි නැවත සංවිධානය සහතික කිරීමටත්, කලින් පැවති තීරණ ගැනීමේ ක්‍රියාවලියේ සිදුවූ අඩුපාඩුකම් පිටුදැකිය හැකි අන්දමේ නව ආයතනික සංස්කරණ ඇති කිරීම් මේ කාලය තුළ සිදුවුවත් එයින් ලැබෙන සහපත් ප්‍රතිඵල ලබාගත හැකිවන්නේ ඉදිරි වර්ෂවල දී දීර්ඝ කාලීනවය. මෙම නව "නීතියේ ආධිපත්‍යය" අනුව ක්‍රියා කිරීමේ යහපත් ප්‍රතිඵල වැඩියෙන් ම කැපී පෙනෙන්නට වූයේ විදේශ ආයෝජන ක්ෂේත්‍රයේ දී ය. ලෝක ආයෝජන ක්ෂේත්‍රයෙහි නම්දරා සිටි වැදගත් සාමගම් කලින් ශ්‍රී ලංකාවට ඒමාට මැලිකමක් දැක්වුව ද දැන් පවතින විවෘත සහ අවංකව තීරණ ගැනීමේ හැකියාවක් ඇති වාතාවරණය තුළ මෙරටට ආපසු පැමිණීමට අලුත් උනන්දුවක් දැක්වීම මෙහිලා විශේෂයෙන් සඳහන් කළ යුතු ය.

වැඩි ආයෝජන මට්ටම තුලින් ඇති වූ වර්ධන ගම්‍යතාවය, ආර්ථිකය තුළ සම්පත් බෙදා හැරීමේ සාධක වල ගුණාත්මක තත්ත්වය උසස්වීම නිසා තවත් තීව්‍ර වීමක් අපේක්ෂා කළ හැකි ය. මේ සම්බන්ධයෙන් ඉතා ප්‍රබල සාධකයක් වන්නේ පෙබරවාරි මාසයේ ඉදිරිපත් කළ ප්‍රථම අයවැයෙන් ආරම්භ කළ තීරු බදු පද්ධතියේ තාර්කිකකරණය යි. මින් පසුව එන අයවැය යෝජනාවලින් ද මෙම ක්‍රියාවලිය ඉදිරියට ගෙනයාමක් බලාපොරොත්තු විය හැකි ය. කාණ්ඩ 4 කින් සමන්විත වූ කලින් පැවති තීරුබදු පද්ධතිය, 35% 25% සහ 10% වශයෙන් වූ කාණ්ඩ 3 ක් දක්වා ප්‍රතිසංවිධානය මින් පළමු පියවර විය. 1998 වර්ෂය වන විට රජය 15% ඒකීය තීරු ක්‍රමයක් හඳුන්වා දෙන බව ප්‍රකාශ කිරීමෙන් පෞද්ගලික කර්මාන්ත අංශයට දී ඇති සංඥාව, ඉදිරියේ දී වඩාත් නියුණු ජාත්‍යන්තර තරඟකාරිත්වයට සූදානම් විය යුතු බව ය.

මෙවැනි ආනයන තරඟ කාරිත්වයකට දේශීය කර්මාන්ත විවෘත කිරීමේ පරමාර්ථය වනුයේ ස්වදේශීය කර්මාන්ත වඩා කාර්යක්ෂම පදනමක් මත පවත්වාගෙන යාමේ අනිවාර්ය ප්‍රතිඵලය වන පාරිභෝගික භාණ්ඩ මිල තවත් අඩු මට්ටමකට ගෙන ඒම යි.

රජයේ වියදම් සම්බන්ධව සැලකීමේ දී, දැනට කෙරෙන ප්‍රාග්ධන වියදම් අති විශාල ප්‍රමාණයක් පසු ගිය වකවානුවේ දී ආරම්භ කරනු ලැබූ ව්‍යාපෘති සම්පූර්ණ කිරීම සඳහා වෙන්කළ යුතු නිසා නව ව්‍යාපෘති ආරම්භ කිරීමට ඇති ඉඩකඩ ඉතාම සීමිත වී තිබීම පෙන්වා දිය හැකි ය. ශ්‍රී ලංකාවේ දැනට ඇති තත්වය අනුව රජයේ ආදායමෙන් විශාල කොටසක් අවශ්‍යයෙන් ම පළමුව වෙන්කළ යුතු වන්නේ සමහර අනම්‍ය වියදම් කාණ්ඩ සඳහා බැවින්, අප මුහුණ දිය යුතු ප්‍රශ්නය සංකීර්ණ ස්වභාවයක් ගනී. මෙය තවත් පැහැදිලි කරන්නේ නම්, 1993 සහ 1995 අතර කාලය තුළ, රජයේ ආදායමෙන් සියයට 70 ත් 80 ත් අතර ප්‍රමාණයක් වෙන් වූයේ ගෘහ අංශයට යන සංක්‍රාම වියදම්, උතුරු නැගෙනහිර යුද්ධය සඳහා යන වියදම් සහ දේශීය ණය වෙනුවෙන් ගෙවන පොළී සඳහා ය. අනෙක් ජංගම වියදම් සඳහා මේ අනුව ඉතිරි වන්නේ ආදායමෙන් සියයට 20 ත් 30 ත් අතර ප්‍රමාණයක් ය.

රජයේ අනෙක් ජංගම වියදම් අනිවාර්යයෙන් ම මෙම ශේෂය ඉක්මවා යන නිසා, මෙම වියදම්වලට අවශ්‍ය මූල්‍ය සම්පත් රජයේ ආදායම් නොවන අංශවලින් ලබා ගැනීමට සිදුවිය. විදේශීය ප්‍රදාන, ණය සහ දේශීය ණය ගැනීම්වලින් රැස්කරන මූල්‍ය සම්පත් මේ අනුව ඉහත කී ඉතිරි වියදම්වලට අමතරව, රජයේ ප්‍රාග්ධන වියදම් සඳහා ද යෙදවිය. මෙවැනි දුෂ්කර සීමාවන් තුළ ක්‍රියාශීලී වීමේ දී රාජ්‍ය අංශයේ නව සංවර්ධන ව්‍යාපෘති සහ වැඩ සටහන් අනිවාර්යයෙන් ම විදේශාධාර මත රඳා පැවතීමේ තත්වයක් පැන නැගෙන බව පැහැදිලි ය. නව

රජයක් වශයෙන් මෙයට අමතරව කළ හැකි කර්තව්‍යය වන්නේ දැනට පවතින සංවර්ධන ව්‍යාපෘති වේගවත්ව ක්‍රියාත්මක කිරීමට යුහුසුලු වීම ය. මෙම රජය බලයට පැමිණෙන අවස්ථාව වනවිට, ශ්‍රී ලංකාව විදේශාධාර ප්‍රයෝජනයට ගැනීම අතින් ඉතාම මන්දගාමී රටක් වශයෙන් අහිතකර ප්‍රසිද්ධියක් ලබා සිටියේ ය.

ප්‍රතිපාදනය කර ඇති විදේශාධාර වාර්ෂිකව යෙදවීම් අනුපාතය සියයට 12 ක් පමණ විය. එසේ වුව ද, ප්‍රථම වසර තුළ දී පරිපාලනමය ක්‍රියාවලිය සවිමත් කිරීමෙන් මෙම යෙදවීම් අනුපාතය සැහෙන ප්‍රමාණයකින් වැඩිකර ගැනීමට රජය සමත් වී ඇත. 1995 අප්‍රේල් මාසයේ පැරිසියේ පැවැත්වුන ආධාර කණ්ඩායමේ රැස්වීමත් ඔක්තෝබර් මාසයේ වොෂිංටන් නගරයේ පැවැත්වුන ලෝක බැංකු සහ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ වාර්ෂික රැස්වීමත් අතර හය මසක කාල පරිච්ඡේදය තුළ මෙම යහපත් වර්ධනය ඇති වූ බවට ලෝක බැංකු වාර්තා සාක්ෂි දරයි.

අවසාන වශයෙන්, 1980 ගණන්වල දී ඇතිවුන අධික අයවැය පරතරය නිසා ආර්ථික අංශයේ මෙන් ම සමාජ අංශයේ ද යටිතල පහසුකම් සැපයීම සඳහා අවශ්‍ය ආයෝජන බෙහෙවින් සීමාසහිත වූ බව සඳහන් කළ හැකි ය. මේ තත්ත්වය තුළ, සමාජ සංවර්ධන අංශයෙන් ශ්‍රී ලංකාව ලබා තිබූ ප්‍රෞඪ වාර්තා වුව ද තර්ජනයට ලක්වන තරමට, අධ්‍යාපන සහ සෞඛ්‍ය සේවාවල ගුණාත්මක තත්වය පිරිහෙන්නට පටන්ගෙන තිබුන බව පැහැදිළි ය.

වාරිමාර්ග හැර ඉතිරි මූලික යටිතල පහසුකම් : එනම් විදුලි සංදේශ, මහාමාර්ග සහ වරාය සම්බන්ධ ව්‍යාපෘති වෙනුවෙන් යෙදවෙන සම්පත් ප්‍රමාණය සලකා බැලීමේ දී ශ්‍රී ලංකාව නැගෙනහිර ආසියානු ප්‍රතිමානයට බෙහෙවින් අඩු මට්ටමක සිටින බව සඳහන් කළ යුතු වේ. පෞද්ගලික අංශයේ වර්ධනයට තීරණාත්මකව බලපෑ හැකි කුසලතා සහ යටිතල පහසුකම් වඩාත්ම අදාළ වන්නේ මෙම අංශවලට ය. අප දැනට ම දන්නා පරිදි, 1995 වර්ෂයේ දී ඉහත කී අංශවලට මෙන් ම සමාජ සංවර්ධන අංශවලට ද අයවැයෙන් දෙනු ලබන ප්‍රතිපාදන වැඩි කිරීමට යහපත් ආරම්භයක් ඇති කර තිබේ. ඉදිරියේ දී වර්ෂ 2000 දක්වා අනුගමනය කිරීමට අපේක්ෂිත අයවැය උපාය මාර්ගය සකස් කර ඇත්තේ මෙම අංශ සඳහා ප්‍රමාණවත් සම්පත් මුදාහැරීමත් සමගම යටිතල පහසුකම් පරිමාණය වැඩිකරලීමට පෞද්ගලික අංශයේ වැඩි සහභාගිත්වයක් ද බලාපොරොත්තු වෙමිනි.

ජනාධිපති ලේකම් කාර්යාලය
26 AUG 2023
පුස්තකාලය

ජනාධිපති කාර්යාලය
පුස්තකාලය